# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,901 — 1970 අප්‍රේල් 10 වැනි සිකුරාද — 1970.4.10

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 493 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 524 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 508 | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 509 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 524 | විවිධ දැන්වීම ... — — ... | 526 |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අනතකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත් වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථා

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

(ඊ) රාජකීය බ්‍රිතාන්‍ය නිර්මාණ ශිල්පී ආයතනයේ හෝ රාජකීය ඕස්ට්‍රේලියානු නිර්මාණ ශිල්පී ආයතනයේ මධ්‍ය විභාග යෙන් හෝ එම විභාගයෙන් නිදහස් කිරීමට ප්‍රමාණවත් යැයි එම ආයතන විසින් සලකන වෙනත් විභාගයකින් හෝ සමත් වී සිටීම,

තෝරාගනු ලබන නිලධාරියා නියම කරන ලද කාල පරිච්ඡේදයක් ඇතුළත සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් එනම්, බ්‍රිතාන්‍ය නිර්මාණ ශිල්පී රාජකීය ආයතනයේ හෝ රාජකීය ඕස්ට්‍රේලියානු නිර්මා ශිල්පී ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා ගත යුතුය.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතු ය.

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාර ගනු නොලැබේ).

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැන ගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් හෝ විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස් ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නො හැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින් ම ලියා එවිය යුතු ය. ඉල්ලුම්පත්‍ර ෆෝර්ම සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල්පත මේ සඳහා භාවිත කළ හැකි ය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතු ය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම්පත්‍ර ෆෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතු ය. එවිට ඉල්ලුම්පත්‍ර ෆෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම්පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතු ය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 අප්‍රේල් මස 3 වැනි දින,
කොළඹ 1,
තැ. පෙ. 500,
ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

4–369/1—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ. ඒ. 6/එක්ස්. 2227/70.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### යාන්ත්‍රික/විදුලි ඉංජිනේරු තනතුර

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ යාන්ත්‍රික/විදුලි ඉංජිනේරු තනතුරක් සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන් හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර, කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1970 අප්‍රේල් මස 30 වැනි දින.
(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1970 මැයි මස 6 වැනි දින.

**සටහන :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූද, තම ලිපිනය ලියන ලද්දාවූ ද, මුද්දර නොගැසුවාවූ ද, ලියුම් කවරයක් එවිය යුතුයි.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයත් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම් කරුවන් විසින්ම විඳදරාගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී භාරදීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) වෛද්‍ය පරීක්ෂණය සඳහා නැව් ගාස්තු : ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනීසිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :—

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පළමුකොට පත්වීම් දෙනු ලබන්නේ තුන් අවුරුදු ආධුනික සමයක් මතය.

(ii) පත්වීම් සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයාට දෙපාර්තමේන්තුවේදී පුහුණුවක් ලබන ලෙස නියම කරනු ඇත.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේ ය : වර්ෂයකට රුපියල් 9,600 ට සහ රුපියල් 13,920 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිතව වර්ෂයකට රුපියල් 7,800—360/3—8,880/9,600—360/4—480/11 රුපියල් 16,320.

**සටහන :**

(i) තෝරා ගනු ලබන අයදුම්කරු සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් වන ලංඩන් විදුලි ඉංජිනේරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය හෝ ලන්ඩන් යාන්ත්‍රික ඉංජිනේරුවන්ගේ ආයතනයේ සාමාජිකත්වය හෝ ඊට සමාන පිළිගත් සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් ලදහොත් මිස නැතිනම් වසරකට රු. 13,440 ක් වූ වැටුප් පියවර ඉක්මවා යාමට හිමිකරුවෙකු නොවේ.

(ii) සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් සහිත අපේක්ෂකයෙක් රු. 9,960 ක ආරම්භක මූලික වැටුපක් ලැබීමට සුදුසු වෙයි.

(iii) වර්ෂයකට රුපියල් 9,600 ක වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉම ජයගැනීම සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින් දෙපාර්තමේන්තු ක්‍රියා පටිපාටි ගිණුම් සහ දෙමළ (වාචික) යනාදී විෂයයන්ගෙන් නියමිත පරීක්ෂණයකින් සමත් විය යුතුය. සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් ඇතිව සේවයට ඇතුල්වන අපේක්ෂකයකු පත්වීම ලබා අවුරුදු දෙකක් ඇතුළත එවැනි පරීක්ෂණයකින් සමත් විය යුතුය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(i) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශරීර සනීපයෙන් යුක්ත බව.

(ii) 1970 අප්‍රේල් මස 30 වන දිනට වයසින් අවුරුදු 35 ට නො වැඩි බවට, (රජයේ සේවකයින් සඳහා වයස් සීමාව අදාළ නොවේ).

(iii) (අ) ලන්ඩන්හි විදුලි ඉංජිනේරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය හෝ ලන්ඩන් යාන්ත්‍රික ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ සාමාජිකත්වය

නැතහොත්

(ආ) ලංකා විශ්ව විද්‍යාලයේ (යාන්ත්‍රික හෝ විදුලි) ඉංජිනේරු උපාධියක් හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක සමාන උපාධියක්

නැතහොත්

(ඇ) ලන්ඩන්හි විදුලි ඉංජිනේරුවන්ගේ ආයතනය හෝ ලංකා ඉංජිනේරු ආයතනය මගින් විදුලි ඉංජිනේරුවන් සඳහා පවත්වනු ලබන විභාගයේ I වැනි II වැනි සහ III වැනි කොටස් හෝ සමාන සුදුසුකමක්

නැතහොත්

(ඈ) ලන්ඩන්හි යාන්ත්‍රික ඉංජිනේරුවන්ගේ ආයතනයේ උපාධිධාරී සාමාජිකත්වය හෝ ලංකා ඉංජිනේරු ආයතනයේ යාන්ත්‍රික ඉංජිනේරුවන් සඳහා වූ උපාධිධාරී සාමාජිකත්වය හෝ සමාන සුදුසුකමක් ලැබූ බව.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.

(ඒ) උප්පැන්න සහතිකය.—(සැ. යු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගේ හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු. :

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ ඇමිණිය යුතු නැත.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එවීමේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නාවූද, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 අප්‍රේල් මස 3 වන දා,
කොළඹ 1, ගාලු මුවදොර, මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ. පෙ. 500,

4–369/2—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී. 31/එක්ස්. 2228/70.

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ අර්ථ ශාස්ත්‍රය පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුර

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලංකා කාර්මික විද්‍යාලයේ අර්ථ ශාස්ත්‍රය පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර: 1970 අප්‍රේල් මස 30 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර: 1970 මැයි මස 6 වැනිදා.

සටහන් :

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමාණයට කුඩා නොවූ ද, තම ලිපිනය ලියන ලද්දා වූ ද, මුද්දර නො ඇලවූ ද ලියුම් කවරයක් එවිය යුතුයි.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එව්නු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නතම හෝ රටවල් පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුලතදී භාර දීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිලිවන.

(iv) වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු: ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැන ගනු පිණිස, පිලිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලබන අයදුම්කරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ඔහුගේ පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට භාජනය කරනු ලැබේ.

3. **වැටුප් සහ දීමනා :**

මෙම තනතුරට හිමි ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය.
රු. 6,720—12 × 360—11,040

සටහන් :

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක I වැනි හෝ II වැනි පෙළ ගෞරව ඉංජිනේරු උපාධිධරයින් හෝ එම්. එස්. සී. (ආර්ථික) හෝ ඇම්. ඒ. (ආර්ථික) හෝ ඇම්. කොම්. වැනි පශ්චාත් උපාධි ලබා ඇත්තාවූ අය රු. 7,800 ක වාර්ෂික ආරම්භක වැටුපක් ලැබීමට හිමිකම් ලබති.

(ii) විශ්ව විද්‍යාලයක හෝ සම මට්ටමක 3 අවුරුදු ඉගැන්වීමේ පළපුරුද්ද හා උපාධියක් ඇති ආධුනිකයින් භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව වර්ෂයකට රු. 7,800 වැටුප් තලයේ තැබීමට ඉඩ ඇත. රජයේ සේවයේ දැනටමත් නියුතුවූවකු තෝරා ගනු ලැබුවහොත් 1959. 6. 13 දින දරණ අංක 492 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයෙන් සංශෝධනය කරන ලද 1957. 2. 26 දින දරණ අංක 361 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ කොන්දේසි අනුව ඔහුගේ වැටුප තීරණය කෙරෙනවා ඇත.

4. අවශ්‍ය සුදුසුකම් :

සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1970. 4. 30 වැනිදා තමන්ගේ වයස අවුරුදු 21 ට නො අඩු හා අවුරුදු 45 ට නො වැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(සී) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක අර්ථ ශාස්ත්‍රය පිළිබඳ විශේෂ උපාධියක්.

සටහන : අර්ථ ශාස්ත්‍රය හෝ බැංකු ක්‍රම හෝ ජාත්‍යන්තර අර්ථ ශාස්ත්‍රය යන විශේෂ විෂයයන්ගෙන් සමත් වූවනට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

සහ

(ii) සිංහලෙන් ඉගැන්වීමට හැකියාව තිබීම හෝ සිංහල ප්‍රවීණතාවය පත්වීමේ දින සිට අවුරුදු තුනක් ඇතුළත දී ලබා ගැනීම.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත ආසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය,

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස් ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින්ම තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කල යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර යෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද (" බී " සලකුණ දරන) මුද්‍රිත තැපැල්පත මේ සමග භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද (" ඒ " සලකුන දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිලිපැදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 අප්‍රේල් මස 3 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ. පෙ. 500.

4–369/3—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී. 40/එක්ස්. 2229/70.

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

### I වැනි ශ්‍රේණියේ වාණිජ විද්‍යා කථිකාචාර්ය තනතුර හෝ එම තනතුරට පුහුණු වන්නකු තෝරා ගැනීම

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලංකා කාර්මික විද්‍යාලයේ වාණිජ විද්‍යා පිළිබඳ I වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුර හෝ එම තනතුරට පුහුණු වන්නකු ලෙස පත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර, කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම්පත්‍ර : 1970 අප්‍රේල් මස 30 වැනි දා.

(බී) විදේශීය ඉල්ලුම්පත්‍ර : 1970 මැයි මස 6 වැනි දා.

සටහන :

(i) මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නො වූද, තම ලිපිනය ලියන ලද්දාවූද, මුද්දර නොගැසුවාවූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි අලාභහානි අයදුම් කරුවන් විසින්ම විඳ දරා ගත යුතු ය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකි ය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී භාර දීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.—ලංකාණ්ඩුම යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍ය වරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තු ඔවුන් විසින් ම ගෙවිය යුතු වෙයි.

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.—මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලබන අයදුම්කරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ඔහුගේ පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට භාජනය කරනු ලැබේ.

3. වැටුප් සහ දීමනා.—මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේ ය—

වාර්ෂිකව, රු. 11,520—10×480 රු. 16,320 (රු. 14,880 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක්)

සැ. යු.—ඉහත සඳහන් 5 වැනි ඡේදය යටතේ පුහුණුවන්නෙකු තෝරාගතහොත් ඔහුට ගෙවියයුතු වැටුප හෝ දීමනා භාණ්ඩාගාරයේ උපදෙස් අනුව තීරණය කරණු ඇත.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) 1970. 4. 30 වැනිදා තමන්ගේ වයස අවුරුදු 30 ට නො අඩු හා අවුරුදු 45 ට නො වැඩි විය යුතු ය. (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට මෙම වයස් සීමාව අදාල නොවේ.)

(ඉ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජ විද්‍යාව හෝ අර්ථ ශාස්ත්‍රය හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ I වැනි හෝ II වැනි පෙළ ගෞරව උපාධිය සහ

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයක එම්. කොම්. හෝ එම්. ඇස්. සී. (අර්ථ ශාස්ත්‍රය) හෝ එම්. ඒ. (අර්ථ ශාස්ත්‍රය) හෝ ඊට සමාන හෝ උසස් සුදුසුකම් සහ

(iii) ගුරු අභ්‍යාස විද්‍යාලයක හෝ ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයක හෝ ලංකා කාර්මික විද්‍යායතනය වැනි පිළිගත් උසස් තත්ත්වයේ ආයතනයක හෝ ඊට සමාන හෝ උසස් පිළිගත් ආයතනයක අවුරුදු 5 ක ඉගැන්වීම් හා/හෝ ප්‍රායෝගික පළපුරුද්ද

සහ

(ඊ) සිංහලෙන් ඉගැන්වීමට පුළුවන්වීම හෝ පත්වීමේ දින සිට අවුරුදු 3 ක කාලයක් ඇතුළතදී සිංහල භාෂාවේ ප්‍රවීණත්වයක් ලබා ගැනීම.

5. (i) **පුහුණු සඳහා පිරිනැමෙන ශිෂ්‍යත්ව පිළිබඳ කොන්දේසි.**— 4 වැනි ඡේදයේ සඳහන් සුදුසුකම් ඇති කිසිවෙකුගෙන් ඉල්ලුම්පත්‍ර නොලැබුණහොත් හෝ තනතුර සඳහා සුදුසු අයම්කරුවෙකු නොසිටිය හොත් පුහුණු වන්නකු පත් කර ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයගේ ඉල්ලුම්පත්‍ර සැලකිල්ලට භාජනය කරනු ලැබේ:—

(අ) වයස් සීමාවන්............දිනට වයස අවුරුදු 28 ට නො අඩු අවුරුදු 40 ට නො වැඩි විය යුතු ය. (මෙම වයස් සීමාවන් සියලුම අයදුම්කරුවන්ට එකසේ බලපායි.)

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජ විද්‍යා හෝ අර්ථ ශාස්ත්‍රය හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ I වැනි හෝ II වැනි පෙළ ගෞරවිය උපාධිය

(ඉ) ගුරු අභ්‍යාස විද්‍යාලයක හෝ ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයක හෝ ලංකා කාර්මික විද්‍යායතනය වැනි පිළිගත් උසස් තත්ත්වයේ ආයතනයක හෝ ඊට සමාන හෝ උසස් පිළිගත් ආයතනයක අවුරුදු 5 ක ඉගැන්වීමේ හා/හෝ ප්‍රායෝගික පළපුරුද්ද

(ඊ) විශිෂ්ඨ චරිතයක් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවත් ය

(ii) තෝරාගනු ලබන අපේක්ෂකයාට පිටරට ගොස් පුහුණුවක් ලබන ලෙස නියම කරන්නට ඉඩ තිබේ. එසේ පුහුණුවන කාලය තුළ සුදුසු අන්දමේ දීමනාවක් ඔහුට ගෙවනු ලැබේ.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයා පිටරට ගොස් පුහුණුවක් ලැබිය යුතු යයි නියම කළහොත් ඔහු ලංකාණ්ඩුව සමග ගිවිසුමකට බැඳිය යුතු වන්නේ ය. එම ගිවිසුම යටතේ පොරොන්දු විය යුතු වෙනත් දේවල් අතර ඔහු පහත සඳහන් පොරොන්දුවලට ද බැඳිය යුතු වේ. එනම්:—

(අ) නියමිත අභ්‍යාස පාඨමාලාව අවංක ලෙස සහ උත්සාහවත් ව හදාරා සතුටුදායක අන්දමින් නිම කිරීමට සහ එසේ නිම කිරීමෙන් පසු නියමිත කාල පරිච්ඡේදයක් තුළ ලංකාණ්ඩුවේ සේවය කළ යුතු යයි කියා සිටියහොත් (කාල පරිච්ඡේදය නියම කිරීම ලංකාණ්ඩුව විසින් කෙරෙනු ඇත.) එසේ සේවය කිරීමට ද,

(ආ) ගිවිසුමේ රෙගුලාසි සහ කොන්දේසි පිළිපැදීමට තමා අපොහොසත් වුවහොත් ලංකාණ්ඩුව විසින් සහ/හෝ ශිෂ්‍යත්ව ප්‍රදාන ඒජන්සිය විසින් පුහුණු කිරීමේ මූළු කාර්යය වෙනුවෙන් කරන්නට යෙදුන සියලුම වියහියදම් (එනම්, වැටුප් දීමනා, යාත්‍රා ගාස්තු සහ වෙනත් ගාස්තු ආදිය) ලංකාණ්ඩුවට ආපසු ගෙවීමට ද සිදුවෙයි.

(iv) තෝරා ගනු ලබන අපේක්ෂකයා පිළිගත් විශ්ව විද්‍යාලයක එම්. කොම්. හෝ එම්. ඇස්. සී. (අර්ථ ශාස්ත්‍රය) හෝ එම්. ඒ. (අර්ථ ශාස්ත්‍රය) හෝ ඊට සමාන හෝ සුදුසුකම් ලබාගත යුතුය.

6. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය:—

(අ) උප්පැන්න සහතිකය. සැ. යු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය

(ඉ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයා ගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය

(ඊ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික

(උ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නො හැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

7. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින්ම තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර ෆෝරමය සමඟ තමන්ට එවන ලද ("බී" සලකුණ දරණ) මුද්‍රිත තැපැල්පත මේ සමඟ භාවිතා කළ හැකිය.

8. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නාමට පුද්ගලිකව නො එවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ II ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍යසේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

10. අයදුකරුවන් විසින්, ඉල්ලුම්පත්‍ර ෆෝරමය සමඟ තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල්පත එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර ෆෝරමය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින් නමුදු ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත නම් ඉල්ලුම්පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

සී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 අප්‍රේල් මස 3 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ. පෙ. 500.

4–369/4—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

අංකය : වීආ/3/184

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### පැට්‍රිස් ලුමුම්බා මිත්‍රත්ව විශ්ව විද්‍යාලය විසින් පිරිනමන ශිෂ්‍යත්ව 1970-71

පහත සඳහන් විෂයයන්හි පූර්ව උපාධි අධ්‍යාපනය සඳහා මොස්කව්හි පැට්‍රිස් ලුමුම්බා මිත්‍රත්ව විශ්ව විද්‍යාලය විසින් පිරිනමන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

"ඒ" වර්ගය :—

(1) යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය.
(2) බල යන්ත්‍ර නිර්මාණය.
(3) සිවිල් ඉංජිනේරු ශිල්පය.
(4) භූ ගර්භ විද්‍යාව.
(5) ගණිතය.
(6) භෞතික විද්‍යාව.

"බී" වර්ගය :—

(1) කෘෂිකාර්මික විද්‍යාව.

"සී" වර්ගය :—

(1) ඉතිහාසය.
(2) ආර්ථික විද්‍යාව හා සැලසුම් කිරීම.
(3) රුසියන් භාෂාව හා සාහිත්‍යය.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මහා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂ්‍යය 1 :** පහත සඳහන් අයගෙන් අයදුම්පත් භාරගනු නොලැබේ.

(අ) ස්ථිර තනතුරු දරන හා තනතුරුවල ස්ථිර කරනු ලැබ සිටින රජයේ සේවකයින්.

(ආ) මණ්ඩල, සංස්ථා, විශ්ව විද්‍යාල සහ වෙනත් එවැනි රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන ආයතනවල ස්ථිර තනතුරු දරන හා තනතුරුවල ස්ථිර කරනු ලැබ සිටින නිලධාරීන්.

(ඉ) ලංකාවේ හෝ විදේශීය විශ්ව විද්‍යාලයක දැනටමත් කිසියම් පාඨමාලාවක් අනුගමනය කරන ශිෂ්‍යයින්.

**සංලක්ෂ්‍යය 2 :** එක් අයදුම් කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. අයදුම් කළ යුත්තේද එක් පාඨමාලාවක් සඳහා පමණය.

2. **ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් අවුරුදු 5-6 පමණ වන්නේ ය. එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නො පැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාග වලින්

සමත් විය නොහැකි වීම නිසා හෝ ලුමුම්බා විශ්ව විද්‍යාල බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

**3. සුදුසුකම්.**—අයදුම් කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ii) 1970.9.1 වැනි දිනට, වයස අවුරුදු 22 ට අඩු විය යුතුයි.

(iii) උසස් ඉංග්‍රීසි දැනුමක් තිබිය යුතුය.

(iv) රුසියන් භාෂාව ඉගෙනීමට කැමැති විය යුතුයි.

(v) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී එකම වතාවකදී විෂයයන් හයකින් සමත්වී සිටිය යුතු අතර, එයින් යටත් පිරිසෙයින් විෂයයන් 5 ක් සඳහාවත් සම්මාන තිබිය යුතුය. තවද ඉගෙනීමට අදහස් කරන පාඨමාලාව අනුව, පහත සඳහන් විෂයයන්ද එම සම්මාන 5 ට ඇතුළත් විය යුතුය.

(අ) **අයදුම් කරන්නේ "ඒ" වර්ගය යටතේ විෂයයන් සඳහා නම්.**—ගණිතය, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයන් ඉහත කී පරිදි එකවර ලැබූ සම්මාන 5 ඇතුළත විය යුතුය.

(ආ) **අයදුම්කරන්නේ "බී" වර්ගය සඳහා නම්.**—භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ උද්භිද විද්‍යාව හෝ ජීව විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයන් ඉහත කී පරිදි එකවර ලැබූ සම්මාන 5 ඇතුළත විය යුතුයි.

(ඉ) **අයදුම් කරන්නේ "සී" වර්ගය යටතේ විෂයයන් සඳහා නම්.**—ඉතිහාසය, ප්‍රජාචාරය හා ඉංග්‍රීසි සඳහා සම්මාන සාමාර්ථයන් ඉහතකී පරිදි එකවර ලැබූ සම්මාන 5 ඇතුළත විය යුතුයි.

**සංලක්‍ෂ්‍යය 1 :** ඉහත අනු ඡේදයන්හි "ගණිතය" යනුවෙන් අදහස් කරන්නේ ශුද්ධ ගණිතය, උසස් ගණිතය හෝ ව්‍යවහාරක ගණිතය යන අතරින් එකක් මිස, මූලික ගණිතය නොවේ.

**සංලක්‍ෂ්‍යය 2 :** ප්‍රතිඵල අපේක්ෂාවෙන් අයදුම්පත් භාරගනු නොලැබේ. (ලිඛිත ප්‍රශ්න පත්‍රයක් හා ප්‍රායෝගික පරීක්ෂණයක් යන කොටස් දෙකක් අදාල විෂයයන්, සම්බන්ධයෙන් කොටස් දෙකේම ප්‍රතිඵල අයදුම් කරන අවස්ථාවේ නිකුත්ව තිබිය යුතුය. ලිඛිත විභාගයෙන් සමත්ව ප්‍රායෝගික පරීක්‍ෂණය සඳහා කැඳවනු ලැබූ අපේක්‍ෂකයෙකු අයදුම් කිරීමට සුදුසු වන්නේ ප්‍රායෝගික විභාගයේ ප්‍රතිඵල ද අයදුම් කරන අවස්ථාවේ නිකුත් කර තිබුනි නම් පමණය.)

**සංලක්‍ෂ්‍යය 3 :** ඉහත 3(V) ඡේදයේ අනු ඡේදයන් යටතේ නියමිත සුදුසුකම් අනිවාර්ය ඒවාය. උසස් සුදුසුකම් හෝ සමාන සුදුසුකම් ඇති අය වුවද ඉහත සුදුසුකම් අවශ්‍යයෙන්ම ලබා සිටිය යුතුය.

**සංලක්‍ෂ්‍යය 4 :** රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1970.9.1 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්‍ෂ්‍යය 5 :** එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන්ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම් පතේ 15(ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

**4. ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන් :** ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) රුසියාවට යාම සහ පාඨමාලාව සාර්ථක ලෙස නිමවීමෙන් පසු ආපසු පැමිණීම සඳහා ගමන් පහසුකම්.

(ආ) නොමිලයේ ඉගැන්වීම.

(ඉ) ශිෂ්‍යත්ව දීමනාවක්.

(ඊ) නේවාසිකාගාර පහසුකම්.

(උ) නොමිලයේ වෛද්‍ය ප්‍රතිකාර.

**5. සම්මුඛ පරීක්ෂණය.**—සුදුසුකම් ලත් අයදුම් කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතුය.

**6. ගිවිසුම.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් රුසියාව බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාල සීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතුය.

**7. වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් රුසියාවේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත්කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මඟින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

8. ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු ශිෂ්‍යත්වධාරීන්ට රක්ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපේක්ෂකයෙකු තෝරාගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාම යෝජනා කිරීමෙන් පසු ප්‍රදානයන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡෙදයක් ගතවන ,තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපෙක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාම යෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයන් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතුය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයින්.

12. යම් අපෙක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබා ගැනීමට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන්ම එම අපෙක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙල කළ යුතු අයදුම් පත්, 1970.4.23 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, ස්ථිර ලේකම් වෙත එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාර ගනු නොලැබේ. අයදුම්පත් ආකෘති ඉල්ලා එවන විට තමාගේ ලිපිනය ලියූ (මුද්දර නොගැසූ) ලොකු ප්‍රමාණයේ ලියුම් කවරයක්ද එවිය යුතුය. එම කවරයේ උඩ වම් කොනේ "ලුමුම්බා විශ්ව විද්‍යාලයීය ශිෂ්‍යත්ව ආකෘති පත්‍ර" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවයේ යෙදී සිටින තාවකාලික හා ස්ථිර කරනු නොලැබූ නිලධාරීන් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින්ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල එවැනි නිලධාරීන් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මඟින්ද එවිය යුතුයි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය.

**17.** සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුලත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම් කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 අප්‍රියෙල් මස 3 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

**4–403—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය**

## අයි.ඇම්.ඇම්.ටී.ඇස්. "ඩ්ෆරින්" නෞකාවේ ආධුනිකත්වය සඳහා ඇබෑර්තු

බොම්බායේ ඇති "ඩ්ෆරින්" නමැති ඉන්දීය වෙළඳ නැවියන් පුහුණු කිරීමේ නෞකාවෙහි 1970 අගෝස්තු මස ඇරඹෙන දෑවුරුදු පුහුණුවීමේ පාඨමාලාව සඳහා විධායක ආධුනිකත්ව තුනකට පුරප්පාඩු ඇත.

2. **අවශ්‍ය සුදුසුකම්.—**

(i) ඉල්ලුම්කරුවන් ලාංකිකයන් විය යුතුයි.

(ii) 1970 ජූලි මස 1 වැනි දිනට ඔවුන් වයසින් අවුරුදු 15½ ටත් 18 ටත් අතර විය යුතු ය.

(iii) එක් වාරයකදී හෝ ඊට වැඩි වාර ගණනකදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය විභාගයට පෙනී සිට නිර්දේශ පත්‍රයේ "ඒ" හෝ "බී" අනුව ඉංග්‍රීසි භාෂාවෙන් හා ගණිත ශාස්ත්‍රයෙන් (Mathematics) සහ තවත් විෂයයන් 4 කින් සමර්ථ වී සිටිය යුතු ය.

3. සුදුසුකම් ඇති අපේක්ෂකයින් "ඩ්ෆරින්" විස්තර පත්‍රිකාවෙහි ඇති නිර්දේශ පත්‍රිකාව අනුව පහත සඳහන් විෂයයන් සම්බන්ධයෙන් කොළඹ දී පැවැත්වෙන ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු යි :—

ඉංග්‍රීසි භාෂාව,
ගණිත ශාස්ත්‍රය,
භූගෝල විද්‍යාව,
මූලික විද්‍යාව හා
සාමාන්‍ය දැනීම.

භූගෝල ශාස්ත්‍රය සම්බන්ධයෙන්, ඉන්දියානු හා පකිස්තානු භූගෝල ශාස්ත්‍රය වෙනුවට ලංකා භූගෝල ශාස්ත්‍රය යොදවනු ලැබේ. පරීක්ෂණය ඉංග්‍රීසි බසින් පැවැත්වෙන අතර, ඉංග්‍රීසි, ගණිත ශාස්ත්‍රය (අංක ගණිතය, වීජ ගණිතය, ජ්‍යාමිති ගණිතය හා ත්‍රිකෝණමිතිය ඇතුළුව) සහ භූගෝල ශාස්ත්‍රය පිළිබඳ වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ. මේ එකිනෙක විෂයය සම්බන්ධයෙන් සාමාර්ථය සඳහා ඉල්ලුම් කරුවන් විසින් සියයට 35 ට නොඅඩු ලකුණු ලැබිය යුතු වේ. පරීක්ෂණය පැවැත්වෙන දිනය හා ස්ථානය පිළිබඳව අපේක්ෂක සින්ට යථා කාලයේදී දැනුම් දෙනු ලැබේ.

4. තැපැල් ගාස්තු හැර පිටපතක් රුපියල් 2.00 ගණනේ වරාය කොමිෂන් සභා කාර්යාලයෙහි විකිණීමට ඇති කායාර් විස්තර පත්‍රිකාවෙහි මෙම පුහුණුවීමේ පාඨමාලාව පිළිබඳව සියලුම විස්තර දැක්වේ.

5. එකී පාඨමාලාව සඳහා ගාස්තුත්, නිල ඇඳුම්, පොත්, ගමන් ගාස්තු සහ වෙනත් යුක්ති සහගත වියදම් ආණ්ඩුව විසින් දරනු ලැබේ. අනිකුත් සියළු වියදම් ආධුනිකයාගේ දෙමව්පියන් විසින් හෝ ඔහුගේ භාරකරු විසින් දැරිය යුතු ය.

6. ප්‍රවාහන අමාත්‍යාංශය මඟින් නිකුත් කරනු ලබන විදේශ සංචාර යාත්‍රා හෙවත් (Master Mariner's Foreign Going) නම් සහතිකය තෝරා ගනු ලබන අපේක්ෂකයා විසින් ලබා, අවුරුදු පහක් ඉකුත්වීමට පෙර ලංකා රජය යටතේ අවුරුදු 5 ක් සේවය කිරීමට ඔහුට නියම කරනු ලැබුවොත් වෙනත් දේ අතර එසේ කිරීමට බැඳෙමින් ඇපකරුවන් දෙදෙනෙකු ඇතිව ඔහු ගිවිසුමකට හා බැඳුම් කරයකට ද ඇතුළත් විය යුතුය. එකී නියමය පිළිපැදීමට යම් පුහුණු වන්නෙක් අපොහොසත් වුවහොත් ඔහු හෝ එසේ නැතහොත් ඔහුගේ ඇපකරුවනුත් පුහුණුව සඳහා රජයෙන් වියදම් කරනු ලැබූ සම්පූර්ණ මුදල ආපසු ගෙවිය යුතුයි.

7. පාඨමාලාව සම්පූර්ණ කළ ආධුනිකයෙකුට රැකී රක්ෂා සපයා දීමට ඉන්දීය රජය හෝ ලංකා රජය ඇප වන්නේ නැත. නමුත් ඔහු දුම් නැව් සමාගමකට බැඳවීම සඳහා සෑම උත්සාහයක්ම දරනු ලැබේ.

8. ලිඛිත පරීක්ෂණයෙන් සමර්ථ වූ අපේක්ෂකයන් තේරීම් මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටීමට කොළඹට කැඳවනු ලැබේ. තෝරා ගනු ලබන අපේක්ෂකයන්ට බොම්බායේදී පවත්වනු ලබන අක්ෂි පරීක්ෂණයකට හා වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට ඉන්දීය රජය විසින් නියම කරනු ලැබේ. එහි ගියවිට අපේක්ෂකයන් ප්‍රතික්ෂේප කිරීමේ අවදානම අඩුකර ගැනීම සඳහා ඔවුහු දිවයිනෙන් බැහැර යාමට පෙර එවැනිම වෛද්‍ය පරීක්ෂණයකට භාජනය වීමට ලංකා රජය විසින් නියම කරනු ලැබේ. එකී පරීක්ෂණය සඳහා රු. 31.50 ක් අය කරනු ඇත. එකී පරීක්ෂණය තාවකාලික එකක් වන අතර, ඉන්දීය රජය එය හේතුකොටගෙන කිසිම බැඳීමකට ඇතුළත් නොවන බව වටහා ගත යුතු ය.

9. ඉල්ලුම් පත්‍ර මෙම කාර්යාලයෙන් ලබාගත හැකි පෝරම් කොළවල විය යුතුය. රුපියල් 10 ක වටිනාකම ඇති මුද්දර එහි අලවා ඉල්ලුම්කරුගේ අත්සනින් ඒවා අවලංගු කළ යුතු ය. කිසිම කාරණයක් නිසා හෝ පරීක්ෂණ ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. පහත සඳහන් ලියවිලි ඉල්ලුම් පත්‍රයත් සමග එවිය යුතුය :—

(අ) ඉල්ලුම්කරුගේ උප්පැන්න සහතිකයේ පිටපතක් ;

(ආ) ඉල්ලුම්කරුගේ යහපත් චරිතය පිළිබඳ ඔහුගේ නෑදෑයින් නොවන වැදගත් පුද්ගලයින් දෙදෙනෙකුගෙන් ලබාගත් සහතිකවල පිටපත් ;

(ඇ) රජයේ වෛද්‍ය නිලධාරියෙකුගෙන් ලබාගත් ඇස් පෙනීම පිළිබඳ සහතිකයක් හා වෛද්‍ය සහතිකයක් ;

(ඈ) අධ්‍යයන පොදු (සාමාන්‍ය) සහතික පත්‍රයේ පිටපතක්.

10. ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1970 මැයි 10 වැනි දින වේ. එදිනට පසු ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත.

සියලුම ඉල්ලුම්පත්‍ර භාරගත් බවට පිළිතුරු සපයනු ලැබේ.

K. C. Nythiananthan,
ජනසතු සේවා අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

ජනසතු සේවා අමාත්‍යාංශය,
තැ. පෙ. නො. 500,
මහ ලේකම් ගොඩනැගිල්ල,
කොළඹ 1, 1970. 4. 1.

### අයි.ඇම්.ඇම්.ටී.ඇස්. "ඩ්ෆරින්" නෞකාවේ ආධුනිකත්වය

### ඉල්ලුම් පත්‍රය

**මෙම පෝරමය සම්පූර්ණ කර 1970 මැයි 10 දින පස්වරු 4.30 ට පෙර කොළඹ මහ ලේකම් කාර්යාලයේ පිහිටි තැ. පෙ. නො. 500 දරණ ජනසතු සේවා අමාත්‍යාංශය වෙත ලැබිය යුතුයි.**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
(පෙළපත් නම පළමුවෙන් ලිවිය යුතුයි)
2. ස්ථිර ලිපිනය :————.
3. උපන් දිනය :————.
4. 1970 ජූලි මස 1 වෙනි දිනට වයස :— අවුරුදු :———, මාස :———, දවස් :———.
5. රටවැසිභාවය හා එය ලැබුණු අන්දම :————.
(ඉල්ලුම් කළ හැක්කේ ලාංකිකයින්ට පමණයි)
6. උපන් ස්ථානය :—
(අ) ඉල්ලුම්කරු :————,
(ආ) ඉල්ලුම්කරුගේ පියා :————,
(ඇ) ඉල්ලුම්කරුගේ පිය පක්ෂයේ ආතා :————,
(ඈ) ඉල්ලුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :————.
අපේක්ෂකයා සහ ඔහුගේ පියාත් ලංකාවේ උත්පත්තිය ලැබුවා නම් (අ) සහ (ආ) පමණක් පිරවිය යුතුයි. ඉල්ලුම්කරු හෝ ඔහුගේ පියා හෝ ලංකාවෙන් පිටදී උත්පත්තිය ලැබුවා නම් (අ), (ආ), (ඇ) සහ (ඈ) පිරවිය යුතුයි.
7. ආගම :————.
8. ඉල්ලුම්කරු දැනට ඉගෙනීම ලබන පාසැලේ නම සහ ඉගෙන ගන්නා ප්‍රමාණය :————.
9. ඇතුලත්වීමට සුදුසුකම වශයෙන් දක්වා ඇති විභාගය, එය පැවැත්වූ දිනය සහ එයට ගත් විෂයයන් පිළිබඳ විස්තරය :————.
10. පියාගේ සම්පූර්ණ නම, රක්ෂාව සහ ලිපිනය :————.
11. භාරකරු පියා නොවේ නම් ඔහුගේ නම සහ නෑදෑකම :————.
12. භාරකරුගේ රක්ෂාව සහ ලිපිනය :————.
13. බොම්බායේ දැනට මිතුරෙක් හෝ නෑදෑයෙක් සිටී නම් ඔහුගේ ලිපිනය සහ රක්ෂාව :————.
14. ඉල්ලුම්කරු බාලදක්ෂයෙකු වී සිටියේ ද ? :————.
15. ඉල්ලුම්කරුට පීනන්නට හැකි ද ? :————.

| |
|---|
| ඉල්ලුම්කරු මෙතැන මුද්දර අලවා ඒමත අත්සන් තබා දාතම යෙදිය යුතුය. මුද්දරයේ වටිනාකම රු. 10 යි. |

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

ඉල්ලුම් පත්‍රයත් සමග පහත සඳහන් ලියකියවිලි එවිය යුතුයි :—

(අ) ඉල්ලුම්කරුගේ උප්පැන්න සහතිකයේ පිටපතක් ;

(ආ) ඉල්ලුම්කරුගේ යහපත් චරිතය පිළිබඳ ඔහුගේ නෑදෑයන් නොවන වැදගත් පුද්ගලයින් දෙදෙනෙකුගෙන් ලබාගත් සහතිකවල පිටපත් ;

(ඇ) රජයේ වෛද්‍ය නිලධාරියෙකුගෙන් ලබාගත් ඇස් පෙනීම පිළිබඳ සහතිකයක් හා වෛද්‍ය සහතිකයක් ;

(ඈ) අධ්‍යයන පොදු (සාමාන්‍ය) සහතික පත්‍රයේ පිටපතක්.

4-307—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

## ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ සැළසුම් ක්‍රියාත්මක අංශය

### සැළසුම්කරු තනතුර, II වන පන්තිය

ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ සැළසුම් ක්‍රියාත්මක අංශයේ II වන පන්තියේ සැළසුම්කරු තනතුරක් සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව පිළියෙල කරගත් ඉල්ලුම්පත්‍ර 1970 අප්‍රේල් මස 30 දිනට හෝ ඊට පෙර මා වෙත ලැබිය යුතුය.

**2. වැටුප් දීමනා.**—මෙම තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය මෙසේය.—රුපියල් 3,432 න් පටන් ගෙන වර්ෂයකට රුපියල් 144 බැගින් වූ වැටුප් වර්ධක 21 කින් රුපියල් 6,456 දක්වා වැඩිවන වාර්ෂික වැටුපක් මෙම තනතුරට හිමිය. රුපියල් 5,304 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් වේ.

**සැ. යු.**—තෝරාගත් අයදුම්කරුගේ සුදුසුකම් හා පළපුරුද්ද ගැන සළකා බලා මූලික වැටුපට වැඩි වැටුපක් පටන් ගැනීමේ දී භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව ගෙවිය හැක.

**3. සේවා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත වේ. පත්වීම අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත් වනු ඇත.

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) මනා චරිතයකින් හා ශාරීරික සනීපයකින් යුක්ත බව,

(ආ) ඉල්ලුම්කරුවන් 1970 අප්‍රේල් මස 30 දිනට වයසින් අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි බව,
(රජයේ සේවයේ නියුක්ත වූවන් සඳහා මෙම වයස් සීමාව බලපාන්නේ නැත.)

(ඇ) (i) ගණිතය විෂයයක් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළත්ව විෂයයන් 6 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගයේ සාමාන්‍ය පෙළින් සාමාර්ථය ලබා සිටීම සහ ඊට අතිරේකව පහත දැක්වෙන සුදුසුකම් වලින් එකක් තිබීම :—

(ii) 1. ලංකා කාර්මික විද්‍යාලයේ එක් අවුරුදු පාඨමාලාවක් (සැළසුම්කරුවන්ගේ පාඨමාලාවක්) හෝ සම තත්ත්වයේ පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම, සහ අවුරුදු 2 ක ආධුනික කාලය ; හෝ

2. ලංකා කාර්මික විද්‍යාලයේ සුළු පරිපාලකවරුන්ගේ හෝ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම සහ අවුරුදු 1 ක ආධුනික කාලය ; හෝ

3. ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි නිර්මාණය කිරීම සඳහා වූ සන්ධ්‍යා හෝ අර්ධකාලීන පාඨමාලාවේ විවිධ ශ්‍රේණිවල (එනම් I, II සහ III වැනි කොටස්) ත්‍රිවාර්ෂික සන්ධ්‍යා පන්ති අනුගමනය කර තිබීම සහ ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක් හෝ බලපත්‍රලත් (චාර්ටඩ්) ඉංජිනේරුවරුන්ගේ හෝ නිර්මාණ ශිල්පීන් හෝ යටතේ අවුරුදු 4 ක් අඛණ්ඩව ආධුනිකත්වයක් සේවය කර තිබීම. (මෙම සුදුසුකම් ඇති අයදුම්කරුවකු ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ රුපියල් 3,864 ක් නොඉක්මවන වැටුප් පියවරක් මත පත්කිරීම සඳහා සලකා බලනු ඇත.)

4. ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි කර්මාන්තය II කොටසේ විභාගයෙන් 1947 ට පෙර සමත්වී සැළසුම්කරුවකු වශයෙන් රජයේ දෙපාර්තමේන්තුවක හෝ ප්‍රසිද්ධ වෙළඳ සමාගමක හෝ දෙවර්ෂයකට වැඩි කාල සීමාවක් සේවය කර තිබීම ;

5. ප්‍රසිද්ධ ඉංජිනේරුවන් හෝ බලපත්‍ර ලත් (චාර්ටඩ්) ඉංජිනේරුවරුන් හෝ නිර්මාණ ශිල්පීන් හෝ යටතේ සැළසුම්කරුවකු වශයෙන් පස් වර්ෂයක් සේවය කර තිබීම.

5. අයදුම්කරුවන් විසින් තම අයදුම්පත්වලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකයේ පිටපතක් (සැ. යු.—බෞතීස්ම පිළිබඳ සහතිකපත්‍ර හෝ ආධාර ලබන පාඨශාලා ව්‍යවසාථා සංග්‍රහයේ සඳහන් වන කටයුතු සඳහා දෙනු ලබන සහතිකපත්‍ර හෝ භාරගනු නොලැබේ.)

(ii) අයදුම්කරු ලබා ඇති උසස්ම අධ්‍යාපනික කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(iii) ළඟදී ලබාගත් චරිත පිළිබඳ සහතික පත් 3 ක්.

6. මෙම ගැසට් පත්‍රයේ ප්‍රථම භාගයේ දෙවැනි ඡේදයේ මුලින් දැක්වෙන රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්කිරීම පිළිබඳ වූ සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

එච්. එස්. වනසිංහ,
වැඩ බලන සැළසුම් ක්‍රියාත්මක අධ්‍යක්ෂ,
ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යංශය.

**ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය,**

සැළසුම් ක්‍රියාත්මක අධ්‍යක්ෂ,
ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය,
තැ. පෙ. අංක 1,322, කොළඹ 1.

## ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ සැළසුම් ක්‍රියාත්මක අංශය

### II වන පන්තියේ සැළසුම්කරුවන්ගේ තනතුර සඳහා වූ ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා ස්ථානය————.
4. ජාතිය :————.
5. දැනට රක්ෂාවක් කරයි නම් එය :————.
6. දැනට රක්ෂාවක් නොකරයි නම් අන්තිම වරට කළ රක්ෂාව : ————.
7. අධ්‍යාපනික සුදුසුකම් :————.
8. කාර්මික සුදුසුකම් :————.
(සමර්ථ වූ විභාග සඳහන් කරන්න)
9. පුහුණුවීම හා පළපුරුද්ද පිළිබඳ විස්තර දින සහිතව :————.
10. කලින් කරන ලද රක්ෂාවන් සහ ලබන ලද පළපුරුද්ද පිළිබඳ විස්තර දින සහිතව :————.
11. කලින් රජයේ දෙපාර්තමේන්තුවක සේවය කළේ නම් ඉන් අස්වීමට හේතුව :————.
12. අපරාධ නඩුවක් සම්බන්ධයෙන් උසාවියකින් දඬුවම් ලබා ඇත් නම් වරද හා දඬුවම් පිළිබඳ විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4–310—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික අධ්‍යාපන ආයතනයන්හි "මැණික් කැපීම සහ ඔප දැමීම පිළිබඳ උපදේශක තනතුර" සඳහා පුහුණුවන උපදේශක

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික අධ්‍යාපන ආයතනයන්හි " මැණික් කැපීම සහ ඔප දැමීම පිළිබඳ උපදේශක තනතුරට " පුහුණුවන උපදේශක තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙළ වූ ඉල්ලුම් පත්‍ර 1970 අප්‍රියෙල් 30 වැනි දිනට පෙර ස්ථිර ලේකම් තුමා (සාමාන්‍ය පරිපාලන ශාඛාව), අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය, මැලේ වීදිය, කොළඹ 2 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

2. තෝරාගනු ලබන අයදුම්කරු " මැණික් කැපීම සහ ඔප දැමීම පිළිබඳ උපදේශක තනතුරට" පුහුණු කිරීම සඳහා පිටරට යැවීමට ඉඩ තිබේ. මෙම පුහුණුවීමේ පාඨමාලාව සතුටුදායක ලෙස අවසාන කිරීමෙන් පසු අයදුම්කරු සඳහා අදාළ බඳවා ගැනීමේ පරිපාටි, යටතේ " මැණික් කැපීම සහ ඔප දැමීම පිළිබඳ උපදේශක තනතුරට " පත් කරනු ලැබේ.

3. " මැණික් කැපීම සහ ඔප දැමීම පිළිබඳ උපදේශක තනතුර " ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. දැනට රජයේ සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරණ නිලධාරියකු පුහුණු වන්නකු වශයෙන් තෝරා ගනු ලැබුවහොත්, ඔහුට පුහුණුවීමේ කාලය තුළ ගෙවනු ලබන වැටුප් ප්‍රමාණය භාණ්ඩාගාරයේ උපදෙස් අනුව තීරණය කරනු ලැබේ. (බාහිර අයදුම්කරුවකු පුහුණුවන්නකු වශයෙන් තෝරා ගැනීමට සිදුවුනි නම් ඔහුට ගෙවනු ලබන දීමනා ද භාණ්ඩාගාරයේ උපදෙස් අනුව තීරණය කෙරෙනු ඇත.)

4. මැණික් කැපීම සහ ඔප දැමීම පිළිබඳ උපදේශක තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය :—රුපියල් 6,024 වාර්ෂික ඒකාබද්ධ වැටුපෙන් පටන්ගෙන රු. 144 වාර්ෂික වැටුප් වැඩිවීම් 4 කින් සහ රුපියල් 180 වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් රු. 8,040 වාර්ෂික ඒකාබද්ධ වැටුප දක්වා වැඩිවේ.

**සටහන.**—මෙම වැටුප් ක්‍රමයට අනුරූපව 1969.9.30 වැනි දින දක්වා පැවැති වැටුප් ක්‍රමය මෙසේය :—රුපියල් 3,420 වාර්ෂික වැටුපෙන් පටන් ගෙන රු. 120 වාර්ෂික වැටුප් වැඩිවීම් 4 කින් සහ රුපියල් 180 වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් රු. 5,340 වාර්ෂික වැටුප දක්වා වැඩිවේ.

5. පුහුණුවන්නකු සඳහා අදළ අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම් :— සෑම අයදුම්කරුවකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළයුතුය :—

(i) 1970.4.30 වැනි දිනට වයස අවුරුදු 19 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි. (දනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට ඉහළ වයස් සීමාව අදළ නොවේ.)

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව.

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් ;

හෝ

(ආ) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව හා අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙල) විභාගයෙන් ;

හෝ

(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත්වී සිටිය යුතුය.

සහ

(iv) ප්‍රායෝගික කාර්මික විද්‍යායතනයේ " භූගර්භ විද්‍යා " පිළිබඳ සහතිකය,

සහ

(v) සිංහලෙන් ඉගැන්වීමට හැකියාවක් තිබිය යුතුය. නැතහොත් පත්වීම ලැබී අවුරුදු තුනක් ඇතුලත සිංහලෙන් ඉගැන්වීමට හැකියාව ලබා ගත යුතුය.

සටහන.—ඉහත 5 (iii) සඳහා භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ඉංග්‍රීසි සාමාර්ථය ලබා ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැළකිලි දක්වනු ලැබේ.

6. පුහුණුවීම සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීමේ කොන්දේසි :—තෝරා ගත් අයදුම්කරුට පහත සඳහන් කරුණු සඳහා ආණ්ඩුව සමග ගිවිසුම් පත්‍රයකට සුහ ඇප කරුවන් දෙදෙනෙකු සමග බැඳුම්කරයකට ද අත්සන් කිරීමට අවශ්‍ය වනු ඇත.

(අ) අනිකුත් දේවල් සමඟ උද්‍යොගිමත්ව සහ ශක්තිමත්ව " මැණික් විද්‍යාව " පිළිබඳ වෘත්තීය පාඨමාලාව (Trade Course in Gemmology) නොකඩවා හැදෑරීමටත් එය සතුටුදයක ලෙස සම්පූර්ණ කිරීමටත්, එය සම්පූර්ණ කිරීමෙන් පසු නියම කරන ලද කාලයකට ලංකාණ්ඩුවට සේවය කිරීමටත් (එම කාලය ආණ්ඩුව විසින් තීරණය කරනු ලැබේ.) බැඳෙන ගිවිසුම් පත්‍රය, සහ

(ආ) ගිවිසුම් පත්‍රයේ කොන්දේසි පිළිපැදීමට අපොහොසත්වූ අවස්ථාවක පුහුණුව සඳහා ලංකාණ්ඩුව විසිනුත් වෙනත් ආණ්ඩුවක් සහ/හෝ ආයතනයක් විසිනුත් වියදම් කරන ලද සම්පූර්ණ මුදල (පඩිය, වෙනත් දීමනා, ගමන් වියදම්, ගාස්තු ආදිය) ආපසු ලංකාණ්ඩුවට ගෙවීමට බැඳෙමින් පිළිගත් ඇපකරුවන් දෙදෙනෙකු සමග අත්සන් තබන ඇප ඔප්පුවක්.

7. රජයේ සේවයේ නියුතු සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම තමන්ගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසු එවන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට නියම අවස්ථාවේදී ලැබී,ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණය ඉදිරිපත් කර නිර්දේශ කළහොත් පමණි, යථෝක්ත ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් භාරගනු ලබන්නේ.

8. අයදුම්කරුවන් විසින් පහත දක්වෙන ලියවිලි පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම් පත්‍ර වලට අමුණා එවිය යුතුයි.

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථාවන්හි සඳහන් කටයුතු පිණිස නිකුත් කර ඇති සහතික භාර ගනු නොලැබේ.),

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සහ වෘත්තීය සහතික,

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය සහ තනතුරට ඇති සුදුසුකම් පිළිබඳව මෑතදී ලබාගත් සහතික තුනක්.

සැළකිය යුතුයි.—දනට රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවනට ඉහත (ඇ) අනු ඡේදය යටතේ සහතික ඉදිරිපත් කිරීමට අවශ්‍ය නොවේ.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසෙහි (II) වැනි ඡේදයේ පටන් ගැන්මෙහි පළකර තිබෙන රජයේ තනතුරු සඳහා පත් කිරීම් වලට අදළ පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 අප්‍රියෙල් මස 3 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.
සාප/3/230

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

(අඟල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ ෆුල්ස්කැප් කඩදසිවල සකස් කළ යුතුය)

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

මැණික් කැපීම සහ ඔප දැමීම පිළිබඳ උපදේශක තනතුරට පුහුණුවන උපදේශක තනතුර

(සැඳහුම සාප/3/230)

1. සම්පූර්ණ නම (පැහැදිලි ලෙස ලියන්න) :————. මහතා/මහත්මිය/මෙනෙවිය.

2. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි)

3. ජාතිය :————.
(ලාංකිකවන්නේ (අ) පරම්පරාවෙන්ද, (ආ) ලියාපදිංචි වීමෙන්ද, යන්න සඳහන් කරන්න. ලංකාවේ පුරවැසියකු වන්නේ, ලියාපදිංචි කිරීමෙන් නම්, පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැඳහුම් අංකයත් සඳහන් කරන්න.)

4. (අ) අයදුම් පත් භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—
අවුරුදු :————. මාස :————. දින :————.
(ආ) උපන් දිනය :
අවුරුද්ද :————. මාසය :————. දිනය :————
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න)

5. උපන් ස්ථානය :————.
(අ) අයදුම්කරු :————
(ආ) ඔහුගේ/ඇගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ සීයා :————.
(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

6. (අ) විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.
(ආ) විවාහක නම්, විවාහ වූ දිනය සහ ලමයි ගණන සඳහන් කරන්න:—

7. (අ) වයස අවුරුදු 15 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/කාර්මික අධ්‍යාපනය (ලබා ඇත්නම්) | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |

(ආ) අන්තිමට ඉගෙනගත් පාසලෙන් අස්වූ දිනය :————.

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත්වූ විභාගය, දිනයත් සමග :—
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.

9. කියවීම, ලිවීම, කථා කිරීම හා භාෂා පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවක් තිබේද :—
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.

10. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර (අ) ලැබූ දින,හා (ආ) ආයතනවල නම් ද සඳහන් කරන්න :————.

11. විශේෂ සුදුසුකම් :————.
(නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් හා/හෝ පල පුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දින වකවානු සහිතව සඳහන් කරන්න.)

12. කිසියම් අපරාධ වරදක් නිසා, අධිකරණය මගින් වරදකරු කරනු ලැබ තිබේද? එසේනම් (අ) දිනය,(ආ) නඩු නොම්මරය,හා (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

13. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේනම්, ඔබේ ණය තුරුස් වල ප්‍රමාණය කොපමණද ?

14. වෙනත් විස්තර (වෙනත් විශේෂ හිමිකම් ආදිය) :————.

15. චරිත සහතික ලබාගත් අයගේ නම් හා පදවි නාම (මේ සහතිකවල පිටපත් මිස, මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුයි. දනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම්, මේ අවශ්‍ය නැත.)

16. සේවා මුක්ත හටයෙක් නම් (අ) සේනාංකය, (ආ) නිලය, (ඇ) සේවයට බැඳුන හා නිදහස් කරණ ලද දින පිළිබඳ විස්තර :————.

17. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකී රක්ෂා :—

(i) ආයතනවල නම් :————.

(ii) දරණ ලද තනතුර :————.

(iii) නියුක්තව සිටි දින වකවානුව :————.

(iv) අස්වීමට හේතුව :————.

(ආ) ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයක් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම්, (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර, (ආ) සේවයේ යෙදී සිටි දින, (ඇ) සේවය නතර කිරීමට හේතුව සඳහන් කරන්න :————.

18. දැනට යෙදී සිටින රක්ෂාව :————.

(i) ආයතනයේ නම :————.

(ii) (අ) තනතුර, ශ්‍රේණිය හා (ආ) ඊට පත්වූ දිනය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? තාවකාලික හෝ අනියම්ද ? :————.

(iv) (දීමනා රහිතව) දැනට ලබන වාර්ෂික වැටුප් හා වැටුප් ක්‍රමය :—
(ඒකාබද්ධ වැටුප් ලබන්නේ නම් දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප හා වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය සඳහන් කරන්න.)

(v) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

(vi) දැනට නියුක්ත තනතුරේ සේවය ස්ථිර කර තිබේද යනවග :————
(සේවය ස්ථිර කර තිබේ නම් එම ලිපියේ පිටපතක් අමුණන්න).

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර, සත්‍ය වබත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————

4–390/1—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### ලඝුලේඛනය හා යතුරුලියනය (ඉංග්‍රීසි) උපදේශක තනතුර

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික අධ්‍යාපන ආයතනයන්හි ලඝුලේඛනය හා යතුරුලියනය (ඉංග්‍රීසි) උපදේශක තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ඉල්ලුම් කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙළ වූ අයදුම්පත් 1970.4.30 වැනි දිනට හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැන (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත ලැබෙන සේ ලියාපදිංචි කරණ ලද තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් කෙළවරේ ''ලඝුලේඛනය හා යතුරුලියනය (ඉංග්‍රීසි) උපදේශක තනතුර'' යනුවෙන් සඳහන් කළ යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම සාමාන්‍ය වශයෙන් තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත් වේ. දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් ඔහු නියමිත කාලයක් වැඩ බැලීමේ පදනම මත පත් කරනු ඇත.

3. මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම් කරුවෙකුම පහත දක්වෙන සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1970.4.30 වන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු අවුරුදු 40 ට නොවැඩි බව (දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ.);

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව ;

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රයෙන්, හෝ

(ආ) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල හෝ දෙමළ භාෂාව හා අංක ගණිතය හෝ ගණිතය ඇතුළු විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ; හෝ

(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත්ව සිටින බව ; සහ

(iv) ලංකා කාර්මික විද්‍යාලයේ උසස් වාණිජ සහතිකය (ලඝුලේඛනය හා යතුරුලියනය) සහ වාණිජ සහතිකය (ගණන් තැබීම) ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබා ඇති බව ; හෝ

(v) සමාන හෝ උසස් සුදුසුකම් ලබා ඇති බව.

4. (i) **මෙම තනතුරට අයත් වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය.**—රුපියල් 5,016—11 × 144 සහ 5 × 180—රු. 7,500 වේ. රුපියල් 6,780 වාර්ෂික ඒකාබද්ධ වැටුප් පියවර ඉක්මවා යෑමට පෙර කාර්යක්ෂමතා කඩඉමෙන් සමත්විය යුතුය.

(ii) පත්කර ගනු ලබන්නා සෑහෙන ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පලපුරුද්දක් ලබා තිබිය යුතු අතර අවුරුදු 5 කට අඩු පලපුරුද්දක් ඇති අයෙකු තෝරා ගනු ලැබුවහොත්, ඔහු/ඇ විසින් අවශ්‍ය පලපුරුද්ද ලබාගන්නා තෙක් රු. 5,016 ක නියමිත වාර්ෂික ඒකාබද්ධ වැටුපක් සහිත වැඩ බැලීමේ පදනමක් මත පත් කරනු ඇත.

**සටහන.**—මෙම වැටුප් ක්‍රමයට අනුරූපව 1969.9.30 වැනි දින දක්වා පැවැති වැටුප් ක්‍රමය මෙසේය: රු. 2,580—11 × 20 සහ 5 × 180—රු. 4,800 (කාර්යක්ෂමතා කඩඉම රු. 4,080 ට පෙර) වාර්ෂික වැටුප් ක්‍රමයකි.

5. රජයේ සේවයේ නියුක්ත සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසුව එවන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියම අවස්ථාවේ දී ලැබී, ප්‍රමාදය සඳහා සැල කිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් භාර ගනු ලැබේ. තවද සෑම අයදුම්කරුවකුම තම අයදුම් පත්‍රයේ පිටපතක් කෙළින්ම මෙම අමාත්‍යාංශය වෙත එවිය යුතුය.

6. අයදුම්කරුවන් විසින් පහත දක්වෙන ලියවිලි වල පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම්පත් වලට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකය හෝ පාඨශාලා වලට ඇතුළත්වීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවන්ට අනුව නිකුත් කළ උප්පැන්න සහතිකය භාර ගත නො හැක.) ;

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සහතික ;

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය හා තනතුරට ඇති සුදුසුකම් පිළිබඳ සහතික 3ක්.

(සැළකිය යුතුය.—දැනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් ඉහත (ඇ) අනුඡේදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුවුවමනාය).

7. ඉල්ලුම් පත්‍ර හා අනෙකුත් අදාල ලියකියවිලි, මෙම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැනට හැර වෙනත් කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ පළමු වැනි කොටසේ දෙවන ඡේදයේ ආරම්භයේ දක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනය පසු වී දින 14 ක් ගෙ නු කළ පිළිතුරක් නො ලදහොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘති අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට/ඇයට අහිමිවනු ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
**ස්ථිර ලේකම්.**

1970 අප්‍රියෙල් මස 3 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

සාප 3/254

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

(අඟල් 8½ × 13½ ප්‍රමාණයේ ෆුල්ස්කැප් කඩදාසිවල සකස්කළ යුතුය)

අධ්‍ය පන හා සංස්කෘතික අමාත්‍යාංශය

ලඝුලේඛන හා යතුරුලියනය (ඉංග්‍රීසි) උපදේශක තනතුර

(සැදැහුම : සාප/3/254)

1. සම්පූර්ණ නම (පැහැ ලි ලෙස ලියන්න) :———— .
(මහතා/මහත්මිය/මෙනෙවිය)

2. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි)

3. ජාතිය :————.
(ලාංකික වන්නේ (අ) පරම්පරාවෙන්ද, (ආ) ලි ාපදිංචි වීමෙන් ද, යන්න සඳහන් කරන්න. ලංකාවේ පුරවැසියකු වන්නේ, ලියාපදිංචි කිරීමෙන් නම්, පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදැහුම් අංකයත් සඳහන් කරන්න.)

4. (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට නියම වයස :————.
අවුරුදු :————. මාස :———— දින :————.

(ආ) උපන් දිනය : අවුරුද්ද :————. මාසය :————.
දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න)

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) ඔහුගේ/ඇගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ සීයා :————.

(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

6. (අ) විවාහක ද ? අවිවාහක ද ? වැන්දඹු ද ? :————.

(ආ) විවාහක නම්, විවාහ වූ දිනය සහ ළමයි ගණන සඳහන් කරන්න :————.

7. (අ) වයස අවුරුදු 15 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/කාර්මික අධ්‍යාපනය (ලබා ඇත්නම්) | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |

(ආ) අන්තිමට ඉගෙනගත් පාසලෙන් අස්වූ දිනය :————.

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත්වූ විභාගය, දිනයන් සමග :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

(ඇ) ඉංග්‍රීසි :————.

9. කියවීම, ලිවීම, කථා කිරීම හා භාෂා පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවක් තිබේ ද ? :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

(ඇ) ඉංග්‍රීසි :————.

10. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර (අ) ලැබූ දින හා (ආ) ආයතනවල නම් ද සඳහන් කරන්න :————.

11. විශේෂ සුදුසුකම් :————.

(නිවේදනයෙහි සඳහන් කොට ඇති, විශේෂ සුදුසුකම් හා/හෝ පලපුරුද්ද ඔබට තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින, වකවානු සහිතව සඳහන් කරන්න.)

12. කිසියම් අපරාධ වරදක් නිසා, අධිකරණය මගින් වරදකරු කරනු ලැබතිබේද ? එසේනම් (අ) දිනය ; (ආ) නඩු නොම්මරය හා (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

13. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේ නම්, ඔබේ ණයතුරුස් වල ප්‍රමාණය කොපමණද ? :————.

14. වෙනත් විස්තර (වෙනත් විශේෂ හිමිකම් ආදිය) :————.

15. චරිත සහතික ලබාගත් අයගේ නම් හා පදවි නාම (මේ සහතිකවල පිටපත් මිස, මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුයි. දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම්, මේ අවශ්‍ය නැත.) :————.

16. සේවා මුක්ත හටයෙක් නම්—(අ) සේනාංකය ; (ආ) නිලය ; (ඇ) සේවයට බැඳුන හා නිදහස් කරණ ලද දින පිළිබඳ විස්තර :————

17. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකීරක්ෂා :—

(i) ආයතනවල නම් :————.

(ii) දරණ ලද තනතුර :————.

(iii) නියුක්තව සිටි දින වකවානුව :————.

(iv) අස්වීමට හේතුව :————.

(ආ) ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයක් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම්, (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර ; (ආ) සේවයේ යෙදී සිටි දින; (ඇ) සේවය නතර කිරීමට හේතුව සඳහන් කරන්න :————.

18. දැනට යෙදී සිටින රක්ෂාව :—

(i) ආයතනයේ නම :————.

(ii) (අ) තනතුර, ශ්‍රෙණිය හා (ආ) ඊට පත්වූ දිනය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? තාවකාලික හෝ අනියම්ද ? :————.

(iv) (දීමනා රහිතව) දැනට ලබන වාර්ෂික වැටුප් හා වැටුප් ක්‍රමය (ඒකාබද්ධ වැටුප් ලබන්නේ නම් දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප හා වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය සඳහන් කරන්න) :————.

(v) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

(vi) දැනට නියුක්ත තනතුරේ සේවය ස්ථිර කර තිබේද යනවග (සේවය ස්ථිර කර තිබේනම් එම ලිපියේ පිටපතක් අමුණන්න) :————.

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර, සත්‍ය බවත් නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වූවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
දිනය :————. අයදුම්කරුගේ අත්සන,

4—390/2—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

## වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුව

### මට්ටක්කුලියේ මධ්‍ය ගබඩාවේ අතිරේක ප්‍රධාන ගබඩා නිලධාරි තනතුර

වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් ලියාපදිංචි කළ තැපෑලෙන් 1970 අප්‍රේල් මස 29 වැනි දින හෝ ඊට පෙර ලැබෙනසේ, කොළඹ 1, මිලර්ස් ගොඩනැගිල්ලේ සිව්වැනි මාලයේ පිහිටි වෙළඳ මිලට ගැනීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් වෙත එවිය යුතුයි.

**1. අවශ්‍ය සුදුසුකම් :**

(අ) **වයස් සීමාව :** 1970 අප්‍රේල් මස 29 වැනි දිනට වයස අවුරුදු 40ට නොවැඩි විය යුතුය. (දෙපාර්තමේන්තු අපේක්ෂකයින් සඳහා මෙම වයස් සීමාව බලපවත්වන්නේ නැත.)

(ආ) **අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම් :** ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ දෙවරකට නොවැඩි වාර ගණනකදී ලබාගත් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළු විෂයයන් හයකින් අධ්‍යයන පොදු (සාමාන්‍ය) සහතිකය හෝ ඊට වඩා උසස් විභාගයකින් සාමාර්ථය, සහ

(i) රබර් වර්ග කිරීම පිළිබඳව මනා දැනුමක් සහිතව, ලංකාවේ අපනයන වෙළඳ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ/හෝ වර්ග කිරීම පිළිබඳව 15 වසරක පළපුරුදක් ; හෝ

(ii) රබර් පමණක් නිෂ්පාදනයෙහි සහ/හෝ වර්ග කිරීමෙහි 15 වසරක පළපුරුද්දක් තිබිය යුතුය ;

(iii) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්තව සිටිය යුතුය.

**සංලක්ෂ්‍යය.**—කණිෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඊට සමාන සුදුසුකමක් හෝ ඇති දෙපාර්තමේන්තු අපේක්ෂකයින්, ඉහත 1 (ආ) (i) හෝ (ii) වැනි ඡේදයෙහි නියමිත සුදුසුකම් ඇතොත් අයදුම් කිරීමට සුදුස්සෝ වෙති.

2. **වැටුප් හා දීමනා :** මෙම තනතුරට අදාල ඒකාබද්ධ වැටුප් පරිමාණය : වර්ෂයකට රු. 5,304—9×144 සහ 8×180—රු. 8,040 වේ.

3. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති :** මෙම තනතුර තාවකාලිකය, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකමුදල් ගෙවිය යුතුය.

4. **සේවා කොන්දේසි :** (අ) තෝරා ගනු ලැබූ අපේක්ෂකයා, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු නම්—

(i) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන වලටත්, රජයේ භාෂා ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදවීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසිය ඔහු පිළිගත යුතුය.

(ii) ඔහුගේ පත්වීම කලින් නතර නොකරනු ලැබුවහොත් පත්වීමේ දිනයේ සිට පිළිවෙලින් අවුරුද්දක්, අවුරුදු 2 ක් සහ අවුරුදු 3 ක් ඇතුළත I වැනි ශ්‍රේණියේ, II වැනි ශ්‍රේණියේ සහ III වැනි ශ්‍රේණියේ සිංහල ප්‍රවීණතා පරීක්ෂණයන් ගෙන් සමත්වන ලෙස ඔහුට නියම කරනු ලැබේ.

නියමිත කාල පරිච්ඡේදය තුළදී පරීක්ෂණයකින් සමත් නොවුව හොත්, එය වැටුප් වැඩිවීම් අත්හිටුවීමට හේතුවේ. නියමිත කාල

පරිච්ඡේදයෙන් පසු, තවත්, හයමසක් ඇතුළත පරීක්ෂණයෙන් සමත් නොවුවහොත්, වැටුප් වැඩිවීම අත්හිටුවීම, වැටුප් වැඩිවීම නතර කිරීමකට පරිවර්තනය කර, පරීක්ෂණයෙන් සමත් වන තෙක් එම නතර කිරීම ක්‍රියාත්මකව තබනු ඇත. අවුරුදු 3 ඉක්මවා ඔහු සේවයෙහි නියුක්ත කොට තබා ගැනීම III වැනි ශ්‍රේණියේ පරීක්ෂණයෙන් සමත්වීම මත රඳා පවතිනු ඇත. කෙසේ වෙතත්, මේ ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීමෙන් ඔහුට දිගටම සේවයේ රැඳී සිටීමට අවසර දෙනු ලබන බවත් අවශ්‍යයෙන්ම අදහස් නොකෙරේ.

(iii) රාජ්‍ය නිලධාරීන්ගේ (ආරක්ෂා) ආඥාපනත ප්‍රකාර වාණිජ හා වෙළඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් නියම කරනු ලබන ආකාරයට, නියම කරනු ලබන මුදලකින් ඇපයක් තබන ලෙස තෝරාගනු ලැබූ අපේක්ෂකයාට නියම කරනු ලැබිය හැකිය.

(ආ) ස්ථිර තරතුරක ඒ වන විටත් ස්ථිර කරනු ලැබ සිටින නිලධාරියෙකු අළුත් තනතුරකට පත් කරනු ලබන්නේ නිශ්චිත කාල පරිච්ඡේදයක් තුල වැඩ බැලීමේ පදනමක් මතය. අංක 574 සහ 1962.4.6 දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය බලන්න.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතීස්ම සහතික හෝ අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහය යටතේ උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ පිළිගනු නොලැබේ.) ;

(ආ) උසස්ම අධ්‍යාපනික සහතිකය ;

(ඇ) රබර් නිෂ්පාදනය සහ/හෝ වර්ග කිරීම පිළිබඳ පළපුරුදුකමට අදාල සහතික ;

(ඇ) මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක් (දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අපේක්ෂකයන් විසින් චරිත සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍යය).

6. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ, (II; වන ඡේදයේ ආරම්භයේ පළ කර ඇති රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

වී. පද්මනාදන්,
වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ කොමසාරිස්.

1970 මාර්තු මස 31 දින, කොළඹ 1, මිලර්ස් ගොඩනැගිල්ලේ,
වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ දෙපාර්තමේන්තුවේදීය, තැ. පෙ. අංක 147.

### ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

**මට්ටක්කුලියේ මධ්‍ය ගබඩාවේ අතිරේක ප්‍රධාන ගබඩා නිලධාරි තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
   (අ) පෙලපත් නම :————.
   (ආ) අනික් නම් :————.
2. ලිපිනය :————.
3. (අ) ජාතිය :————.
   (ආ) ඔබ ලංකාවේ පුරවැසියෙක්ද යන බව සඳහන් කරන්න :————.
      (i) පරම්පරාවෙන්ද :————.
      (ii) ලියා පදිංචි කිරීමෙන්ද :————.
4. (අ) උපන් දිනය සහ 1970.4.29 දිනට නියමිත වයස :————
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)
   (ආ) විවාහක ද අවිවාහකද යන වග :————.
5. ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් හා සමත්වූ විෂයයන් (දිනයන් සමග) :————.
6. ඉගෙන ගත් පාසැල හා පාසැලෙන් අස්වූ දිනය :————
7. නිවේදනයේ (1) (ආ) (i) හෝ (ii) ඡේදයෙහි යොමු කළ පළපුරුද්ද පිළිබඳ විස්තර :————.
   (එම පළපුරුද්ද තහවුරු කිරීම සඳහා සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)
8. කියවීම, ලිවීම, කථා කිරීම හා අර්ථ නිරූපනය පිළිබඳ සිංහල ප්‍රවීණතාව :————.
9. පාසැලෙන් අස්වූ දා සිට කළ රැකියාවන් හා ඒ සම්බන්ධවූ සේවා හා දිනයන් පිළිබඳ විස්තර :————.
10. චරිත සහතික ලබාගත් අයගේ නම් හා ලිපිනයන් (එම සහතික පත්‍රවල මුල් ලිපි නොව, පිටපත් ඉල්ලුම් පතට ඇමිණිය යුතුය) :————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් සහතික කරමි. මෙහි යම්කිසි අසත්‍ය හෝ සාවද්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බව මා තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම එම තනතුරට නුසුදුස් සෙකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනිනම් රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ ඇති බව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4–401—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර සහ යටිනුවර කොට්ඨාශය (ගඟ පලාත කොට්ඨාශයේ මුරුතලාව) වෙනුවෙන් විවාහ (උඩරට සහ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් වරයකු පත්කිරීම

උඩුනුවර සහ යටිනුවර ගඟ පලාත කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොටගෙන ගම්වාසින්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසි එකකට නොඅඩු, ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙහි වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාමසේවක කාර්යාල, පලාත් පාලන ආයතන කාර්යල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ඇදි කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වල ඇතුලත්වේ.

3. සියලුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1970 මැයි මස 4 වැනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙනසේ ලියා පදිංචි කල තැපැලෙන් එවිය යුතුයි.

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
දිස්ත්‍රික් ලේකම්.

1970 මාර්තු මස 23 වැනි දින,
මහනුවර දිස්ත්‍රික් ලේකම් කායඝාලයේදීය.

4–265—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව පල්ලේ ගම්පහ කොට්ඨාශයේ විවාහ (උඩරට සහ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

හාරිස් පත්තුව පල්ලේගම්පහ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන ගම් වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකට නොඅඩු, ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාමසේවක කාර්යාල, පළාත් පාලන ආයතක කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදි කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුලත්වේ.

3. සියලුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1970 මැයි මස 4 වැනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙනසේ ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි.

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
දිස්ත්‍රික් ලේකම්.

1970 මාර්තු මස 23 වෙනි දින,
මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදීය.

4–264—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### නිර්මාන නිලධාරි තනතුරු

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිර්මාන නිලධාරි තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. යට දක්වෙන ආකෘතියේ පරිදි පිළියෙල කරන ලද අයදුම්පත් 1970 මැයි මස 10 වන දින හෝ ඊට පෙර කොළඹ 1, ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ ලේඛණගත තැපැලෙන් එවිය යුතුය.

2. තනතුරට අදල ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමය රුපියල් 6,600—8 × 180—රු. 8,040 වන අතර, මෙම වැටුප් ක්‍රමයේ රුපියල් 7,140– වාර්ෂික වැටුප් තලයට ප්‍රථම කාර්යක්ෂමතා කඩ ඉමකි.

3. අවශ්‍ය සුදුසුකම්.—(ඒ) වයස : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 25 ට අඩු හෝ 40ට නොවැඩි විය යුතුය. (දනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නවුන් කෙරේ මෙම වයස් සීමාවන් බල නො පාන්නේය.)

(බී) අධ්‍යාපනික—ගණිතය ඇතුළුව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙල) විභාගයේදී ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව යටත් පිරිසෙයින් විෂයයන් පහකින්වත් එකම විභාග අවස්ථාවකදී ලත් සාමාර්ථය සහිතව විෂයයන් හයකින් ලත් සාමාර්ථය හෝ ගණිතය ඇතුළුව ඊට සමාන හෝ උසස් විභාගයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය.

(සී) කාර්මික—පහත දක්වෙන සුදුසුකම් වලින් එකක් තිබිය යුතුය :–

(i) යට දක්වෙන උප ග්‍රන්ථ 1හි සඳහන් පරිදි, විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කණිෂ්ඨ කාර්මික නිලධාරීන් (ඉංජිනේරු වෘත්තිය) සඳහා පවත්වනු ලබන දෙපාර්තමේන්තු විභාගයේදී මූලික ත්‍රිකෝණමිතිය, ප්‍රමාණයන් ගණන් ගැනීම (උසස් පත්‍ර) බිම් මැණීම හා මට්ටම් ගැනීම (උසය පත්‍ර), සැලසුම් ඇඳීම, ගොඩනැගිලි නිර්මාණය (උසස් පත්‍ර) මාර්ග නිර්මාණය හා මාර්ග නඩත්තුව (උසස් පත්‍ර), යන විෂයයන් ගෙන් සහ ජල සම්පාදන හා ජලාපවහන ක්‍රමය (උසස් පත්‍ර) හෝ පාලම් සහ විශාල නිර්මිත නිර්මාන සහ නඩත්තුව යන විෂයයන්ගෙන් එකක් සමත් වී සිටිය යුතුය ;

නැතහොත්

(ii) ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි ඉදි කිරීම, ගෘහ නිර්මාන ශිල්පය හෝ නාගරික හෝ නිර්මාන ඉංජිනේරු විද්‍යාව සම්පූර්ණ පාඨම් මාලාව සාර්ථක ලෙස සම්පූර්ණයෙන් නිම කර සිටිය යුතුය ;

නැතහොත්

(iii) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන් සඳහා සම්පූර්ණ දිවා කාල පාඨම් මාලාව සාර්ථක ලෙස සම්පූර්ණයෙන් නිම කර සිටිය යුතුය.

නැතහොත්

(iv) ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ කාර්මික අභ්‍යාස ආයතනයේ උපාධිය සාර්ථක ලෙස නිම කර සිටිය යුතුය.

(ඩී) පළපුරුද්ද—ඉහත 3 (සී) (ii), (iii) හා (iv) යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් ගොඩනැගිලි ඉදිකිරීම සහ පොදු ඉංජිනේරු වැඩ පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 12 ක ප්‍රායෝගික පළපුරුද්දක් සතුව තිබිය යුතු අතර, එම කාලසීමාවෙන් අවුරුදු 5 ක් එම සුදුසුකම් ලැබීමෙන් පසු ලත් පළපුරුද්ද විය යුතුය.

4. සේවයේ නියුක්ත කිරීමේ වගන්ති සහ කොන්දේසි.—මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම පළමුවෙන් තුන් අවුරුදු ආධුනික කාලසීමාවකට යටත් වන්නේය. පත්කරනු ලබන අය නියම කරනු ලබන පරිද්දෙන් දිවයිනේ කවර ස්ථානයක වුවද සේවය කළ යුතු වේ.

5. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡෙදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

6. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු අතර, තෝරා ගතහොත් ඔවුන් දනට දරණ තනතුරු වලින් මුදලිය හැකි බවට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සටහනක් ඇති අයදුම්පත් පමණක් සලකා බලනු ලැබේ.

7. අයදුම්කරුවන් තම අයදුම්පත් වලට පහත දක්වෙන සහතිකයන්හි පිටපත් (මුල් සහතික නොවේ) ඇමිණිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය ;

(ii) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය ;

(iii) කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(iv) ඉහත 3 (සී), (ii), (iii) හා (iv) යටතේ සුදුසුකම් ලබන අයදුම් කරුවන් නම් පළපුරුද්ද පිළිබඳ සහතික ;

(v) මෑතදී ලබාගත් චරිත සහතික දෙකක් (දනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් මේ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ).

8. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය පසුව මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

අමරදස ගුණවර්ධන,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
කොළඹ 1,
මාර්තු 26, 1970.

### 1 වන උප ග්‍රන්ථය

විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කණිෂ්ඨ කාර්මික නිලධාරීන් (ඉංජිනේරු වෘත්තිය) සඳහා වූ දෙපාර්තමේන්තු විභාගයේ දී පහත දක්වෙන විෂයයන්ගෙන් සමත්වන අය නිර්මාන නිලධාරි තනතුරට පත් කිරීම සඳහා සලකා බලනු ලැබීමට සුදුස්සෝ වෙති :—

| | විෂයය | කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ විභාගයේ නිර්දේශ පත්‍ර අංකය |
|---|---|---|
| 1. | මූලික ත්‍රිකෝණ මිතිය ... ... | 14 |
| 2. | ප්‍රමාණයන් ගණන් ගැනීම (උසස් පත්‍ර) ... | 15 |
| 3. | බිම් මැණුම් හා මට්ටම් ගැනීම (උසස් පත්‍ර) ... | 16 |
| 4. | සැලසුම් ... ... ... | 17 |
| 5. | ගොඩනැගිලි නිර්මාණය (උසස් පත්‍ර) ... | 18 |
| 6. | මාර්ග නිර්මාණය හා මාර්ග නඩත්තුව (උසස් පත්‍ර) ... | 19 |
| | මීට අමතරව පහත දක්වෙන විෂයයන්ගෙන් එකක් :— | |
| 7. | ජල සම්පාදනය හා ජලාපවහනය (උසස් පත්‍රය) ... | 20 |
| 8. | පාලම් සහ විශාල නිර්මිත නිර්මාණය සහ නඩත්තු කිරීම ... ... ... | 21 |

(සැ.යු.—එකිනෙක විෂයයකින් සාමාර්ථය ලැබීම සඳහා ලබාගත යුතු අඩුම ලකුණු සංඛ්‍යාව 50%).

### ආදර්ශ අයදුම් පත්‍රය

#### ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිර්මාන නිලධාරි තනතුර

1. සම්පූර්ණ නාමය :————.
   පෙළපත් නාමය :————.
   අනික් නාමයන් :————.

2. ලිපිනය:————.

3. ජාතිය :————.

4. 1970.5.10 දිනට වයස :————.

5. උපන් දිනය :————.

6. සමත් වූ ප්‍රසිද්ධ විභාගයන් සහ විෂයයන් සහිතව අධ්‍යාපන සුදුසුකම් සඳහන් කරන්න :————.

| විභාගයේ දිනය හෝ වකවානුව | විභාගයේ නම | සමත් වූ විෂයයන් |
|---|---|---|
| | | |

7. කාර්මික සුදුසුකම් :—

| පාඨමාලාවේ හෝ විභාගයේ නම | පාඨමාලාව හැදෑරූ කාලසීමාව හෝ විභාගයේ දිනය | සමත් වූ විෂයයන් |
|---|---|---|
| | | |

8. අයදුම්කරු සුදුසුකම් ලබන්නේ දැක්වීමේ 3 (සී) (ii), (iii) හෝ (iv) යන ඡේදයක් යටතේ නම්, නිවැරදි දින සහිතව පළපුරුද්ද සඳහන් කරන්න.

| ආයතනයේ හෝ දෙපාර්තමේන්තුවේ නම | දරූ තනතුර | කාලසීමාව | | රාජකාරිවල ස්වභාවය |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| | | | | |

9. චරිත සහතික ලබාගන්නා ලද්දවුන්ගේ නම් සහ ලිපිනයන් :————.

10. දනට කරන රක්ෂාව සහ වැටුප :————.

11. විශේෂ සුදුසුකමක් ඇතොත් සඳහන් කරන්න :————.

(සැ.යු.—ඉහත 5, 6, 7 , 8 හා 9 තීරයන්හි කරුණු අදළ සහතිකවල පිටපත් අමුණා සනාථ කළ යුතුය. දැන්වීමේ 7 වන ඡේදය බලන්න.)

මෙම අයදුම්පතෙහි මවිසින් සපයා ඇති විස්තර සත්‍ය හා නිවැරදි බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් විස්තර කිසිවක් අසත්‍ය බවට හෝ වැරදි බවට ඔප්පු වුවහොත්, මේ පදවියට මා පත්වීමට නුසුදුසු වන බැව් හා පත්වීමෙන් පසු අසත්‍ය භාවයක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමටද හේතු වන බැව් හොඳාකාර මම දන්නා බැව් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4–243—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

## පරිපාලන අභ්‍යාස ආයතනය

### ඇබෑර්තු

### ආචාර්ය හා පර්යේෂණ කාර්ය බලමණ්ඩලය

අභ්‍යාස හා පර්යේෂණ කටයුතු ආශ්‍රිතයන්ගේ තනතුරු සඳහා පරිපාලන අභ්‍යාස ආයතනයේ කාර්ය මණ්ඩලයෙහි ඇබෑර්තු තිබේ. මෙම තනතුරු දරන අයවලුන්ගේ කටයුතුවල ස්වභාවය, රාජ්‍ය සේවයේ වැඩි දියුණුව සඳහා යොමු කෙරෙන "ශාස්ත්‍රීය කටයුතු" වල හා ප්‍රායෝගික ක්‍රියාවන්හි යෙදීමය. මීට අදාළ කටයුතු මෙසේ නියම කෙරෙනු ඇත. එනම්,

(අ) රාජ්‍ය අංශයේ පුහුණු කිරීමේ අවශ්‍යතාවයන් දැන හැඳින ගැනීමේදී පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂට සහාය වීමය ;

(ආ) නියම කරනු ලබන අන්දමට විශේෂ ක්ෂේත්‍රයන්හි පුහුණු කිරීමේ හා පර්යේෂණ කටයුතු වල නිරතවීමය ;

(ඇ) නියම කරනු ලබන විෂයයන් පිළිබඳ ලිපි, ලේඛණ, සඟරා, පොත්පත් ආදිය සම්පාදනය කිරීමය ;

(ඈ) නියම කරනු ලබන විශේෂ ක්ෂේත්‍රයන්හි පුහුණු කිරීමේ කරුණු වැඩිදියුණු කිරීමය ;

(ඉ) රජයේ ආයතනයන් විසින් අරඹනු ලබන පුහුණු කිරීමේ වැඩ පිළිවෙලවල් වලට සහායවීමය ;

යන මේවා වෙති.

වැඩ කටයුතු කිරීමේ වේගය සීග්‍රය. ආයතනයේ දැනට කරගෙන යනු ලබන කටයුතුවලට අනුව අභ්‍යාස හා පර්යේෂණ ආශ්‍රිතයන් විසින්, තම තමන් නියම් කෙරෙන අදළ කටයුතු හා අධ්‍යයනයද සඳහා සතියකට පැය 60 ක් වෙන් කිරීමට කැමැත්තෙන් සිටිනු ලැබිය යුතුය.

තෝරා ගනු ලැබූ අයදුම්කරුවා සුදුසු බව ඔප්පු වුවහොත් ඔහුට/ ඇයට විශේෂවූ ක්ෂේත්‍රයෙහි විශේෂ අධ්‍යයනය සඳහා ඔහු/ඇය විදේශයන් වෙත යැවීම ගැන සලකා බලනු ලැබේ.

**සුදුසුකම්.**—අයදුම්කරුවෝ රාජ්‍ය අංශයේ මාණ්ඩලික ශ්‍රේණිවල අවම වශයෙන් අවුරුදු 5 ක සේවයක යෙදී ඇති නිලධාරීනු වියයුත්තාහ. ඔවුන් විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ගෞරව උපාධියක් හෝ සමාන වෘත්තීය සුදුසුකම් දරනු ලැබ සිටිය යුතුය.

අයදුම්කරුවන් 1970 අප්‍රේල් 1 වැනි දිනට වයස අවුරුදු 30 ට වැඩිවූ හා අවුරුදු 45 ට අඩු වූ අයවලුන් විය යුතුය.

**සේවා කොන්දේසි.**—ස්වකීය විදේශ පුහුණුවෙන් පසුව අවුරුදු 5 ක කාලසීමාවක් පරිපාලන අභ්‍යාස ආයතනයේ සේවයෙහි යෙදෙන බවට ගිවිසුමකට අත්සන් කිරීමට තෝරාගනු ලැබූ අයදුම්කරුවෝ සූදනම් විය යුත්තාහ. ඔවුන්ට, ඔවුන්ගේ විශේෂවූ ශ්‍රේණියට හෝ සේවයට අදළ සාමාන්‍ය වැටුප හා ඊට අමතර වශයෙන් වර්ෂයකට රු. 2,400 ක දීමනාවක්ද ගෙවනු ලබනු ඇත

**අයදුම්පත්.**—ආදර්ශ අයදුම්පත් ආකෘතියක් මෙහි පහත දක්වා ඇත. අයදුම්පත්, 1970 අප්‍රේල් 30 වෙනි දින හෝ ඊට ප්‍රථම පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂවරයා වෙත ලැබෙනසේ සාමාන්‍ය මාර්ගයන් මගින් ඉදිරිපත් කර සිටිනු ලැබිය යුතුය.

එච්. එස්. වනසිංහ,
පරිපාලන අභ්‍යාස ආයතනයෙ
අධ්‍යක්ෂ.

1970 අප්‍රේල් 2 වැනි දින,
කොළඹදී ය.

### අයදුම්පත් ආකෘතිය

1. නම :————,
(අන්තිම නම) :————, (අන්‍ය නම්) :————.

2. උපන් දිනය :————.

3. සේවය සහ පන්තිය—(හෝ තනතුර) :————.

4. රාජ්‍ය සේවයේ රැකියා ඉතිහාසය :————.

5. (අ) උපාධියේ හෝ වෘත්තීය සුදුසුකම්වල ස්වභාවය :————
(ආ) උපාධිය සඳහා ඉල්ලුම්කළ විෂයයන් :————.
(ඇ) වෙනත් විශ්ව විද්‍යාලයීය පරීක්ෂණයන් සඳහා ඉල්ලුම් කළ විෂයයන් :————.

6. ඉගැන්වීම් හා පර්යේෂණ පළපුරුදුකම් පිළිබඳ විස්තර : : ————.

7. අයදුම්කරු විසින් අනුගමනය කරන ලද අභ්‍යන්තර සේවා අභ්‍යාස වැඩපිළිවෙලවල් :————.

8. විදේශ සම්බන්ධයන්හි යෙදී තිබේනම් ඒ පිළිබඳ විස්තර: ————.

9. භාෂා ප්‍රවීණතාවය :————.

10. ඔබ ගැන සලකා බලනු ලැබීමට කැමැත්තේ පහත සඳහන් විෂයයන්ගෙන් කවර විෂයයන් සම්බන්ධයෙන් ද ?
(1) සාමාන්‍ය කළමනාකාරිත්වය
(2) සංවර්ධන ආර්ථිකත්වය
(3) යෝජනා ක්‍රම කළමනාකාරිත්වය
(4) පෞද්ගලික කළමනාකාරිත්වය
(5) සැපයීම් කළමනාකාරිත්වය
(6) මුදල් කළමනාකාරිත්වය
(7) පරිපාලන නීතිය
(8) යෝජනා ක්‍රම මිල කිරීම

4–312—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### සහකාර ගණකාධිකාරි තනතුරු

**සුදුසුකම් හා පළපුරුද්ද.**—ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණ ඩිප්ලෝමාව හෝ, වරලත් ගණකාධිකාරි ආයතනයේ හෝ, සංස්ථා බලලත් ආයතනයේ හෝ පිරිවැය හා වැඩ පිළිබඳ ගණකාධිකාරි ආයතනයේ මධ්‍ය විභාගය සහිතව ගිණුම් කටයුතු ගැන පරිපාලන තත්වයේ අවුරුදු තුනක පළපුරුද්ද,

හෝ,

ගිණුම් කටයුතු පිළිබඳව 15 අවුරුද්දක පළපුරුද්දක් ඇති එයින් අවුරුදු 5ක් විධායක තත්වයේ සේවය කර ඇති,
අය විය යුතුයි.

**වයස.**—අවුරුදු 25—40 අතර විය යුතුයි.

**වැටුප.**—රු. 800—1115
——————— (මාසික සියළු දීමණා අඩංගු)
7 × 45

රජයේ දෙපාර්තමේන්තු, අර්ධ රජයේ දෙපාර්තමේන්තු හා රජයේ සංස්ථාවන්හි අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්, ඒ ඒ දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරු අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්වන අතර, 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා විධිවිධාන පනත යටතේ, රජයේ භාෂා ප්‍රතිපත්තියට අනුව දැනට පනවා ඇති හෝ මතු පනවන ලබන හෝ නියෝගයන් අනුව කටයුතු කළ යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරු වාලච්චෙනෙහි හෝ දිවයිනේ වෙනි සංයුක්ත මණ්ඩලයේ ඕනෑම ආයතනයක සේවය කළ යුතු වනු ඇත.

පත් කිරීම සඳහා තෝරා ගනු ලබන්නන් ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව වැටුප් පරිමාණයෙහි සුදුසු පියවරක තබනු ඇත.

මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල අයදුම්කරුවන්ගේ අත් අකුරින් සම්පූර්ණ කරන ලද අයදුම් 1970. 4. 26 දිනට හෝ ඊට පෙර සභාපතිතුමාට ලැබෙන සේ පහත ඇති ලිපිනයට එවිය යුතුය.

අයදුම් පත් තැපෑලෙන් ඉල්ලුම් කරන විට තමන්ගේ ලිපිනය සහිත මුද්දර ගැසූ දිග කවරයක් එවිය යුතුයි.

මේ සඳහා ඉල්ලුම් කළ යුත්තේ අවශ්‍ය සුදුසුකම් ඇති අය පමණකි.

කේ. සී. තංගරාජා,
සභාපති,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

356, යූනියන් පෙදෙස,
තැ. පෙ. 1367,
කොළඹ 2,
1970 මාර්තු 23 වන දින.

4–353—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## මිනින්දෝරු දෙපාර්තමේන්තුව

### සැලසුම්කරුවන්ට බලපත්‍ර දීම සඳහා පවත්වනු ලබන විභාගය

සැලසුම්කරුවෙකු වශයෙන් වෘත්තියෙහි නියුක්තවීමට සර්වේ ජනරාල්ගේ සහතික පත්‍රය සඳහා පැවැත්වෙන විභාගය 1970 ජූනි මස 5 වැනි දින ආරම්භ වේ. ව්‍යවස්ථාපිත අණපනත් රාජ්‍ය භාෂාවෙන් පිළියෙල කරන තුරු, විභාගය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

2. **විභාගය පැවැත්වෙන මධ්‍යස්ථාන මෙසේ ය** :—කොළඹ, ගාල්ල, කුරුණෑගල, බදුල්ල, රත්නපුරය, මහනුවර, අනුරාධපුරය, ත්‍රිකුණාමලය, මඩකලපුව, පොළොන්නරුව, යාපනය, වවුනියාව සහ පුත්තලම.

3. **විභාගය සඳහා අයදුම් පත්‍රය.**—අපේක්ෂකයින් විසින් ලියා රු. 10 ක ගාස්තුවක් සමග මට එවිය යුතුය. මුද්දර මගින් එවනු ලබන විභාග ගාස්තු භාර ගනු නොලැබේ. චෙක්පත්/මනි ඕඩර්/පෝස්ටල් ඕඩර් සර්වේ ජනරාල්ට ලැබෙන සේ එවිය යුතුය. මෙම කාර්යාලයෙන් ඉල්ලුම් පත් පෝර්ම සපයනු නොලැබේ. පහත සඳහන් විස්තර සැපයිය යුතුය :—

(අ) සම්පූර්ණ නම :————.

(ආ) ස්ථිර ලිපිනය :————.

(ඇ) උපන් දිනය :————.

(ඈ) සමර්ථ වී ඇති උසස්ම විභාගය සහ මාධ්‍යය :————.

(ඉ) මධ්‍යස්ථානය :————.

4. අපේක්ෂකයින්ට කෝණමානය හා කණ්ඩාංක යන දෙකේ ආධාරය ඇතිව ක්ෂේත්‍ර සටහන් වලින් නිවැරදි ලෙස සැලැස්මක් ඇඳීමට හැකි බවත්, (ආ) එසේ නිවැරදි ලෙස අඳින ලද සැලැස්ම ගණන් බැලීමට හැකි බවටත් මා හට ඒත්තු ගැන්වීම අවශ්‍යය.

5. අයදුම්පත්‍ර 1970 අප්‍රේල් මස 30 වැනි දිනට පසු භාරගනු නොලැබේ.

6. අපේක්ෂකයාගේ විභාග අංකය කලින් යොදන ලද චිත්‍ර කඩදාසි සහ කණ්ඩාංක පත්‍ර විභාගයේදී සපයනු ලබන අතර, ඒවායේ වියදම් පියවා ගැනීම සඳහා රු. 2 ක වෙනම ගාස්තුවක් අය කරනු ලැබේ. එම මුදල අයදුම් පත්‍ර ගාස්තුවත් සමග එවිය යුතුය. කෙසේ වෙතත් අයදුම්කරුවන් තම තමන්ගේ ඇඳීමේ උපකරණ කණ්ඩාංක ගිණීම සඳහා චක්‍ර සහ ඔවුනට අවශ්‍ය අනිකුත් උපකරණ සපයා ගත යුතුය.

7. අපේක්ෂකයන් තමන් කැමති මධ්‍යස්ථාන සඳහන් කළ යුතුය.

8. (i) විභාගයට ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙකු විසින්ම විභාගය සඳහා තමන් පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග පරිපාලකගේ තෘප්තියට හේතුවන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. මේ කාරණය සඳහා පහත සඳහන් ලියවිලි අතුරෙන් එකක් ඉදිරිපත් කළ හැකිය :—

(අ) පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද අනන්‍යතා පත්‍රයක්.

(ආ) මෙම විභාගය පවත්වන දිනට අවුරුදු 3 කට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු පාස්පෝට් බලපත්‍රයක්.

(ඇ) මෙම විභාගය පවත්වන දිනට අවුරුදු 3 කට වැඩි නොවන කාලයක් ඇතුළත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක අධිකාරීත්වය යටතේ නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායාරූපයක්ද සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ අන්‍ය ලියවිල්ලක්.

(ii) (i) වෙනි ඡේදයෙන් අවශ්‍ය පරිදි කිසියම් අපේක්ෂකයකු තමාගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් සාක්ෂියක් ඉදිරිපත් කළ හොත් මිස, එම විභාගයට ඉදිරිපත් නොකරන අතරම, එසේ විභාගයට පෙනී සිටීමට හිමිකරුවෙක්ද නොවෙනවා ඇත.

සී. ටී. ගුණවර්ධන,
සර්වේ ජනරාල්.

සර්වේ ජනරාල් කාර්යාලය,
ප්‍රගති ශාඛාව,
තැ. පෙ. 506, කොළඹ 5,
1970. 3. 12.

4–242—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### සිංහල යතුරු ලියනය පුහුණු කිරීමේ පන්ති

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන්නට යන සිංහල යතුරු ලියනය පුහුණු කිරීමේ පන්තිවලට ඇතුළත්වීම සඳහා සුදුසුකම් ඇති ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම ඒ සඳහා අයදුම්පත් එවන ලෙස මෙයින් දන්වනු ලැබේ. මේ පන්ති සමසක් පමණ කාලයක් කාර්යාල වේලාවන් තුළ කොළඹ දී පවත්වනු ලැබේ. පුහුණුවන්නන් 40 දෙනකුට පමණ ඉඩ ඇත.

2. **අවශ්‍ය සුදුසුකම්** :—සෑම අයදුම්කරුවකුම/අයදුම්කාරියකම—

(අ) ලාංකික විය යුතුය ("ලාංකිකයා" යන පාඨයෙන් අදහස් කෙරෙන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරනු ලැබීමෙන් හෝ ලංකාවේ පුරවැසියකු වන කෙනෙකි.)

(ඉ) (i) සිංහල භාෂාව සහ අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ මූලික ගණිතය හෝ වාණිජ ගණිතය ඇතුළුව විෂයයන් සතරකින් සම්මාන සාමාර්ථ්‍යය සහිතව ලංකා ජ්‍යෙෂ්ඨ සහතිකපත්‍ර විභාගයෙන් ; හෝ

(ii) එකම වාරයකදී අඩු ගණනේ විෂයයන් 5 කින් වත් සමර්ථ වෙමින් විෂයයන් 6 කින් අධ්‍යයන පොදු (සාමාන්‍ය) සහතික පත්‍රය ලබා තිබිය යුතුය. මෙකී විෂයයන් 6 අතුරෙන් සිංහල භාෂාව සහ අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ මූලික ගණිතය හෝ වාණිජ ගණිතය ඇතුළුව විෂයයන් 4 කින් සම්මාන සාමාර්ථ්‍ය ලබා තිබිය යුතුය.

(iii) පූර්වෝක්ත (1) වැනි හෝ (2) වැනි ඡේදයේ සඳහන් සහතික පත්‍රයකට සමාන හෝ ඊට උසස් විභාගයක සහතික පත්‍රයක් ලබා තිබිය යුතුය.

(උ) 1970.4.30 වැනි දිනට වයස 17 ට අඩු හෝ 22 ට වැඩි හෝ නොවිය යුතුය.

(එ) ඉතා හොඳ චරිතයෙන් හා ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතුය.

3. කොළඹ දී පවත්වන සම්මුඛ පරීක්ෂණයකට හෝ විභාගයකට අයදුම්කරුවන්/අයදුම්කාරියන් පෙනී සිටිය යුතුය. ඒවා පවත්වන වේලාව හා ස්ථානය පසුව දන්වනු ලැබේ. ඒ සඳහා ගමන් ගාස්තු හෝ අනෙකුත් වියදම් ගෙවනු නොලැබේ. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අයදුම් පතෙහි යම් අසත්‍ය සටහනක් තිබී, තෝරා ගනු ලැබීමට පෙර, ඒ බව දැන ගතහොත් එයින් ම ඔහු/ඈ නුසුදුසු වීමට ද තෝරා ගනු ලැබීමෙන් පසුව දැනගතහොත් ඔහු/ඈ අස්කර දමනු ලැබීමට ද සිදුවිය හැකිය.

4. පුහුණු වන කාලය තුළදී කිසිම ගෙවීමක් කරනු නොලැබේ. පුහුණුව අවසානයේ දී යෝග්‍යතාව තීරණය කරන විභාගයක් පවත්වා ඒ විභාගයෙන් සමර්ථවූවන්ට සහතික පත් දෙනු ලැබේ. පුහුණුව අවසානයේ දී අයදුම්කරුවන්ට/අයදුම්කාරියන්ට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ හෝ රාජ්‍යසේවයෙහි හෝ තාවකාලික වශයෙන් හෝ ස්ථිර වශයෙන් හෝ රැකීරක්ෂා දීම ගැන කිසිසේත් ඇප වන්නේ නැත.

5. පුහුණු වීමේ කාලයේදී වරින් වර පරීක්ෂණයන් පවත්වා ඒවායේ ප්‍රතිඵල අනුව ආධුනිකයන්ට තව දුරටත් පුහුණු වීමට ඉඩ දෙනු ලැබේ. යම් ආධුනිකයකුගේ/ආධුනිකාවකගේ පැමිණීම හෝ ඉගෙනීම හෝ සාමාන්‍ය යෝග්‍යතාව හෝ හැසිරීම සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව තෘප්තියට පත් නොවේ නම්, පුහුණුවීමේ කාලය අතරතුර කවර අවස්ථාවකදී වුවත් ඔහු/ඈ පන්තියෙන් වහාම අස්කර දමනු ලබන්නට පුළුවන. එසේ අස්කර දමනු ලැබුවහොත් පසුව පවත්වන පුහුණු කිරීමේ පන්තියට ඇතුළත් වීමට නුසුදුසු වන්නේ ය. කලින් කල නිකුත් කරන ව්‍යවස්ථාවන් හා නියමයන් අනුව කටයුතු කරන බවට ආධුනිකයා/ආධුනිකාව විසින්ම නියමිත පොරොන්දු පත්‍රයක් අත්සන් කළ යුතුය.

6. දැන දැනම වූ නොසැලකිල්ලක් හෝ තදබල අප්‍රවේසම් කමක් නිසා බඩු නැතිවීමක් හෝ උපකරණ ආදියට හානියක් හෝ වුවහොත් අලාභය ගෙවන බවට ඇපකාරයන් දෙදෙනෙකු ඇපයට තබා රුපියල් 100 ක ඇප පත්‍රයකට අයදුම්කරුවන් පන්තියට ඇතුළත් කරගනු ලැබූ විට අත්සන් කළ යුතුය.

7. අයදුම්පත් එවිය යුත්තේ පහත අත්සන් කරන නිලධාරි තැනගේ පුද්ගලික නාමයට නොව, "රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, තැපැල් පෙට්ටිය 598, කොළඹ 7" යන ලිපිනයට ය. අයදුම්පත්, මෙහි පහත පළවන ආදර්ශ පිටපත අනුව තමාගේ අත් අකුරෙන්ම ලියා 1970. 4. 30 වැනි දිනට හෝ ඊට මත්තෙන් ලැබෙන්නට එවිය යුතුය. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පීටර් පී. අබේසේකර,
රාජ්‍ය භාෂාකටයුතු පිළිබඳ
කොමසාරිස්.

1970 මාර්තු මස 31 වැනි දින,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
22, ඊඩ් මාවත, කොළඹ 7.

## සිංහල යතුරු ලියනය පුහුණු කිරීමේ පන්තියට ඇතුළත් වීම සඳහා අයදුම් පත

(1) සම්පූර්ණ නම (පැහැදිලිව ලියන්න) :————.

(2) සම්පූර්ණ ලිපිනය :————.

(3) ජාතිය (ලාංකිකයකු වූයේ පෙලපතින් ද නැතහොත් ලියාපදිංචි වීමෙන් ද යන බව සඳහන් කරන්න) :————.

(4) 1970. 4. 30 වන දිනට වයස හා උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය. මුල් සහතික නොවේ) :————.

(5) ස්ත්‍රී පුරුෂ භාවය :————.

(6) විවාහක ද ? අවිවාහකද ? :————.

(7) සමර්ථ වූ උසස්ම විභාගය (විෂයයන් හා දිනය සමග) :————.

(8) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර හෝ අ. පො. ස. ප (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සාමාර්ථය සහ සම්මාන ලැබූ විෂයයන් (සහතික පිටපත් අමුණන්න. මුල් සහතික නොවේ. සහතික පත් ලැබී නැත්නම් ප්‍රධානාචාර්යවරයාගේ සහතිකයක් හෝ වෙනත් පිළිගත හැකි සහතිකයක් භාරගනු ලැබේ). :————.

(9) ඉගෙනීම ලැබූ පාඨශාලා (දිනයන් සමග) :————.

(10) සිංහල දැනුම පිළිබඳ විශේෂ සුදුසුකම් ඇතොත් ඒ බව :————

(11) සිංහල දෙමළ හෝ ඉංග්‍රීසි යතුරු ලියනය පිළිබඳ දැනුමක් තිබේද ?

(12) දැන් රක්ෂාවක යෙදී සිටී නම් ඒ බව :————.

(13) පියාගේ හෝ භාරකාරයාගේ නම හා ඔහුට/ඇයට ලියුම් ලැබෙන පිළිවෙල :————.

(14) තමා ගැන තොරතුරු විමසිය යුත්තන් දෙදෙනෙකුගේ නම් හා ලියුම් ලැබෙන පිළිවෙල :————.

(15) අයදුම්කරුගේ/අයදුම්කාරියගේ සුදුසුකම් හා චරිතය පිළිබඳ සහතික ලබාගත් අයගේ නම් හා ලිපිනයන්. මේ සහතික පත්වල පිටපත් (මුල් සහතික නොවේ) ඇමිණිය යුතුයි. එක් සහතිකයක් තමා අන්තිමට ඉගෙන ගත් පාසලේ මුල් ගුරුතුමාගෙන් විය යුතුයි. (අවශ්‍ය මුළු සහතික පිටපත් ගණන 3 කි) :————.

(16) වෙනත් සුදුසුකම් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4–306—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

### මැනිලා කඹ සැපයීම

අංක 14,895 හා 1970.2.27 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය මගින් කැඳවන ලද ඉහත සඳහන් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර බාර ගැනීමේ අවසාන දිනය 1970.6.2 දින තෙක් කල්දමා ඇති බව ටෙන්ඩර් කිරීමට බලාපොරොත්තු වන ටෙන්ඩර් කරුවන් කරුණාවෙන් සලකත්වා.

රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1970.4.10 දින,
කොළඹ දීය.

4–362—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 218 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්—තැපැල් ලිපිනය : 500 වැනි තැපැල් පෙට්ටිය, කොළඹ 1—ගැල්වනයිස් යකඩ ජලනල සැපයීම සඳහා 1970 ජූලි මස 14 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහතකී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1970 ජූලි මස 13 වැනි සඳුදා දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

විදේශීය ටෙන්ඩර්කරුවන් සඳහා විශේෂ ටෙන්ඩර් පෝර්ම සකස් කර තිබේ. රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට බලයලත් නියෝජිතයින්ට පමණක් එකී පෝර්ම කොළ දෙනු ලැබේ. ටෙන්ඩර්කරුවන් විසින් තමන්ට වුවමනා කවර අන්දමේ ටෙන්ඩර් පෝර්ම කොළ දැයි සඳහන් කළ යුතුයි.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඇස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1970 අප්‍රේල් මස 10 දින,
කොළඹදී ය.

4–392—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 1.) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|
| 1. 1970.10.1 සිට 1971.9.30 තෙක්, විෂබීජ නාශක දියර සැපයීම ... | .. 1970.5.12 |
| 2. සුදු සහ වර්ණවත් කඩු රොඩු සැපයීම ... | ... 1970.6.2. |

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝරම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ

1970 අප්‍රේල් මස 10 දින,
කොළඹදී ය.

4–391—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### මොනරාගල දිස්ත්‍රික්කයට අයත් සුදුපනාවෙල ව්‍යාපාරයේ ගොඩනැගිලි ඉදිකිරීම

ඉහත සඳහන් ව්‍යාපාරයේ පහත සඳහන් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා 1970 අප්‍රේල් මස 23 දින පෙරවරු 11 දක්වා චන්දිරිකාවැව ඉඩම් සංවර්ධන නිලධාරී විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ. සියලුම ද්‍රව්‍යයන් දෙපාර්තමේන්තුව මගින් සපයනු ලැබේ. ටෙන්ඩර් [illegible]තේ සේවක ගාස්තුවලට පමණි.

1. ඉඩම් කට්ටි ඕවර්සියර් නිවාස 01 යි
2. විෂ්කම්භය අඩි 5හේ ළිං 01 යි

2. 1970 අප්‍රේල් මස 22 දින දවල් 12 වන තෙක් චන්දිරිකාවැව ඉඩම් සංවර්ධන නිලධාරීගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝරමයක අනුපිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. චන්දිරිකාවැව ඉඩම් සංවර්ධන කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක රු. 25 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ෆෝරම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුය.

3. රිසිට් පත් තැන්පත් මුදල ආපසු ඉල්ලන විට ඉදිරිපත් කළ යුතුයි. ඒවා ටෙන්ඩරයට ඇමිනිය යුතු නොවේ..

4. ටෙන්ඩර් බහා ලූ කවරයේ වම් කෙලවරේ "සුදුපනාවෙල ව්‍යාපාරයේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන නිලධාරී චන්දිරිකාවැව පදලංගල, යන ලිපිනයට එවිය යුතුය. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ලියුම් කවරයේ වම් පස පහළ කෙලවරේ සඳහන් කළ යුතුය. ටෙන්ඩර් ලියාපදිංචි තැපැලෙන් හෝ චන්දිරිකාවැව ඉඩම් සංවර්ධන කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

5. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාළ නොවිය යුත්තේ ය. ඒවා සලකා බැලීම සඳහා ටෙන්ඩර් විවෘත කළ දින සිට දින 60 ක් යනතෙක් ඒවා ආපසු ගත නොහැක්කේ ය.

6. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගත් දින සිට මාස හයක් ඇතුළත වැඩය නිම කළ යුතුය.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඇපයක් ඉදිරිපත් කිරීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ දැන්වූ කල්හි ඔහු එසේ කිරීමට අසමත් උවහොත් තැන්පත් මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ටෙන්ඩර්කරුගේ නමද රජයේ කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වීමටද ඉඩ ඇත.

8. චන්දිරිකාවැව ඉඩම් සංවර්ධන කාර්යාලයේදී 1970 අප්‍රේල් මස 23 දින පෙරවරු 11.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

9. ටෙන්ඩර්කරුවන් ර. වැ. දෙ/වාරිමාර්ග/අධ්‍යාපන හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අඩුම ගණනේ රු. 15,000 කට නො අඩු මුදලකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් විය යුතුයි. ටෙන්ඩර් කරුවන් විසින් මෙවැනි මුදලකට ලියා පදිංචි වූ බවට ටෙන්ඩර් ෆෝරම ඉල්ලීමේදී ඔප්පුකළ යුතුය.

10. මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවගීයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුය. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ අය අතුරෙනි.

11. ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය හා ටෙන්ඩරයේ යම් කොටසක් පමණක් බාර ගැනීමේ බලය චන්දිරිකාවැව ඉඩම් සංවර්ධන නිලධාරි සතුවේ.

12. වැඩි විස්තර සඳහා චන්දිරිකාවැව ඉඩම් සංවර්ධන නිලධාරි ගෙන් විමසන්න.

කේ. ඒ. එස්. විජේවර්ධන,
ඉඩම් සංවර්ධන නිලධාරි,
චන්දිරිකාවැව.

ඉඩම් සංවර්ධන කාර්යාලය,
චන්දිරිකාවැව, පදලංගල,
කහවත්ත,, 1970.3.17.

4–241—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

## රාජකීය ලංකා ගුවන් හමුදාව

### සාමාන්‍ය පාවිච්චිය සඳහා "ගැජ් බෙඩ්" වර්ගයේ ලියවන පට්ටලයක් සැපයීම

රාජකීය ලංකා ගුවන් හමුදාවට සාමාන්‍ය පාවිච්චිය සඳහා "ගැජ් බෙඩ්" වර්ගයේ ලියවන පට්ටලයක් සියලුම උපකරණ සමග ලඟ ඇති තොගයෙන් සැපයීම සඳහා කොළඹ-2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 මැයි මස 8 වැනි දින පෙරවරු 10 තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් ලබා ගැනීමට ප්‍රථම, කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරි වෙත, නැවත ලබා ගත හැකි රු. 150ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබාගත යුතුයි. 1970 මැයි මස 7 වැනි දින දහවල් 12 තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. වැඩි විස්තර කොළඹ 2, ගුවන් හමුදා මූලස්ථානයෙන් දැනගත හැක.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාෂල්,
ගුවන් හමුදාධිපති.

1970 අප්‍රේල් මස 3 වැනි දා.

4–372—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

## ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් දැන්වීමයි

කොළඹ 5, කිරුළ පාරේ අංක 200 දරණ ස්ථානයෙහිවූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍රිකා 1970 මැයි 15 වෙනි දින පෙරවරු 10 වන තෙක් දේශීය සපයුම්කරුවන්ගෙන් බාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රිකා නියමිත ලෙස ලියා අනු පිටපතකින් ද යුතුව එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ 5, කිරුළ පාරේ අංක 200 ස්ථානයෙහි වූ මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරී තැන වෙත මුදලින් රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තබා ඒ සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සිය මාගේ කාර්යාලය වෙත 1970 මැයි 14 වෙනි දින පෙරවරු 12 ට පෙර ඉදිරිපත් කළ විටය. වැඩි විස්තර මාගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරී තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

200, කිරුළ පාර,
කොළඹ 5.

4–398—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**ගම්පහ උප කොටස**

අළුත්ඇල ගල්වාන අමුණ තැනීම සඳහා ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දිනය 1970.4.16 දින දක්වාත් ටෙන්ඩර් පෝරම නිකුත් කිරීමේ දිනය 1970. 4. 12 දක්වාත් දීර්ඝ කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර 1970. 4. 16 දින දවල් 11 ට හෝ ඊට ප්‍රථම බටහිර කොටසේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ලැබෙන සේ එවිය යුතුය. අනෙකුත් සියලුම කොන්දේසි 1970. 3. 13 දින අංක 14,897 දරණ රජයේ ගැසට් පත්‍රයේ සඳහන් මෙම කාරණය සම්බන්ධව ගැසට් නිවේදනයේ සඳහන් පරිදි වේ.

ජෝ. පරමදාස්,
වාරිමාර්ග ඉංජිනේරු,
ගම්පහ උප කොටස.

1970. 3. 31 දින,
ගම්පහ වාරිමාර්ග කාර්යාලයේදීය.

4–358—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**ආරෝහන වාරිමාර්ග ව්‍යාපාර උදෙසා උපකරණ හා ද්‍රව්‍ය සැපයීම**

කොළඹ තැ. පෙ. අංක 500, ඉඩම් වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් වර්ෂ 1970, ජූලි මස දහතුන් වන සඳු දින උදේ 10 වන තෙක් ආරෝහක වාරිමාර්ග ව්‍යාපාර උදෙසා උපකරණ හා ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

කොළඹ, බුලර්ස් පාරේ පිහිටි වාරිමාර්ග අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් පෝර්ම් කොල ලබාගෙන ටෙන්ඩර් අයදුම් පත්, අනු පිටපතක් ද සහිතව එවිය යුතුය.

ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 250 ක් කොළඹ, බුලර්ස් පාරේ, වාරිමාර්ග අධ්‍යක්ෂගේ කායඝලයයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ලබාගෙන ඉදිරිපත් කළ විට, වර්ෂ 1970, ජූලි මස නව වන ගුරු දින තෙක් ටෙන්ඩර් පෝර්ම කොල නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර, කොළඹ, බුලර්ස් පාරේ, වාරිමාර්ග අධ්‍යක්ෂගේ කායඝලයෙන් ලබාගත හැක.

ආර්. ඇස්. තර්මානන්දර්,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

වාරිමාර් දෙපාර්තමේන්තුව,
මුලර්ස් පාර,
කොළඹ 7,
1970 අප්‍රේල් මස 2 වැනි දිනදීය.

4–400—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**ප්‍රයෝජනයට ගත නොහැකි මෝටර් රථවාහන මිලදී ගෙන ඉවත්කර ගැනීම**

ඉහත සඳහන් මිලදී ගැනීම පිළිබඳව 1970.4.3 දින ගැසට් පත්‍රයේ 1 වැනි කොටසේ දෙවන ඡේදයේ පළවූ ගැසට් නිවේදනයෙහි 3 වන ඡේදයේ සඳහන් ටෙන්ඩර් තැන්පත් මුදල් මෙසේ ය:

(අ) විෂය අංක 1 සිට 15 සඳහා: ටෙන්ඩර්කරු ඉල්ලීමට කැමති එක් එක් විෂයකට රුපියල් 50 බැගින්,

(ආ) විෂය අංක 16 සිට 52 සඳහා: ටෙන්ඩර්කරු ඉල්ලීමට කැමති එක් එක් විෂයකට රුපියල් 100 බැගින්.

ආර්. එස්. තර්මානන්දර්,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 7.
1970 අප්‍රේල් මස 3 වන දිනදී ය.

4–363—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

කොළඹ 7 ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන් විසින් මරදානේ විශුද්ධසියා ගබඩාවට පහත සඳහන් හොඳ පරත හිස් ගෝනි සැපයීම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර්පත් 1970 අප්‍රේල් 26 වැනි ඉරිදා ප. ව. 2.30 වනතෙක් භාරගනු ලැබේ.

බුසල් 2 1/2 (දෙකහමාර) ගෝනි 1,00,000 හාල් මැනීමට
බුසල් 3 1/2 (තුනහමාර) ගෝනි 1,00,000 වී මැනීමට.

2. කොළඹ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 60 හෝර්ටන් පෙදෙස කාර්යාලයේ ගණකාධිකාරි තැනට හෝ දිවයිනේ කච්චේරියකට රු. 200 ක තැන්පත් මුදලක් ගෙවා ලබාගත්තා ලද කුවිතාන්සියක ඉදිරිපත්කර, 1970 අප්‍රේල් 26 වැනි ඉරිද දවල් 12 වන තෙක් නිකුත් කරනු ලබන ටෙන්ඩර්පත් ලබාගෙන අනුපිටපතක් ද සහිතව පුරවා එවිය යුතුයි.

3. වැඩි විස්තර පහත සඳහන් කාර්යාලයෙන් හෝ විශුද්ධසියා ගබඩාවේ ගණකාධිකාරි තැනගෙන් විමසා දැනගත හැක.

වී. ති. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1970 අප්‍රේල් 3 දින,
කොළඹ 7.

4–365—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## මහජන බැංකුව

**හෝමාගම මහජන බැංකු ශාඛා ගොඩනැගිලි ඉදි කිරීම**

හෝමාගම මහජන බැංකු ශාඛා ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා පිළිගත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

පසුගිය වසර දෙක ඇතුළත රු. 2,00,000 ක් හෝ ඊට වැඩි අගය ඇති තනි ගොඩනැගිල්ලක් සතුටුදායක ලෙස නිම කළ බවට සාක්ෂි, වරලත් ගෘහ නිර්මාණ ශිල්පීන් වන ෆ්‍රෑන්ක් එස්. පීරිස් වෙත ඉදිරිපත් කිරීමට ටෙන්ඩර්කරුවන් සමර්ථ විය යුතුය.

ගෘහ නිර්මාණ ශිල්පීන් වෙත සුදුසුකම් පිළිබඳව සාක්ෂි, සතුටුදායක ලෙස ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් කොළඹ 7, විජේරාම මාවතේ, අංක: 25 ඒ, දරණ ස්ථානයේ ෆ්‍රෑන්ක් එස්. පීරිස් ගෘහනිර්මාණ ශිල්පීන් විසින් 1970 අප්‍රේල් මස 16 දින සිට 1970 අප්‍රේල් මස 25 දක්වා කාර්යාලයීය වේලාවලදී ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. අඟල් 1/8" පරිමාණ සැලසුම්, ප්‍රමාණාත්මක සැලසුම්, සවිස්තර සැලසුම් සහ සම්භාර බිල්පත් වෙනුවෙන් රු. 50 ක ටෙන්ඩර් ගාස්තුව ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය. මෙම මුදල ආපසු දෙනු නොලැබේ. විස්තර සැලසුම් ලබා ගැනීමට කැමති අය අමතර රු. 50 ක ගාස්තුවක් ගෙවා ගෘහ නිර්මාණ ශිල්පීන් ගෙන් ඒවා ලබා ගත යුතුය.

කොළඹ 7, විජේරාම මාවතේ, අංක: 27 දරණ ගොඩනැගිල්ලේ පිහිටි පරිශ්‍ර දෙපාර්තමේන්තුවේදී කාර්යාලයීය වේලාවන්හි මෙම ගොඩනැගිලි පිළිබඳ සවිස්තර සැලසුම් පත් ඇතුළත් සියලුම සැලසුම් පත් හා බිල්පත් යනාදිය කොන්ත්‍රාත්කරුවන්ට අවශ්‍ය වේ නම් බලා ගත හැකි.

කොන්ත්‍රාත්තුව භාර දෙනුයේ මුලු මුදලකටය. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමති අය ටෙන්ඩර් පත් භාර දීමට පෙර ගොඩනැගිලි ඉදි කරන ස්ථානය පරීක්ෂා කරනු ඇතැයි බලාපොරොත්තු වන අතර, කොන්ත්‍රාත්තුව භාර ගත් දිනයේ සිට මාස 12 ක් ඇතුළතදී සියලුම කොන්ත්‍රාත් වැඩ නිම කොට භාර දීමට කොන්ත්‍රාත්කරුවන් සූදානම්ව සිටිය යුතුය.

සියලුම ටෙන්ඩර්පත් හෝ ඕනෑම ටෙන්ඩර්පතක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව සතුය.

"හෝමාගම මහජන බැංකු ගොඩනැගිලි ඉදි කිරීම සඳහා ටෙන්ඩර් පත" යනුවෙන් සඳහන් කොට මුද්‍රා තැබූ ටෙන්ඩර්පත් කොළඹ 7, විජේරාම මාවතේ, අංක: 27 දරණ ස්ථානයේ මහජන බැංකුවේ සැපයීම් හා පරිශ්‍ර නිලධාරි වෙත 1970 මැයි මස 6 දින පස්වරු 4.30 ට පෙර ලැබිය යුතුය.

සැපයීම් හා පරිශ්‍ර නිලධාරි.

මහජන බැංකුව,
27, විජේරාම මාවත,
කොළඹ 7.
1970 මාර්තු මස 31 දිනදීය.

4–354—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

යොමු අංකය : 327

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

කුරුණෑගල් දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1970 අප්‍රේල් 30 වෙනි දින පස්වරු 2.30 දක්වා කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

| වැඩෙහි ස්වභාවය | ලියාපදිංචි විය යුතු මුදල |
| --- | --- |
| (1) කුලියාපිටිය ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ ගල්පොල කොළණී පාර ... | රු. 20,000 |
| (2) බිංගිරිය ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ වෙල්ලන්ගිරිය ම.ප. ඉඩම්වලට පිවිසෙන පාර ... | රු. 20,000 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට කොන්ත්‍රාත්කරුවන් වශයෙන් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අයට 1970 අප්‍රේල් මස 26 වෙනි දින දහවල් 12 වනතෙක් කුරුණෑගල දිසාපති කාර්යාලයේ දී ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් ෆෝර්ම අපේක්ෂකයින් විසින් කුරුණෑගල දිසාපති කාර්යාලයේ අදාල වැඩය වෙනුවෙන් රුපියල් 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් කුරුණෑගල දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුලත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවල වද, එක් එක් වැඩය සඳහා මුදල් ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචි වී තිබේ නම්, මෙකී වැඩ සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැකිය. ටෙන්ඩර් තැන්පත් මුදල ගෙවීමෙන් අනුමත කරන ලද සමිති නිදහස් ය. එහෙත්, ඉහත සඳහන් මුදල් ප්‍රමාණයට ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒවාට ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩර් ෆෝර්ම සම්පූර්ණකර, පිටපත් දෙකකින් යුතුව ලේඛන ගත තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ උඩ වම් කෙලවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුය. ටෙන්ඩර් ෆෝරම තැපෑලෙන් නොඑවන්නේ නම්, ගාලු මුවදොර, මහ ලේකම් කාර්යාලයේ, අංක 357 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුය.

5. 1970 අප්‍රේල් මාසයේ 30 වෙනි දින පස්වරු 2.30 ට, ඉහත කී අංක 357 දරණ කාමරයේ දී ටෙන්ඩර් ෆෝරම විවෘත කරනු ලැබේ.

6. තමන්ගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියකින් දැන්වූ පසු දින 10 ක් ඇතුලත ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හා ඇප තැබීමට අපොහොසත් වුවහොත්, ඔහු විසින් ටෙන්ඩර් ෆෝරමය සඳහා තැන්පත් කරන ලද මුදල් රාජ්‍ය සන්තක කරනු ලැබේ.

7. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවා ගැනීමට, පුහුණු නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩ කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

8. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු කුරුණෑගල දිසාපති ගෙන් දැනගත හැකිය.

ඇස්. අමරසිංහ,
කුරුණෑගල දිසාපති වෙනුවට.

1970 අප්‍රේල් මස 17 වෙනි දින,
කුරුණෑගල දිසාපති කාර්යාලයේ දීය.

4–356—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### විල්ගමුව බෝගහවැව සංචාරක බංගලාවට විදුලි බලය සහ ජලය සැපයීම

වර්ෂ 1970 මැයි මස 10 වෙනි දින පස්වරු 2.30 දක්වා මෙහි ඉහත සඳහන් වැඩය සඳහා කොළඹ 1, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය. නැතහොත් ගාලු මුවදොර මහ ලේකම් කාර්යාලයේ 3 වැනි මාලයේ අංක 357 දරණ කාමරයේ තබා ඇති පෙට්ටියේ බහා ලිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර, මාතලේ දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන්, 1970 මැයි මස 5 වෙනි දින පෙරවරු 10.30 වන තෙක් ලබාගත හැක. මෙසේ ලබා ගන්නා ටෙන්ඩර් ෆෝර්ම හැර වෙනත් ටෙන්ඩර් ෆෝර්මවලින් ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර හා ටෙන්ඩර් දැන්වීමේ සඳහන්ව ඇති කොන්දේසිවලට අනුකූල නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ ඉඩම් කොමසාරිස් කාර්යාලයේ හෝ ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් 100 ක් තැන්පත් කර ඒ වෙනුවෙන් ලබා ගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැකිය. ටෙන්ඩර් ෆෝර්ම පිටපත් දෙකකින් යුක්තව එවිය යුතු අතර, එසේ එවනු ලබන ටෙන්ඩර් පත්‍ර මුද්‍රා තබන ලද කවරයක බහා එවිය යුතුයි. ලියුම් කවරයේ වම් කෙළවරේ ටෙන්ඩරයේ නම සඳහන් කළ යුතුයි.

5. තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු විසින් පිළිගත් ටෙන්ඩර් පත්‍රයේ මුළු මුදලින් සියයට 5 ක මුදලක් ඇප වශයෙන් තැබිය යුතුයි. එසේම ටෙන්ඩර්කරු විසින් තම ටෙන්ඩරය පිළිගත් බවට දැනුම් දීමෙන් දින හතක් ඇතුළතදී වැඩ ගිවිසුමක් අත්සන් කිරීමට සූදානම්ව සිටිය යුතුයි. ටෙන්ඩරය බාරගත් බවට සඳහන් වන ලියවිල්ල ඔහුට පුද්ගලිකව භාර දීමෙන් හෝ ඔහු විසින් දී ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවීමෙ... හෝ ඔහුට ඒ බැව් දැන්වූ බව පිළිගන්නවා ඇත. මෙසේ දැනුම් දීමෙන් පසුව ගිවිසුම්පත්‍රය අත්සන් තැබීම අපසඳු කළහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ.

6. කිසිදු හේතුවක් නොදක්වා සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමට හෝ ඕනෑම ටෙන්ඩරයක් හෝ ටෙන්ඩරයක කොටසක් පිළිගැනීම හෝ ටෙන්ඩර් මණ්ඩලය සතුය.

7. මාතලේ දිසාපති තැනගෙන් අවසරයක් නොලබා වැඩ ගිවිසුම් පත්‍රය වෙන අයෙකුට පැවරීමට හෝ භාරදීමට හෝ පුළුවන් කමක් නැත. එසේම පත්කරනු ලබන ටෙන්ඩර්කරු වැඩය කරන ප්‍රදේශයේ අවශ්‍යතාවයේ හැටියට පුහුණු හෝ නුපුහුණු හෝ ලාංකික කම්කරුවන් සේවය සඳහා යෙදවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍ර ලබා ගත හැක්කේ ලියාපදිංචි කළ කොන්ත්‍රාත්කරුවන්ට ඔවුන්ගේ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කිරීමෙන්ය. ලියාපදිංචි නොවූ අය තමාට රු. 25,000 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් කිරීමට හැකියාවක් ඇති බවට ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගෙන් සහතිකයක් ඇතිව පැමිණිය යුතුයි.

9. ලියාපදිංචි සමූපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිතිවලට ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අවශ්‍ය නැත. නමුත් සමිති ලියාපදිංචි කළ බවට හා වැඩය භාරගෙන කිරීමට හැකියාවක් ඇති බවටද ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රදේශීය නිලධාරීන් ගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. තවද, වැඩය බාරගෙන කිරීමට සතුටු බව ප්‍රකාශ කරන සමිතියේ සම්මත කරගත් වාර්තාවක පිටපතක් ද ඉදිරිපත් කළ යුතුයි.

10. වැඩි විස්තර අවශ්‍ය නම් මාතලේ දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් ලබාගත හැක.

ජේ. ඇම්. ජී. සී. ජයසුන්දර,
මාතලේ දිසාපති වෙනුවට.

1970. 3. 31 වැනි දින,
මාතලේ දිසාපති කාර්යාලයේ දීය.

4–357—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

**1969/70 මුදල් වර්‍ෂයේ කිලිනොච්චි පොහොර ගබඩාවේ සිට පූනකරි පොහොර ගබඩාවට පොහොර ප්‍රවාහණය සඳහා මිළ ගණන් කැඳවීම**

යථෝක්ත සේවය සඳහා මිළ ගණන්, 1970 මැයි මස 2 වන දින පස්වරු 2.30 දක්වා යාපනයේ, ගොවිජන සේවා සහකාර කොමසාරිස් විසින් භාරගනු ලැබේ. සේවය පිළිබඳ වූ උපලේඛන, මගේ කාර්යාල යෙන්, පෞද්ගලිකව පැමිණ හෝ තැපැලෙන් 1970 මැයි මස 2 දින දහවල් 12ට පෙර ලබා ගත යුතු වේ.

2. මිළ ගණන් දෙපිටපතකින් යුතුව ලේඛනගත තැපැලෙන් යාපනයේ ගොවිජන සේවා කොමසාරිස්ට එවීම හෝ එම කාර්‍යය සඳහා ඔහුගේ කාර්‍යාලයේ තබා ඇති පෙට්ටියේ බහාලීම හෝ කළ යුතු වේ. එම මිළ ගණන් එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙලවරේ " පොහොර ප්‍රවාහන සේවය සඳහා මිළ ගණන් " යනුවෙන් සඳහන් කර තිබිය යුතු වේ.

3. මිළ ගණන්, මිළ ගණන් භාර ගැනීමේ අවසාන දිනයේ සිට මසක් තුළ වෙනස් නොවන ඒවා විය යුතුය.

4. වැඩි විස්තර යාපනයේ, ගොවිජන සේවා සහකාර කොමසාරිස් ගෙන් දැනගත හැක.

ක. සභාරත්නම්,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
යාපනය දිස්ත්‍රික්කය.

1970 අප්‍රියෙල් මස 1 දින,
යාපනයේ,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේදී ය.

4-359—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**බොරලන්ද ගොවිපලෙහි—3 බී වර්ගයේ නිවාසයක් හා ගවමඩුවක් සෑදීම**

ඉහත සඳහන් ගොඩනැගිල්ල තැනීම සඳහා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970. 5. 10 වැනි දින පස්වරු 2.30 වනතුරු ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. කොළඹ 5, නාරාහේන්පිට, පලතුරු කම්හල පාරේ, සිවිල් ඉංජිනේරු අංශයේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි පෝරම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරු ද ලබා ගත හැකිය.

**3. ටෙන්ඩර්කරුවන් රු. 85,000 කට නොඅඩු ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ දෙපාර්තමේන්තුවක ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් විය යුතුය.**

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ විට 1970. 4. 25 වැනි දින ප. ව. 4 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ:—

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියා පදිංචි කිරීමේ ලියවිල්ලක්.

(ආ) රුපියල් 100ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල, පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්‍ෂකවරයාගේ අංක 37 දරණ ගිණුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්‍ෂ වෙනුවට.

1970. 4. 1 දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
සිවිල් ඉංජිනේරු කාර්යාලය,
පලතුරු කම්හල පාර,
නාරාහේන්පිට,
කොළඹ 5.

4-352—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**ගොවිපලවලට වතුර පොම්ප සැපයීම**

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩල යේ සභාපතිතැන විසින් 1970 මැයි මස 3 වෙනි දින ප. ව. 2.30 දක්වා පහත සඳහන් ගොවිපලවලට වතුර පොම්ප සැපයීම සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ. ඒ ඒ ගොවිපලවලට අවශ්‍ය වතුරු පොම්ප පිළිබඳ විස්තර මෙහි පහත සඳහන් වේ:—

### ඒ ඒ ගොවිපලට අවශ්‍ය වතුර පොම්ප පිළිබඳ විස්තර

| ගොවිපලේ නම | අවශ්‍ය වතුර පොම්පයේ විස්තර |
|---|---|
| බීජ අර්තාපල් ගොවිපල රහංගල-බොරලන්ද | අශ්ව බල 5කින් යුත් පැයකට වතුර ගැලොම් 2,500 ක් පොම්ප කර දිය හැකි අඩි 100 ක් උසට වතුර ඇද දිය හැකි අඩි 2,500න් ඈතට වතුර පොම්ප කර දිය හැකි වතුර පොම්පයක් විය යුතු අතර, සමතල රාමුවක් තුල සවිකළ හැකි ඩීසල් ඇන්ජිමකින් යුත් වතුර පොම්පයක් විය යුතුය. නියමිත පූට් වැල්වය දිය පෙරනය හා උපදෙස් පොතකින් යුක්ත විය යුතුය. |
| බිඳුණුවැව ගොවිපල, බණ්ඩාරවෙල | විදුලි බලයෙන් ක්‍රියා කරන අශ්ව බල 5කින් යුත්, මුළු ශීර්ෂය 150 කින් යුත්, වතුර පොම්පයක් විය යුතු අතර, පූට් වැල්වය සහිත නලයකින් හා උප දෙස් පොතකින් යුක්ත විය යුතුය. |
| මීපිලිමාන ගොවිපල බ්ලැක් පූල් (බීජ අර්තාපල් ගොවිපල) | අශ්ව බල 5කින් හෝ 8කින් යුත් ඩීසල් හෝ භූමි තෙලෙන් ක්‍රියා කරන පැයකට වතුර ගැලොම් 1,500 සිට 2,000 දක්වා ඇද දිය හැකි වතුර පොම්පයක් විය යුතු අතර, අඩි 25ක් ගැඹුරින් වතුර ඇද දිය හැකි වූද, අඩි 125 සිට අඩි 150 දක්වා උසට වතුර ගෙන යාමේ හැකියාව ඇති පොම්පයක් විය යුතු අතර, පූට් වැල්වය සහිත නලයකින් හා දිය පෙරනයකින් ද උපදෙස් පොත කින් ද යුක්ත විය යුතුය. |
| බීජ අර්තාපල් ගොවිපල, කඳපොල | අශ්ව බල 5 කින් යුත් මුළු ශීර්ෂය අඩි 300 කින් යුක්ත වූද, පැයකට වතුර ගැලොම් 8,000 ක් පමණ ඇද දිය හැකි වූද, ඩීසල් හෝ භූමි තෙලෙන් ක්‍රියා කරවිය හැකි ඇන්ජිමකින් යුත් වතුර පොම්පයක් විය යුතුය. පූට් වැල් වය සහිත නළයකින් ද, අමතර කොටස් වලින් ද, උපදෙස් පොතකින් ද යුක්ත විය යුතුය. |
| බීජ අර්තාපල් ගොවිපල, සීතාඑළිය-නුවරඑළිය | අශ්ව බල 15 කින් යුත් පෙට්‍රල් වර්ගයේ වතුර පොම්පයක් විය යුතු අතර, අඩි 125 ක් උසට වතුර ඇද දිය හැකි වූද, අඟල් 2½ ඇද ගැනීමේ හා පිට කිරීමේ හැකියාවක් ඇති වතුර පොම්පයක් විය යුතු අතර, පූට් වැල්වය සහිත නළයකින් හා දිය පෙරනයකින් ද උපදෙස් පොතකින් ද යුක්ත විය යුතුය. |
| බීජ අර්තාපල් ගොවිපල, හෝටන් තැන්න-ඔහිය | අශ්ව බල 10කින් යුත් ඩීසල්වලින් ක්‍රියා කරන ඇන්ජිමකින් යුත්, පිස්ටන් පම්ප් ඉන්ලට් අවුට්ලට් 3″ පයිප්ප සහිත දිය උරා ගැනීම අඩි 25 කින් යුත් දිය පිට කිරීම අඩි 100 කින් යුත් සිලින් ඩර් බකට් 4″ කින් යුත් වතුර පොම් පයක් විය යුතු අතර, පූට් වැල්වය සහිත නළයකින් හා දිය පෙරනය කින් ද උපදෙස් පොත්කින් ද යුක්ත විය යුතුය. |

2. බණ්ඩාරවෙල ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරි පාලන නිලධාරිතැනගෙන් පෝරම් කොළ ලබා ගෙන ඒවායේ ටෙන්ඩර් එවිය යුතුය. සියළුම ටෙන්ඩර් අනුපිටපතකුත් සමග කවරයේ බහා සීල් තබා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තු වේ අධ්‍යාපන හා ගොවිපල් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති නමට එවිය යුතුය. එම ලිපි කවරයේ ඉහළින් ටෙන්ඩරයේ කාරණය ලියා එවිය යුතුය.

3. ටෙන්ඩර් ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. නැතහොත් ටෙන්ඩර්කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැනට අතින්ම භාර දිය හැක.

4. ලියාපදිංචි තැපැලෙන් එවන ලද ටෙන්ඩර් ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම ටෙන්ඩර්කරුවන්ට දැනුම් දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීමට නියමිත දිනසිට දින හතරක් (4) ඇතුලත යම් ටෙන්ඩර්කරුවෙකුට මෙවැනි දැන්වීමක් නොලැබුණහොත් පේරාදෙනියේ කෘෂිකම් දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන හා ගොවිපල් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුය.

5. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදී ඉහත සඳහන් සියළුම ගොවිපල වලට අවශ්‍ය වතුර පොම්ප සැපයීම සඳහා හෝ එක ගොවිපලකට හෝ ගොවිපලවල් කීපයකට වතුර පොම්ප සැපයීම සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක.

6. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දින දවල් 12 වන තුරු ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. මෙම පෝර්ම ලබා ගැනීම සඳහා එක් එක් පෝරමය වෙනුවෙන් රු. 50 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. මෙම තැන්පත් කිරීම ඕනෑම දිසාපති කාර්යාලයක හෝ කෘෂිකර්ම දෙපාතීමේන්තුවේ පේරාදෙනියේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹ යෝක් වීදියේ පිහිටි ලංකා බැංකුවේ අංක 37 දරන කෘෂිකම් අධ්‍යක්ෂකගේ ගිණුමට හෝ කළ හැකිය. ලංකා බැංකුවේ මුදල් තැන්පත් කරන විට පොදු ආකෘති පත්‍ර 118 වැන්න සම්පූර්ණ කර බැංකුවට භාර දිය යුතුය.

7. පොරොන්දු පත්‍ර අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ. තෝරා ගත් ටෙන්ඩර්කරුවාට ඒ බැව් දන්වා දින 10ක් ඇතුළත අවශ්‍ය ඇපය තැබීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජ සන්තක වනවාත් හැර ඔහුගේ නම කොන්ත්‍රාත් කඩ කළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් කිරීමටද සිදුවනවා ඇත.

8. නියමිත පෝර්මයේ ලියා නැති හෝ නියමිත කොන්දේසි ඉටු වී නැති හෝ කිසිම ටෙන්ඩරයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් හා ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ඉලක්කමෙන්ද අකුරින්ද සඳහන් කළ යුතුය. යම් කිසි වෙනසක් කළහොත් ඒ ඒ තැන්වල ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන තැබිය යුතුය.

9. ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ටෙන්ඩර් පත්‍රයේ පැහැදිලිව ලිවිය යුතුය.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද, පිළිගනු ලැබුවා වූද, දේවල මුළු වියදමින් සියයට පහක (5%) ඇප මුදලක් තැන්පත් කිරීමටත්, පොරොන්දු පත්‍රය අත්සන් කිරීමටත්, තෝරාගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මෙම මුදල් ආපසු දෙනු ලබන්නේ මෙම කොන්ත්‍රාත්තුව නිසියාකාර ඉටු කිරීමෙන් පසුවය. ටෙන්ඩර් කරුට මෙම කොන්ත්‍රාත්තුව නිසියාකාර ඉටු කිරීමට බැරි වුවහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වනවාත් හැර, ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුලත් කිරීමටද සිදුවනවා ඇත.

11. පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දර ගාස්තුව කොන්ත්‍රාත් කරු විසින් ගෙවිය යුතුය.

12. යම් කිසි ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය කෘෂිකම් අධ්‍යක්ෂවරයා වෙත තබා ගනී.

13. තෝරගන්නා ටෙන්ඩර්කරු විසින් ඒ ඒ ගොවිපලට අවශ්‍ය වතුර පොම්පය ගෙනගොස් භාර දිය යුතු අතර, ගොවිපල කළමනා කාරතැනට ක්‍රියාත්මක කර පෙන්විය යුතුය.

14. මේ සඳහා වැඩි විස්තර බණ්ඩාරවෙල ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ කෘෂිකම් නිලධාරිතැනගෙන් ලබා ගත හැක.

එම්. එල්. සී. ඉලංගකෝන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල්).

පේරාදෙනිය,
70.3.25.

4–250—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

අම්බලන්තොට රජයේ වී ගොවිපලේ කුඹුරු අක්කර 35 ක් (හී තුනාම) සී සෑම සඳහා මිළ ගණන් 1970.4.22 දින පස්වරු 2.30 දක්වා මාතර, ගොවිපල පාලන හා නිෂ්පාදන කායාීලයේ ටෙන්ඩර් මණ්ඩල යේ සභාපති විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පෝරම මාතර ගොවිපල පාලනය සහ නිෂ්පාදන කායාීලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති ගෙන් ලබාගෙන ඒවායේ ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් ද සහිතව ලියුම් කවරයක බහා, සීල් තබා, එහි මුදුන් වම් කොනේ " අම්බලන්තොට රජයේ වී ගොවිපලේ කුඹුරු අක්කර 35 ක් සී සෑම " යන්න ලියා, මාතර ගොවිපල පාලනය සහ නිෂ්පාදන කායාීලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත් විවෘත කිරීමට නියමිත දිනට පෙර දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. පෝර්ම නිකුත් කරනු ලබන්නේ එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මෙම මුදල් තැන්පත් කිරීම, ඕනෑම කච්චේරියක හෝ කොළඹ යෝක් විදියේ පිහිටා ඇති ලංකා බැංකු ශාඛාවේ අංක 37 දරණ කෘෂිකර්ම අධ්‍යක්ෂගේ ගිණුමට හෝ පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායාීලයේදී හෝ කළ යුතුය. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10 ක් ඇතුළත අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල් රාජසන්තක වනවාත් හැර, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්නට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත් රිජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත් රිජිස්ටර් තැපැලෙන් නොඑවන්නේ නම් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් මාතර, ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිට ඒවා අතින්ම භාරදිය යුතුයි. රිජිස්ටර් තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත් ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේම දන්වනු ලැබේ. 'යම් ටෙන්ඩර්කරුවකුට එවැනි දැන්වීමක් ටෙන්ඩර් පත් විවෘත කිරීමට නියමව තිබූ දින සිට දින 4 ක් ඇතුළත නො ලැබුණේ නම්, ඒ ගැන මාතර ගොවිපල පාලනය සහ නිෂ්පාදන කායාීලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති ගෙන් වහාම විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. ඉහත සඳහන් ටෙන්ඩර් භාරගැනීම නැවත් වීමට නියමිත වේලාවේදී, මාතර, ගොවිපල පාලනය සහ නිෂ්පාදන කායාීලයේදී ඒවා විවෘත කරනු ඇත.

6. නියමිත පෝර්මයේ ලියා නැති හෝ එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුව් නැති හෝ කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නො ලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර, ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතු ද වේ.

7. ටෙන්ඩර්කරුවන් විසින් තම ලිපිනය නිවැරදිව, පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයේ ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූ ද, පිළිගනු ලැබුවා වූ ද දේවල මුළු වියදමෙන් සියයට 5 ක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ ගේ නමින් තැන්පත් කිරීමට හා පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීම ටත් පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මෙම මුදල ආපසු දෙනු ලබන්නේ යථෝක්ත කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණි. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු නොකළහොත්, ඔහුගේ ඇප මුදල රාජසන්තක වනවා පමණක් නොව, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

9. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට, පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙන අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගනු ලබන්නේ, වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළැඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිත ලියවිල්ල කින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්තුකරුට බලය දිය හැක.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නො වන කම්කරුවන් යෙදවීම, තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.

මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූද, කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධ යෙන් දැනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියලුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත් කරු මෙයින් එකඟ වෙයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චැක්රෝල් පොත්, පෙරේච්චු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂාකර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

10. පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින්ම ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

12. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය මාතර, ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත තබාගනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම් සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත් වූ තමාට සැහේ යැයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා විරුධත්වය පළ කරන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවට බැඳෙනු නොලැබේ.

14. වැඩි විස්තර, මාතර ගොවිපල පාලනය හා නිෂ්පාදන කාර්යාලයෙන් හා අම්බලන්තොට රජයේ ගොවිපල කළමනාකරුගෙන් ද දැනගත හැකිය.

ඇම්. ඇල්. සී. ඉලංගකෝන්,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1970 මාර්තු මස 31 දින,
පේරාදෙනියේ දීය.

4–327—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### වැලිසර ගොවිපලෙහි—ඌරු මඩුවක්

ඉහත සඳහන් ගොඩනැගිල්ල තැනීම සඳහා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970. 5. 10 වැනි දින පස්වරු 2.30 වනතුරු ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. කොළඹ 5, නාරාහේන්පිට, පලතුරු කම්හල පාරේ, සිවිල් ඉංජිනේරු අංශයේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි ෆෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරු ද ලබා ගත හැකිය.

3. ටෙන්ඩර්කරුවන් රු. 75,000 කට නොඅඩු ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ දෙපාර්තමේන්තුවක ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ විට 1970. 4. 25 වැනි දින ප. ව. 4 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ :—

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියා පදිංචි කිරීමේ ලියවිල්ලක්.

(ආ) රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල, පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂකවරයාගේ අංක 37 දරණ ගිණුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1970. 4. 1 දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
සිවිල් ඉංජිනේරු කාර්යාලය,
පලතුරු කම්හල පාර,
නාරාහේන්පිට,
කොළඹ 5.

4–351—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### මාරවිල ගොවිපලෙහි බිත්තර රක්කවන ගොඩනැගිල්ල

ඉහත සඳහන් ගොඩනැගිල්ල තැනීම සඳහා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970. 5. 10 වැනි දින පස්වරු 2.30 වනතුරු ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. කොළඹ 5, නාරාහේන්පිට, පලතුරු කම්හල පාරේ, සිවිල් ඉංජිනේරු අංශයේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි ෆෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරු ද ලබා ගත හැකිය.

3. ටෙන්ඩර් කරුවන් රු. 20,000 කට නොඅඩු ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ දෙපාර්තමේන්තුවක ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ විට 1970. 4. 25 වැනි දින ප. ව. 4 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ :—

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියා පදිංචි කිරීමේ ලියවිල්ලක්.

(ආ) රුපියල් 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල, පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂකවරයාගේ අංක 37 දරණ ගිණුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1970. 4. 1 දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
සිවිල් ඉංජිනේරු කාර්යාලය,
පලතුරු කම්හල පාර,
නාරාහේන්පිට,
කොළඹ 5.

4–350—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### අක්කරපත්තුවේ—පශු වෛද්‍ය බෙහෙත් ශාලාවක් ඉදි කිරීම

ඉහත සඳහන් ගොඩනැගිල්ල තැනීම සඳහා පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970.5.10 වැනි දින පස්වරු 2.30 වනතුරු ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. කොළඹ 5, නාරාහේන්පිට, පලතුරු කම්හල පාරේ, සිවිල් ඉංජිනේරු අංශයේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි ෆෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද ලබා ගත හැකිය.

3. ටෙන්ඩර්කරුවන් රු. 35,000 කට නොඅඩු ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ දෙපාතර්මේන්තුවක ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ විට 1970.4.25 වැනි දින ප. ව. 4 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ :—

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියා පදිංචි කිරීමේ ලියවිල්ලක්.

(ආ) රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක. 37 දරන ගිනුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1970.4.1 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
සිවිල් ඉංජිනේරු කාර්යාලය,
පලතුරු කම්හල පාර,
නාරාහේන්පිට,
කොළඹ 5.

4–349—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

## ලංකා උසස් කාර්මික විද්‍යායතනය—කටුබැද්ද

ලංකා උසස් කාර්මික විද්‍යායතනය අළුත්වැඩියා කිරීම සහ වැඩි දියුණු කිරීම සම්බන්ධව ටෙන්ඩර් පත්‍ර ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාර ගනු ලැබේ. අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේත්, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේත් රු. 20,000 කට වඩා වැඩි ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. ඉහත සඳහන් ගණන සඳහා අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේත්, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේත් ලියා පදිංචි වූ අනුමත කරන ලද සමිති වලට ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලය ඇත. අනුමත කරන ලද සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් යෙදීමෙන් නිදහස් කරනු ලැබේ. එහෙත්, ඉහත සඳහන් ගණන් වලට ලියාපදිංචි වී තිබෙන බවට සාක්ෂි ටෙන්ඩර් ආකෘති නිකුත් කිරීමට පෙර ඉදිරිපත් කළ යුතුය.

2. ටෙන්ඩර් පිටපත් දෙකකින් යුක්තව එකම කවරයේ සීල් තබා, සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, ලංකා උසස් කාර්මික විද්‍යායතනය, කටුබැද්ද, මොරටුව යන ලිපිනයට එවිය යුතුය.

3. ටෙන්ඩර් සියල්ලම ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. නැත හොත් ටෙන්ඩර්කරුගේ හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් සීල් තබන ලද ටෙන්ඩර් ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ ගණකාධිකාරී වෙත පුද්ගලිකව භාර දී ඒ සඳහා රිසිට් පතක් ලබා ගත යුතුයි.

4. ටෙන්ඩර් සියල්ලම "ලංකා උසස් විද්‍යායතනයේ ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම් සහ වැඩි දියුණු කිරීම්" යනුවෙන් කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ ලකුණු කොට මුද්‍රා තබන ලද ඒවා විය යුතුයි. එම ටෙන්ඩර් 1970 මැයි මස 10 වෙනි දින උදේ 10 ට පෙර ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ලැබිය යුතුයි.

5. 1970 මැයි 5 වෙනි දින දවල් 12 දක්වා ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂගෙන් ලබාගත යුතු ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කල යුතුයි.

6. එහි සඳහන් කරන ලද කොන්දේසිවලට අනුකූලව අනුමත කරන ලද ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරන ලද ටෙන්ඩර් කිසිවක් සැලකිල්ලට භාජනය කරනු නො ලැබේ.

7. ටෙන්ඩර් වල වෙනස් කිරීම් සහ මැකීම් වලට ටෙන්ඩර් කරුවන් විසින් කෙටි අත්සන් යෙදිය යුතුයි.

8. ටෙන්ඩර් ආකෘති නිකුත් කිරීමට පෙර ඒ සඳහා රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂතුමාගේ කාර්යාලයට ගෙවා රිසිට් පතක් ලබාගෙන එය ඉදිරිපත් කල යුතුයි. චෙක්පත් සහ මුදල් ඇණවුම් ආදිය භාරගනු නො ලැබේ. ටෙන්ඩර් පත් ලබාගෙන ටෙන්ඩර් ඉදිරිපත් නොකරන ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල් ආපසු ගෙවනු නොලැබෙන අතර, ඒවා රජයේ ආදායමට බැර කරනු ලැබේ.

9. තමාගේ ටෙන්ඩරය පිළිගත් බව ලිපියකින් දැනුම් දී දින 10ක් ඇතුළත ටෙන්ඩර්කරුවෙකු විසින් කොන්ත්‍රාත්තුවට ඇතුළත් වීම හෝ අනුමත කරන ලද ඇපය තැන්පත් කිරීම හෝ පැහැර හරිනු ලැබුවහොත් ඔහුගේ තැන්පත් මුදල් රාජසන්තක කරනු ලැබේ. ටෙන්ඩරය පිළිගත් බවට කරනු ලබන දැන්වීම ලේඛණගත තැපෑලෙන් ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද ලිපිනයට තැපැල් කර ඇත්නම් හෝ එම ලිපිනයෙහි තබා ඇත්නම්, ටෙන්ඩරය පිළිගත් බවට එසේ කරන දැන්වීම සෑහෙන ලෙස සලකනු ලැබේ. කොන්ත්‍රාත්තුව අත්සන් කරනු ලැබූ පසුව හෝ හැකිනම් ඊට පෙර අසාර්ථක වූ ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

10. කොන්ත්‍රාත්තුවට අවශ්‍ය ඇප මුදල් ටෙන්ඩර් මුදලෙන් සියයට 5 කි. මෙය මුදලෙන් ගෙවිය යුතුයි.

11. කිසියම් ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් කිසිම හේතුවක් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සහ ටෙන්ඩරයක කිසියම් කොටසක් පමණක් පිළිගැනීමේ අයිතියද ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෙතම රඳවා ගනු ඇත.

12. ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂගේ අනුමැතිය නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් අනිකෙකුට පැවරීම හෝ කුලියට දීම කල නොහැකිය. කොන්ත්‍රාත් කරු විසින් කොන්ත්‍රාත්තුවේ සඳහන් කටයුතු කරගෙන යාම සඳහා අන් අයෙකුට පවරන ඇටෝර්නි බලය පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය රජය වෙත තබාගනු ලැබේ.

13. තමාට ඒත්තු යන සෑහෙන කාරණා ඇතොත් තම දැන්වීමේ සඳහන් කරන ලද අය සේවයේ යොදවා ගැනීමට සිය විරෝධය ලිඛිත දැන්වීමකින් කොන්ත්‍රාත්කරු වෙත ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂ විසින් දන්වනු ලැබේ. එවැනි දැන්වීමක සඳහන් අය කොන්ත්‍රාත්කරු විසින් සේවයේ නො යෙදිය යුතුයි.

14. අනිකුත් දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත්තු කටයුතු කරන ලද ටෙන්ඩර් කරුවන් විසින් එවැනි දෙපාර්තමේන්තුවල නම් සහ තම සේවය කරන ලද දිස්ත්‍රික්කය සඳහන් කල යුතුයි.

15. 1970 මැයි 11 වැනි දින උදේ 10.30 ට ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂගේ කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට එහි සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් එහි පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියේ ටෙන්ඩර් ඉදිරිපත් කල අයගේ නම් ද, ටෙන්ඩරයේ මිල ගණන් වල එකතුවද කියවනු ලැබේ. ටෙන්ඩර් පිළිබඳ වෙන කිසියම් විස්තරයක් සඳහන් නො කරනු ලැබේ.

16. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් විසින් ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂ සමග කොන්ත්‍රාත්තුවකට ඇතුළත් විය යුතුයි. තෝරාගනු ලැබුවහොත් තමා විසින් ඇතුළත් විය යුතු කොන්ත්‍රාත්තු ආකෘතිය ටෙන්ඩර්කරු විසින් ප්‍රවේශමෙන් කියවා, පැහැදිලි කල යුතු කරුණක් ඇතොත් ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් එවැනි විස්තර ලබාගත යුතුයි. කොන්ත්‍රාත්තු ආකෘති ලංකා කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂගේ කාර්යාලයේදී පරීක්ෂා කළ හැකිය.

17. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන්කල දින සිට සති 6 ක කාලයක් ඉක්මයනතුරු සිය පිරිනැමීම්වල මිල ගණන් විවෘතව තැබිය යුතුයි.

18. ගොඩනැගිලි සැලැස්මවල් ආදිය පරීක්ෂා කිරීම ඇතුළුව අනිකුත් අවශ්‍ය විස්තර ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබාගත යුතුයි.

ඇල්. එච්. සුමනදාස,
අධ්‍යක්ෂ,
ලංකා උසස් කාර්මික විද්‍යායතනය.

1970 මාර්තු මස 24 වන දින,
ලංකා උසස් කාර්මික විද්‍යායතනය,
කටුබැද්ද-මොරටුව.

4–249—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව—කළුතර

1970 මැයි මස 2 වැනිදා පෙ. ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | | වැඩයේ ස්වභාවය |
|---|---|---|
| 1. ක/මහබෙල්ලන ක. වි. | ... | අළුත්වැඩියාව |
| 2. ක/කොහොලාන වි. | ... | අළුත්වැඩියාව |
| 3. ක/වේරගම වි. | ... | අළුත්වැඩියාව |
| 4. ක/පලන්නොරුව ම. වි. | ... | ජලය සැපයීම |
| 5. ක/මතුගම ශා. මරියා ම. වි. | | පාසැල් ගොඩනැගිල්ලක් තැනීම |
| 6. ක/අළුබෝමුල්ල ම. වි. | ... | විද්‍යාගාරය තැනීම |

සංලක්ෂය : ක=කළුතර දිස්ත්‍රික්කය.

2. කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ කළුතරින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ-2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කායාංලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් අංක 1 දරණ වැඩය සඳහා රු. 5,000 කට ද, අංක 2 සිට 4 දක්වා වැඩ සඳහා රු. 10,000 කට ද, අංක 5 දරණ වැඩය සඳහා රු. 20,000 කට ද, අංක 6 දරණ වැඩය සඳහා රු. 40,000 කට ද හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට 1970 අප්‍රේල් මස 30 වැනිදා ප. ව. 3.30 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘති අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති

අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යවේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කල යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළුම විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලා ගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත් ලියා පදිංචි තැපැලෙන් කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පුද්ගලිකව කළුතර අධ්‍යාපන කායඹාලයේ, කායඹාල සහකාර වෙත භාර දිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1970 මැයි මස 2 වැනි දා පෙ. ව. 10.30ට කළුතර අධ්‍යාපන කායඹාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේ දී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැණීම අවසන් කල දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කායඹාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කායඹාලයයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත් කරුවන්ගේ ලියා පදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරණ ලද ලියා පදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැමීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

වී. වීරවර්ධන,
කළුතර ප්‍රදේශයේ,
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 අප්‍රේල් මස 2 වන දින,
කළුතර අධ්‍යාපන කායඹාලයේ දී ය.

4–361—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### සහතික මිළ යෝජනා ක්‍රමය හා වී කෙටීම

කොළඹ එඩින්බරෝ චන්ද්‍රවංක අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, දැනට පිශුනිසියා ගබඩාවේ ඇති හොණ්ඩර 1,000 ක් පමණ රටකජු මිලදී ගෙනයාම සඳහා කැඳවන ටෙන්ඩර් 1970 මැයි 3 වැනි ඉරිදා දවල් 12 වනතෙක් භාරගනු ලැබේ.

2. දිවයිනේ කච්චේරියකට හෝ අංක 60 හෝටන් පෙදෙසේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී තැනට රු. 100ක තැන්පත් මුදල් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කර ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 42 එඩින්බරෝ චන්ද්‍රවංකයෙහි පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් 1970 මැයි 3 වැනි ඉරිදා ප. ව. 4 වනතෙක් නිකුත් කරනු ලබන ටෙන්ඩර් ලබාගෙන අනු පිටපතක් ද සහිතව පුරවා එවිය යුතුය.

3. වැඩි විස්තර පහත සඳහන් කායර්ාලයෙන් හෝ මරදානේ දුම්රියාංගණයෙහි පියුනිසියා ගබඩාවේ ගණකාධිකාරී තැනගෙන් විමසා දැන ගතහැක.

වී. තී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1970 අප්‍රේල් 3 වැනි දින,
කොළඹ 7, තැ. පෙ. 537,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේදීය.

4–370—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### ජෙපල්ස්පාර් සැපයීමේ ටෙන්ඩරය—අවසන් දිනය දීර්ඝ කිරීම

ඉහත සඳහන් සැපයීම සඳහා ඉදිරිපත් කරනු ලබන මුද්‍රා තැබූ ටෙන්ඩර් පත් භාර ගැනීමේ අවසන් දිනය, 1970.4.25 වන දින පස්වරු 4 දක්වා දීර්ඝ කර ඇත.

නැවත නොගෙවන රුපියල් 25 ක ටෙන්ඩර් ගාස්තුවක් හා නැවත ලබාගතහැකි රුපියල් 500 ක ටෙන්ඩර් ඇප මුදලක් තැන්පත් කිරීමෙන් පසු, පහත අත්සන් තබන අයගෙන් ටෙන්ඩර් ආකෘති පත් හා කොන්දේසි 1970.4.24 වන දින දහවල් 12 දක්වා ලබාගත හැක.

සැපයීම් කළමණාකරු.

ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය,
සැපයීම් සහ වාප්පු දෙපාතීමේන්තුව,
55, රොස්මිඩ් පෙදෙස,
කොළඹ 7.

4–399 1—දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### අපනයනය පිණිස පිඟන් භාණ්ඩ ඇසිරීම සඳහා කාඩ් බෝඩ් පෙට්ටි සැපයීම

කොළඹ 7, රොස්මිඩ් පෙදෙසේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී තැන විසින්, 1970 අප්‍රේල් මස 19 වන දින පස්වරු 4.30 දක්වා, ඉහත සඳහන් පෙට්ටි සැපයීම සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් පත් භාරගනු ලැබේ.

මෙයට අදාළ මිළ ගණන් පත් හා කොන්දේසි, 1970 අප්‍රේල් මස 18 වන දින දහවල් 12 දක්වා, පහත අත්සන් තබන අයගෙන් ලබාගත හැක.

සැපයීම් කළමණාකරු.

ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය,
සැපයීම් සහ වාප්පු දෙපාතීමේන්තුව,
55, රොස්මිඩ් පෙදෙස,
කොළඹ 7.

4–399/2—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### ගැලුම් 10,000 ක ප්‍රමාණයේ තෙල් ටැංකියක් සැපයීම

කොළඹ 7, රොස්මිඩ් පෙදෙසේ, අංක 55 දරණ ස්ථානයේ පිහිටි, ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ, සාමාන්‍යාධිකාරී තැන විසින්, 1970 අප්‍රේල් මස 18 වන දින පස්වරු 4 දක්වා, ඉහත සඳහන් ටැංකියක් සැපයීම සඳහා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

ආපසු ලබාගත හැකි රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් හා ආපසු නොගෙවන රුපියල් 10 ක ටෙන්ඩර් ගාස්තුවක්, මුදලින් ගෙවීමෙන් පසුව, 1970.4.17 වන දින දහවල් 12 දක්වා, මෙයට අදාළ ටෙන්ඩර් පත් හා ටෙන්ඩර් ලියකියවිලි පහත අත්සන් තබන අයගෙන් ලබාගත හැක.

සැපයීම් කළමණාකරු.

ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය,
සැපයීම් සහ වාප්පු දෙපාතීමේන්තුව,
55, රොස්මිඩ් පෙදෙස,
කොළඹ 7.

4–399/3—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

## මහාමාර්ග දෙපාර්තමේන්තු

### හැඳිල්ලගොඩ-ගෝනලගොඩ-හොරන්ගල්ල පාරේ පළමු සැතපුම් වැඩිදියුණු කිරීම සඳහා කළුගල් ගෙනැවිත් භාරදීම

හැඳිල්ලගොඩ-ගෝනලගොඩ-හොරන්ගල්ල පාරේ පළමුවන සැතපුමට කළුගල් කැබලි සපයා ගෙනැවිත් භාරදීම පිණිස ටෙන්ඩර්පත් ගාල්ලේ මහාමාර්ග දෙපාර්තමේන්තුවේ, අධිකාරී ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 මැයි මස 8 වැනි සිකුරාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

1970 මැයි මස 8 වැනි සිකුරාදා පෙරවරු 11.05ට ටෙන්ඩර් මණ්ඩල කාමරයේදී ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර්කරුවනට එහි පෙනී සිටිය හැක.

ටෙන්ඩර් ලියකියවිලි මහා මාර්ග දෙපාර්තමේන්තුවේ ඇල්පිටිය විධායක ඉංජිනේරු කාර්යාලයේදී පරීක්ෂා කළ හැක.

මහා මාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ ටෙන්ඩර් පත් මුදල වශයෙන් රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කර ඇල්පිටියේ විධායක ඉංජිනේරු තැනගෙන් ඉල්ලුම්කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් ලබාගත හැක. තැන්පත් මුදල ආපසු ගෙවීම ටෙන්ඩර් කොන්දේසි අනුව කරනු ලැබේ.

මෙහි පහත සඳහන් ආයතනවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති.

(ඇ) සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචි කළ සමුපකාර සමිති.

මෙහි ඉහත සඳහන් පරිදි ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය. 1970 අප්‍රේල් මස 24 වැනි සිකුරාදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු නොගෙවන ගාස්තුවක්, නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුය.

ටෙන්ඩර් ඉදිරිපත් කිරීම ලාංකිකයින්ට හා ලාංකික වෙළඳ හා අනිකුත් සමාගම්වලට සීමාකර තිබේ.

ජේ. ආර්. වී. සෙනෙවිරත්න,
දකුණු කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු (මහා මාර්ග).

මහා මාර්ග දෙපාර්තමේන්තුව,
ගාල්ල,
1970 අප්‍රේල් 1 වැනිදා.

4–368—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## මහාමාර්ග දෙපාර්තමේන්තුව

### කටුනේරිය-සිරිගම්පොළ පාර පළල් කිරීම, උස් කිරීම හා ආරක්ෂක බැම්මක් තැනීම

කටුනේරිය-සිරිගම්පොළ පාරේ පළල් කිරීම්, උස් කිරීම් හා ආරක්ෂක බැම්මක් තැනීම සඳහා වූ ගැණුම්පත්, කුරුණෑගල, මහමාර්ග දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 අප්‍රේල් මස 23 වන දින පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. හලාවත මහමාර්ග දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියළු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගතහැකිවන අතර, සැලැස්මද ඔහුගේ කායඞාලයේදී බලාගැනීමට පුළුවන.

3. ර. වැ. දෙ. වේ මාර්ග වැඩ සඳහා රු. 62,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 තැන්පත්කර ලබාගත් කුවිතාන්සිය 1970 අප්‍රේල් මස 17 වැනි දින පස්වරු 4.30ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසුවනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාදවී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුය.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන්පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තුවන අය ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කර ගෙන යන වැඩ පිළිබඳ සියළු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ, මහාමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ඇස්. ගනේෂරත්නම්,
වයඹ කොට්ඨාශයේ අධිකාරී ඉංජිනේරු.

අධිකාරී ඉංජිනේරු කාර්යාලය,
මහාමාර්ග දෙපාර්තමේන්තුව,
කුරුණෑගල,
1970. 3. 25.

4–246—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

බදුල්ල දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1970 මැයි මස 8 වැනි දින පස්වරු 2.30 දක්වා කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ :—

| වැඩෙහි ස්වභාවය | ලියාපදිංචි විය යුතු මුදල රුපියල් |
|---|---|
| වියලුව ප්‍රා. ආ. නි. කොටසේ වෙන්දේසිකැලේ යාය-තැන්නපංගුව පාර, "ජී" කොටස තැනීම—දිග අඩි 1,500 (පස්වැඩ හා බෝක්කු). | 25,000 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති අනුමත ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිතිවලට සහ පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට 1970 අප්‍රේල් මස 30 වැනි දින පස්වරු 3තෙක් බදුල්ලේ කච්චේරියේ දී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් බදුල්ල කච්චේරියේ හෝ වෙනත් ඕනෑම කච්චේරියක හෝ අදාළ වැඩය වෙනුවෙන් රු. 100ක මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් බදුල්ලේ දිසාපති වෙත ඉදිරිපත් කළ විට, ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිති ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් බහා එවන කවරයට මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුය. ටෙන්ඩර් පෝර්ම තැපෑලෙන් නොඑවන්නේ නම්, ගාලු මුවදොර මහ ලේකම් කාර්යාලයේ අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

5. 1970 මැයි මස 8 වැනි දින පස්වරු 2.30 ට ඉහත කී අංක 320 දරණ කාමරයේ දී ටෙන්ඩර් පෝර්ම විවෘත කරනු ලැබේ.

6. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියක් හෝ දැන්වීමක් ලත් පසු, යම් අයෙක් ගිවිසුම්පත් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින 10 ක් ඇතුළත අපොහොසත් වුවහොත්, ඔහු විසින් ටෙන්ඩර් පෝර්ම සඳහා තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ. ලියාපදිංචි වූ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති ඇප තැබීමෙන් නිදහස්ය.

7. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් සපයන ලද ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ටෙන්ඩර් භාරගත් බවට දැන්වීමක් හෝ වෙන යම් අන්දමකින් එම ලිපිනයට ඒ බව දැන්වීම ටෙන්ඩර්කරුට එය ලැබුණාක් මෙන් සලකනු ලැබේ.

8. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවා ගැනීමට, පුහුණු නුපුහුණු යන දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වන අතර, ඔවුහු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

9. කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම් විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත්, කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවල දී ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය උඩ නිශ්චිතව, ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

10. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට තහනම් වන අතර, එකී කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

11. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන්, පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු ලෙස අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

12. මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූ ද, කම්කරුවන්ට වේතන ගෙවීම් සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින්මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූල වූ ද, වේතන ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

13. කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත පෙරෙට්වූ පොත් හා අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු බදුල්ලේ දිසාපතිගෙන් දැනගත හැකිය.

ජී. සී. දිසානායක,
උප දිසාපති,
බදුල්ල දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

දිසාපති කාර්යාලය,
බදුල්ල,
1970 මාර්තු මස 31 වැනි දින.

4–321—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

මඩකලපුවේ ආහාර ගබඩාවේ දැනට තිබෙන ගෙබිම හා දිය කාන්දු නොවන ගෙබිම සහ බිත්ති ඉස්සීම සඳහා එවන ටෙන්ඩර් පත් බදුල්ල ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1970 ක්වූ අප්‍රේල් මස 29 වන බදාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. කල්මුනේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ඇස්තමේන්තුපත්‍රවල ටෙන්ඩර්පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුය. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිවන අතර, සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට හැකිය.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ/ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 70,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් දිස්ත්‍රික් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 අප්‍රේල් මස 18 වන සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර්පත් ලබා ගැනීමට සුදුස්සන් වනවා ඇත. ටෙන්ඩර්පත් සඳහා ප්‍රමාව අදුයම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරී තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

පී. බී. සමරසූරිය,
නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු,
(ගොඩනැගිලි).

නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලය,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
බදුල්ල,
1970 අප්‍රේල් මස 1 දින.

4–311—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ (මැකැලම් පාරේ) පිහිටි ප්‍රවාහන අංශයේ වාහන වලින් ඉවත් කරනු ලබන එංජින් තෙල් (මසකට ගැලුම් 100 ක් පමණ) 1970.12.31 න් අවසන් වන කාලය සඳහා මිළදී ඉවතට ගෙන යාම සඳහා, කොළඹ 1 බ්‍රිස්ටල් වීදියේ, බී.එස්.එස්.අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 අප්‍රේල් මස 25 වැනි සෙනසුරාදා ප. ව. 2.30 දක්වා මිළ ගණන් පත් භාර ගනු ලැබේ.

මිළ ගණන් ෆෝර්ම සහ වැඩි විස්තර කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ බී.එස්.එස්.අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගත හැක. මිළ ගණන් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

ආර්. ඇප්. සී. ද ලිවේරා,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970 අප්‍රේල් මස 3 දින,
බ්‍රිස්ටල් වීදිය, බී.එස්.එස්.අයි. ගොඩනැගිල්ල,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව,
කොළඹ 1.

4–373—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

මිල ගණන් කැඳවීම් පත් අංකය : ඇල්. කිව්. 687001/3

අංක 14,899 සහ 70. 3. 26 වෙනි දින දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙන් අත් ට්‍රැක්ටර් දෙකක් සැපයීම සඳහා පල කරන ලද 70. 3. 19 දින දරන මිල ගණන් පත් කැඳවීමේ දැන්වීම මෙයින් අවලංගු කරනු ලැබේ.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

ඉංජිනේරු අංශය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය, 70. 4. 2.

4–374—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

ගාල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ දැනට තිබෙන මෙරට උළු වහළ වෙනුවට පීලි සහිත සිමෙන්ති ඇස්බැස්ටෝ වහලක් තැනීම සඳහා වූ ටෙන්ඩර් පත්, ගාල්ලේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1970 අප්‍රේල් මස 30 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 10.30 වන තෙක් බාර ගනු ලැබේ.

2. ගාල්ලේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික්ක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිවන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයෙහිදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩැගිලි වැඩ සඳහා රුපියල් 25,000 කට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 අප්‍රේල් මස 17 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහිදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ජී. ජේකබ්,
අධිකාරි/ඉංජිනේරු/ගොඩනැගිලි,
දකුණු කොට්ඨාශය.

අධිකාරි/ඉංජිනේරු, කාර්යාලය,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
ගාල්ල, 1970.3.21.

4–253—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### වවුනියාව දිස්ත්‍රික් කෘෂිකර්ම කාර්යාලයේ ගරාජ සහ ගබඩා ඉදි කිරීම සඳහා ටෙන්ඩර්

වවුනියාවේ, දිස්ත්‍රික් කෘෂිකර්ම කාර්යාලයෙහි ගරාජ සහ ගබඩා ඉදි කිරීම සඳහා ටෙන්ඩර් පත්, පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ඉංජිනේරු අංශයේ ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 මැයි මස 10 වැනි දින ප. ව. 2.30 දක්වා භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පෝරම, පේරාදෙණියේ, ගන්නොරුවේ, කෘෂිකර්ම ඉංජිනේරු (සිවිල්) තැන ගෙන් ලබා ගෙන, දෙපිටපතකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් අවශ්‍ය විස්තර ලබා ගත හැකි අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයේදීම බැලිය හැකිය.

3. සියළුම ටෙන්ඩර් කරුවන්, රු. 50,000 කට නොඅඩු ගොඩනැගිලි කොන්ත්‍රාත්තු සඳහා රජයේ ඕනෑම දෙපාර්තමේන්තුවක් සමග ලියාපදිංචි වූ අය විය යුතුයි.

4. ටෙන්ඩර් පෝර්ම 1970 මැයි මස 9 වැනි දින ප. ව. 4 දක්වා පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කරන අයට නිකුත් කරනු ලැබේ:—

(i) 3 වැනි ඡේදයේ සඳහන් ලියා පදිංචිවීම ඔප්පු කිරීම.

(ii) රු. 50 ක ටෙන්ඩර් තැන්පත් රිසිට් පත.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී හෝ ඕනෑම කච්චේරියකදී හෝ, කොළඹ ලංකා බැංකුවේ/යෝක් වීදියේ ශාඛාවේ කෘෂිකර්ම අධ්‍යක්ෂගේ ගිණුම් අංක 37 ට හෝ තැන්පත් කළ හැක.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
ප්‍රධාන ඉංජිනේරු.

1970 මාර්තු මස 26 දින,
පේරාදෙණියේ, ගන්නොරුවේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
ඉංජිනේරු අංශයේදීය.

4–255—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, කිරුළ පාරේ අංක 200 දරණ ස්ථානයේ ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලීය සභාපති තැන විසින් පහත සඳහන් වැඩ/වැඩය සඳහා මුද්‍රා තබා වෙන වෙනම ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රිකා 1970 අප්‍රේල් මස 29 වෙනි බදාදා පූ. භා. 10 වන තෙක් භාරගනු ලැබේ.

**1. පොළොන්නරුව—පාරවල් හා අංගන ඉදිකිරීම**

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍රවල පිළියෙළ කොට අනුපිටපතකින් යුතුව ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ අවශ්‍ය සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි අතර, අදාළ සැලසුම් පත් ආදිය ඔහුගේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලීමට පුළුවන. ලංකා ගමනාගමන මණ්ඩලයේ හෝ රජයේ දෙපාර්තමේන්තුවල සිවිල් ඉංජිනේරු වැඩ සම්බන්ධයෙන් රු. 60,000 ක් හෝ එයට අධික වැයවන කර්මාන්ත සම්බන්ධයෙන් ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍රිකා එවීමට සුදුස්සෝ වෙති. එවැනි කොන්ත්‍රාත්කරුවන්ගේ සහතිකපත් යනාදිය ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන අනුමත කළ හොත් පමණක් අංක 1 කර්මාන්තය සඳහා රු. 100 බැගින් වන ටෙන්ඩර් ඇප මුදල් සහ ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් පෝර්ම ගාස්තු වශයෙන් රු. 25 ක මුදලක් මුදලින් පමණක් ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත තැන්පත් කොට ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට 1970 අප්‍රේල් මස 24 වෙනි සිකුරාදා මධ්‍යාහ්න 12 දක්වා ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

අංක 200, කිරුළ පාර,
නාරාහේන්පිට,
1970 මාර්තු මස 31 වැනි දා.

4–355/1—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, කිරුළ පාරේ අංක 200 දරණ ස්ථානයේ ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලීය සභාපති තැන විසින් පහත සඳහන් වැඩය සඳහා මුද්‍රා තබා ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රිකා 1970 අප්‍රේල් මස 29 වෙනි බදාදා පූ. භා. 10 වනතෙක් භාර ගනු ලැබේ.

**1. පොළොන්නරුව යෝජිත ඩිපෝවේ ගොඩනැගිලි ඉදිකිරීම**

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍රවල පිළියෙළ කොට අනුපිටපතින් යුතුව ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ අවශ්‍ය සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි අතර, අදාළ සැලසුම් පත් ආදිය ඔහුගේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලීමට පුළුවන. ලංකා ගමනාගමන මණ්ඩලයේ හෝ රජයේ දෙපාර්තමේන්තුවල සිවිල් ඉංජිනේරු වැඩ සම්බන්ධයෙන් රු. 2,50,000 ක් හෝ එයට අධික වැයවන කර්මාන්ත සම්බන්ධයෙන් ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍රිකා එවීමට සුදුස්සෝ වෙති. එවැනි කොන්ත්‍රාත්කරුවන්ගේ සහතිකපත් යනාදිය ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන අනුමත කළ හොත් පමණක් අංක 1 දරණ කර්මාන්තය සඳහා රු. 300 බැගින් වන ටෙන්ඩර් ඇප මුදල් සහ ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් පෝර්ම ගාස්තු වශයෙන් රු. 25 ක මුදලක් මුදලින් පමණක් ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත තැන්පත් කොට ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට 1970 අප්‍රේල් මස 24 වෙනි සිකුරාදා මධ්‍යාහ්න 12 දක්වා ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

අංක 200, කිරුළ පාර,
නාරාහේන්පිට,
1970. 3. 31.

4–355/2—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

## සුරාබදු දෙපාර්තමේන්තුව

**මහනුවර සුරාබදු ගුදමේ ඇති පාවිච්චියට නොගන්නා හිස් අරක්කු බෝතල් 20,000 ක් පමණ විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවීම**

ඉහත සඳහන් බෝතල් තොගය විකිණීම සඳහා කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ සුරාබදු කොමසාරිස් විසින් 1970 මැයි මස 9 වෙනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත් පිටපත් 2 කින් එවිය යුතුය. කච්චේරියකින් හෝ කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ පිහිටි සුරාබදු කොමසාරිස් කාර්යාලයෙන් හෝ රු. 25 ක තැන්පත් මුදලක් සඳහා නිකුත් කළ කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන්, 1970 මැයි මස 7 වෙනි දින පස්වරු 3 දක්වා කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ පිහිටි සුරාබදු කොමසාරිස් කාර්යාලයේ නියමිත ටෙන්ඩර් පත්‍ර ලබාගතහැක.

මු. බ. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

1970.4.1.
කොළඹ 7.

4–371—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**තින්නවෙලි පාසැල් ගොවිපලට වතුර පොම්පයක් සහ ට්‍රොලියක් සැපයීම හා ගෙනවිත් භාරදීම**

යාපනයේ කෘෂිකර්ම (ගොවි පාලන හා නිෂ්පාදන) කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරි විසින් තින්නවෙලි පාසැල් ගොවිපලට වතුර පොම්පයක් සහ ට්‍රොලියක් සැපයීම හා ගෙනවිත් භාරදීම සඳහා 1970. 5. 3 වැනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක රුපියල් 10ක් කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා නි.) නමින් තැන්පත් කළ කුවිතාන්සියක් යාපනයේ කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරි (ගො. පා. නි.) වෙත ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනට පෙර දින, දහවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැක.

වැඩි විස්තර සඳහා මෙම ගැසට් පතේ පළවී ඇති ඉංග්‍රීසි දැන්වීම බලන්න.

එම්. එල්. සී. ඉලංගකෝන්,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ,
(කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපළ).

1970 මාර්තු මස 25 වැනි දින,
පේරාදෙණිය.

4–251—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

මහා මාර්ග දෙපාර්තමේන්තු හම්බන්තොට දිස්ත්‍රික්කයේ අම්බලන්තොට පාලමට 141/1 කොළඹ-ගාල්ල-හම්බන්තොට පාර 3" කළුගල් කියුබ් 450 ක් සහ 2" කළුගල් කියුබ් 500 ක් සැපයීම හා භාරදීම සඳහා ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ. ටෙන්ඩර් භාරගනු ලබන්නේ 1970.5.2 වෙනි සෙනසුරාදා පෙරවරු 11 තෙක්, කොළඹ 1, මහා මාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසිනි.

2. රත්මලානේ ම. මා. දෙ. පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයෙන් ලබා ගත් ටෙන්ඩර් පිළිබඳ ඉල්ලුම් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් සියලු විස්තර ලබා ගත හැක.

3. ටෙන්ඩර් පත් නිකුත් කරන්නේ ටෙන්ඩර්කරුවන් විසින් රු. 200 ක මුදල් තැන්පත් කර ඒ පිළිබඳ කුවිතාන්සියක් 1970.4.25 වෙනි සෙනසුරාදා පස්වරු 4.30 ට පෙර පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විටයි. දිනකට හෝ ඉන් කොටසකට රු. 10 බැගින් ආපසු නොගෙවනු ලබන ප්‍රමාද ගාස්තුවක් වශයෙන් නිකුත් කරන නිලධාරියාට ගෙවා, ඊට පසු කුවිතාන්සිය ලබාගෙන ඒ අනුව ප්‍රමාද වූ ඉල්ලුම්කරුවන් විසින් ටෙන්ඩර් පිළිබඳ ඉල්ලුම් පත් ලබා ගත හැක.

4. ටෙන්ඩර් වෙනුවෙන් මුදල් තැන්පත් කළ හැක්කේ කොළඹ කොටුවේ ම. මා. දෙ. ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියකදීය.

ඇම්. චන්ද්‍රසේන,
පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු.

පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය,
ම. මා. දෙ., රත්මලාන.

4–339—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුවට "ක්‍රෑන්ක් ෂාෆ්ට් ග්‍රයින්ඩර්" එකක් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් මණ්ඩල සභාපති (ලිපිනය.—දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය, තැ. පෙ. 355, කොළඹ 10) 1970 ජූලි මස 9 වැනි බ්‍රහස්පතින්දා පෙ. ව. 11 වන තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කිරීමට පෙර අවශ්‍ය වුවහොත් ටෙන්ඩර් කරුවන් විසින් ඉහත සඳහන් සේවාව බාරගැනීමට සහ සතුටුදායක ලෙස ඉටුකිරීමට තමාගේ මුදල් තත්ත්වයේ ප්‍රමාණවත් බව ඔප්පු කිරීමට අදාලවන ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

3. කොළඹ 10 හි දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ෆෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 100 ක් කොළඹ 10හි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයෙහි හෝ කොළඹින් පිටතනම් ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කලවිට 1970 ජූලි මස 2 වැනි බ්‍රහස්පතින්දා දහවල් 12 වනතෙක් ටෙන්ඩර් ෆෝර්ම කොල නිකුත් කරනු ලැබේ.

5. 1970 ජූලි මස 9 වැනි බ්‍රහස්පතින්දා පෙ. ව. 11.05 ට දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

6. වැඩිමනත් විස්තර අවශ්‍ය නම් දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැක.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

කොළඹ,
1970, අප්‍රේල් 1 දින.

4–299—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## හම්බන්තොට කච්චේරිය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ දකුණු ගිරුවා පත්තුවේ "නායක වත්ත ප්‍රවේශ පාර" තැනීම සඳහා 1970 ක්වූ මැයි මස 8 වන දින පස්වරු 2.30 දක්වා කොළඹ තැ. පෙ. අංක 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. රුපියල් 15,000 කට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචිවී සිටින කොන්ත්‍රාත්කරුවන්ට සහ කොන්ත්‍රාත් කටයුතු කිරීම සඳහා ලියාපදිංචි වී ඇති ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමූපකාර සමිතිවලටද 1970 ක්වූ මැයි මස 2 වන දින පස්වරු 3 දක්වා හම්බන්තොට කච්චේරියේදී ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් ෆෝර්ම අපේක්ෂකයින් විසින්, එම වැඩය වෙනුවෙන් හම්බන්තොට කච්චේරියේ රුපියල් 25 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් හම්බන්තොට දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමූපකාර සමිති ටෙන්ඩර් ෆෝර්ම ලබාගැනීම සඳහා ඇප මුදලක් තැන්පත් කිරීම අනවශ්‍යය. ඇප මුදල් ගෙවීම සඳහා එවන චෙක්පත්, මුදල් ඇනවුම් හා තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කොට පිටපත් දෙකකින් යුක්ත කොට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත් බහා එවන කවරයේ වම් කෙළවරේ ඉහලින් ටෙන්ඩර් පත් ඉදිරිපත් කරන වැඩයේ නම ලියා තිබිය යුතු අතර, කවරය මුද්‍රා තබා තිබිය යුතුයි. ටෙන්ඩර් පෝර්ම තැපෑලෙන් නොඑවන්නේ නම්, ගාළු මුව දොර මහා ලේකම් කාර්යාලයේ අංක 357 දරන කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුයි.

5. 1970 ක්වූ මැයි මස 8 දින පස්වරු 2.30 ට ඉහත කී අංක 357 දරන කාමරයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ.

6. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මින් එකඟ විය යුතු අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගනු ලබන්නේ වැඩය කරන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

කොන්ත්‍රාත්තුවේ මෙම කොන්දේසිය සපුරා ලීමට කොන්ත්‍රාත් කරු යම් විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට එයම හේතුවනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී ඉඩම්, වාරිමාර්ග හා විදුලිය බල පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තුමාගේ එකඟත්වය ඇතිව, නිශ්චිත ලියවිල්ලකින්, එකී බලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකියි.

එවැනි ලිඛිත බලයක් හෝ එකඟතත්වයක් නැතිව ලාංකික නො වන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.

මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙකු අදහස් කැරෙන අතර එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් බවයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූ ද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන්වූ දැනට බලපවත්වන්නාවූ ද සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියලුම රෙගුලාසිවලට අනුකූලවද, වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලබන කම් කරුවන් හා සම්බන්ධ ඔහුගේ පොත් පත්, පෙරෙව්වු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් බලය දෙනු ලැබූ, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත් කරු බැඳී සිටියි.

7. ජයග්‍රාහී කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුවේ වැඩ කරගෙන යන අතරතුරදී, කොටස් මුදල් ගැනීමට අවශ්‍ය වුවහොත්, එවැනි අවස්ථාවලදී කරන ලද වැඩවලින් 75% කට සරිලන ප්‍රමාණයේ කොටස් මුදල් ලබාගත හැකිවේ.

ජයග්‍රාහී කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුව භාරගැනීම සඳහා ගිවිසුම් පත් අත්සන් කිරීමට පෙරාතුව, ඔහු විසින් ඉදිරිපත් කර ඇති ටෙන්ඩරයේ සඳහන් වන මුදලින් 10% කට වැඩි නොවන මුදලක් ඇප මුදල් වශයෙන් හම්බන්තොට දිසාපති වෙත තැන්පත් කළ යුතුයි.

8. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු, ඉල්ලුම් පත්‍රයක මගින් හම්බන්තොට දිසාපතිගෙන් ලබාගත හැකියි.

ර. බ. අළුවත්තේගම,
හම්බන්තොට දිසාපති වෙනුවට.

1970 ක්වූ මාර්තු මස 31 වන දින,
හම්බන්තොට කච්චේරියේදීය.

4-323—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්ත මේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

| වාරිමාර්ගයේ නම | ගම්වගා නිලධාරි කොට්ඨාශය |
|---|---|
| 1. සොයිසා යාය පිට ඇල වැඩි දියුණු කිරීම ... | දන්කොටුව |
| 2. බුජ්ජම්පල මාවතගම ඇල වැඩිදියුණු කිරීම ... | දන්කොටුව |
| 3. පහල වෙල් යාය—මැද ඇල වැඩිදියුණු කිරීම ... | නාත්තන්ඩිය |
| 4. යටකලන් ඔය බැම්ම අලුත් වැඩියා කිරීම ... | නාත්තන්ඩිය |
| 5. නැබඩවල වී සෝන බැම්ම වැඩිදියුණු කිරීම | මහවැව |
| 6. ගන්දර ඔය බැම්ම වැඩිදියුණු කිරීම ... | හලාවත (දකුණ) |
| 7. නෙලුම්පොකුණ සොරොව්ව ඉදිකිරීම ... | හලාවත (දකුණ) |
| 8. දුම්මලසූරිය බැම්ම වැඩිදියුණු කිරීම ... | හලාවත (දකුණ) |
| 9. තල්ගහවැව වැඩිදියුණු කිරීම | හලාවත (දකුණ) |
| 10. වීරකමන්දල් ඇල වැඩිදියුණු කිරීම ... | හලාවත (උතුර) |
| 11. කුමාරකට්ටුව වැව වැඩිදියුණු කිරීම ... | හලාවත (උතුර) |
| 12. කදිරන් කාඩුවැව වැඩිදියුණු කිරීම ... | පුත්තලම |
| 13. ඉඟිනිම්ටිය වැව සොරොව්ව අලුත්වැඩියා කිරීම ... | රාජවන්නි පලාත |
| 14. ගලටබැදියාව වැව වැඩිදියුණු කිරීම ... | රාජවන්නි පලාත |
| 15. කුසල වැව පිය ගැට පෙල ඉදිකිරීම ... | හලාවත (උතුර) |
| 16. මූණමල්ගස්වැව අමුණ බැම්ම අලුත්වැඩියාව ... | රාජවන්නි පලාත |

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවි ජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන් ඩර්යක් හෝ සලාක බලනු නොලැබේ. ටෙන්ඩර් අකෘති පත්‍ර 1970 අප්‍රියෙල් මස 24 දින දවල් 12 දක්වා හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර් යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර් කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානු කූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා සීල් තබන ලද ලියුම් කවරවල බහා හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන් ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ වම් කෙළවරේ "..........සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1970 අප්‍රියෙල් මස 29 දින දවල් 12 ට පෙර හලාවත-පුත්තලම් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොම සාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින්, බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දහ දිනක් ඇතුලත දී එම ටෙන්ඩර්කරු විසින් හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොම සාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5%ක් ටෙන්ඩර් කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරා ගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතූන් උඩ, හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමඟ හෝ ගිවිසුම කට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩි විස්තර පත්‍රිකාවෙහි ඇතුලත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුලත් වියයුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින් වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත් කරු විසින් සැපයිය යුතුය.

13. හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1970 අප්‍රේල් මස 29 ප. ව. 2.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කිය වීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් ආත්‍රාවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඇල්. ඇෆ්. ගුණසේකර,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්.
හලාවත-පුත්තලම දිස්ත්‍රික්කය.

හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගේ කාර්යාලය,
හලාවත, 1970 අප්‍රේල් මස 1 දින දීය.

4–360—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## කොළඹ මහා රෝහල

### ප්‍රසිද්ධ වෙන්දේසියක්

කොළඹ, මහා රෝහලට අයත් පාවිච්චි කරන ලද හැර දැමූ විකිරණ සේයාරූපත් එක් ලක්ෂ නවසිය විස්සක් (1,00,920) 1970 මැයි මස 3 වැනි දින ප. ව. 2 සිට මහා රෝහලේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. ජයග්‍රාහක ලන්සුකරු විසින් වෙන්දේසිය අවසානයේදීම මුළු මුදලම ගෙවා එම ද්‍රව්‍යයන් ඉවතට ගෙනයා යුතුය.

2. මෙම වෙන්දේසිය අවලංගු කිරීමට හෝ කල් දැමීමට හෝ ඕනෑම ලන්සුවක් ප්‍රතික්ෂේප කිරීමට සෞ. සේ. අධ්‍යක්ෂතැනට බලය ඇත.

3. වැඩි විස්තර කොළඹ, මහා රෝහලේ වෛද්‍ය අධිකාරී තැනගෙන් දැනගැනීමට පුළුවන.

ඒ. නාගේන්ද්‍රන්,
කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරී.

1970 අප්‍රේල් මස 1 වැනි දින,
කොළඹ, මහා රෝහලේ දී.

4–308—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## පොලිස් දෙපාර්තමේන්තුවේ පරණ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පාවිච්චි කරන ලද නිල ඇඳුම්, හම් සපත්තු, බූට් සපත්තු, ඇල තොප්පි, වැහිකබා ඇඳුම් කට්ටල්, පලස් යතුරු ලියන, ගුවන් විදුලි යන්ත්‍ර, ගුදිරි, පැට්රෝල් ලාම්පු සහ වෙනත් භාණ්ඩ 27. 4. 70 දින පෙරවරු 9 සිට යාපනය පොලිස් ස්ථාන භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. (2) විකිණීමට ඇති භාණ්ඩ 1970 අප්‍රේල් මස 26 දින පෙ. ව. 9 සිට ප. ව. 3 දක්වා පරීක්ෂාකර බැලිය හැක. (3) වෙන්දේසිය අවසානයේදී බඩු ගෙනයාමට පෙර බඩුවල සම්පූර්ණ මුදල ගෙවිය යුතුයි.

ස. පො. අධිකාරී, යාපනය.

පොලිස් කායශීලය, යාපනය,
11.3.70.

4–247—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

## 1969-70 වර්ෂය සඳහා නුවරඑළිය දිස්ත්‍රික්කයේ අංක 4 හරස්බැද්ද රා තැබෑරුම නැවත විකිනීම

1970 අප්‍රේල් මස 27 වන දින සිට 1970 සැප්තැම්බර් මස 30 වන දක්වා නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටි අංක 4 හරස්බැද්ද රා තැබෑරුමේ පැසුනු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිලදී ගැනීම සඳහා 1969 මැයි මස 30 වන දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ...මා විසින් පළකරන ලද නුවරඑළිය දිස්ත්‍රික්කයේ රා තැබෑරුම් විකිණී...ම් දැන්වීමෙහි සඳහන් නීති රීතිවලට හා කොන්දේසිවලට අනුකූලව ...ටෙන්ඩර් පත් මෙයින් කැඳවනු ලැබේ.

ටෙන්ඩර්පත් 1970 අප්‍රේල් මස 27 වන දින පෙරවරු 10ට වසනු ලැබේ.

පී. ඇම්. විජේකෝන්,
නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 මාර්තු මස 25 වන දින,
නුවරඑළිය දිසාපති කායශීලයේදී ය.

4–266—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

## පුත්තලම දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම

**1970 ජූලි මස 1 සිට 1971 ජූනි මස 30 දක්වා කාලය සඳහා**

1970 ජූලි මස 1 වැනි දින සිට 1971 ජූනි මස 30 වැනි දින දක්වා වූ කාලය සඳහා පුත්තලම් දිස්ත්‍රික්කයේ රා තැබෑරුම්වල රා සිල්ලරයෙන් විකිණීමේ අයිතිය පමණක් විකිණීම සඳහා පහත සඳහන් කොන්දේසිවලට යටත්කොට සුරාබද්ද බලපත්‍රයන්ට අදාල පොදු කොන්දේසි මාලාවට යටත්ව 1970–71 කාලය සඳහා අංක 14,898 හා 1970.3.20 වෙනි දින ප්‍රකාශයට පත් ගැසට් පත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව ටෙන්ඩර් පත්‍ර මවිසින් මෙයින් කැඳවනු ලැබේ.

2. පුත්තලම දිස්ත්‍රික්කයේ දිසාපති තුමා වෙත ලැබෙන පරිදි ටෙන්ඩර් පත්‍ර '' 1970–71 වර්ෂය සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ රා රේන්ද මිළයට ගැනීමේ ටෙන්ඩරය '' යි සඳහන් කර ටෙන්ඩර් පත්‍රිකා පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති පරිදි තැබෑරුමේ නමට ඉදිරියෙන් පෙන්වා ඇති දිනය සහ වේලාව තුළදී මෙම කාර්යාලයේ දී බාර ගනු ලැබේ.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ඕනෑම දිසාපති කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ආකෘති පත්‍රිකාවක විය යුතුය. තවද, එම ටෙන්ඩර් පත්‍රය, ඉදිරිපත් කරන අය විසින් ම පුරවා සම්පූර්ණ කළ යුතුය. නියෝජිතයෙකුගේ මාර්ගයෙන් ඉදිරිපත් කරන කිසිම ටෙන්ඩර් පත්‍රයක් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගනු ලබන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලාංකිකයන් වූ පුරවැසියන්ගෙන් පමණකි.

4. එක් එක් තැබෑරුමක් සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළයුතු අතර, එක් එක් තැබෑරුමක් සඳහා එක් ටෙන්ඩර් පත්‍රිකාවකට වඩා කිසිම අයෙකු විසින් ඉදිරිපත් නොකළ යුතුයි.

5. සෑම ටෙන්ඩර් පත්‍රිකාවක් සමගම රු. 500 කට කච්චේරි කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

6. වටිනාකම් සහතිකයක් ද සෑම ටෙන්ඩර් පත්‍රයක් සමඟ ඉදිරිපත් කළ යුතුයි. වටිනාකම් සහතිකවල පිටපත් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අවස්ථාවලදී ටෙන්ඩර්කරුවන් විසින් අදල දේපොල පිහිටි දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඉඩම් ලේඛනයෙන් සහතික කරන ලද පිටපතක් ලබාගෙන මවෙත ඉදිරිපත් කළ යුතුය. මෙය රා තැබෑරුම් විකිණීම් කොන්දේසි මාලාවේ 4(3) (1) දරණ වගන්තියෙහි සඳහන් නියමයන් අනුව විය යුතුයි.

7. ටෙන්ඩර් පත්‍රිකාවකට අදල තැබෑරුමේ නම හා අංකය ලියුම් කවරයක වම් කෙළවරේ පැහැදිලිව ලියා එම ටෙන්ඩර් පත්‍රිකාව බහා මුද්‍රා තබා නියමිත ස්ථානයේ දී, නියමිත දිනයේ දිනය හා වේලාවේදී කච්චේරියේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුයි. නැතහොත් ටෙන්ඩර් වැසීමට නියමිත කාලය ඉකුත්වීමට කලින් කච්චේරියට ලැබෙන පරිදි රජයේ දිසාපති නමට ලිපිනය ලියා, ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුයි.

8. කිසියම් කාරණයක් සඳහන් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිසාපති තැන සතුය.

9. සාර්ථක වූ ටෙන්ඩර් පත්‍රිකාව ඉදිරිපත් කළ අය ඔහුට එම වරප්‍රසාදය හිමි වූ විගසම විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා දිසාපතිතුමා විසින් නියම කරන ලද ඇප තැන්පත් මුදලක් දිසාපති තැනට ගෙවිය යුතුය.

10. සුරාබද්ද කොමසාරිස් තුමා විසින් අංක 14,898 සහ 70.3.20 දින රජයේ ගැසට් පත්‍රයේ 1970–71 වර්ෂය සඳහා පළ කරවන ලද රා තැබෑරුම් විකිණීමේ කොන්දේසි මාලාවේ සඳහන් වගන්තීන් සැළකිලිමත්ව කියවා බලා ඒ අනුව ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන ලෙස දන්වමි. වෙනත් විස්තර ඉල්លුම් පත් මාර්ගයෙන් පුත්තලමේ දිසාපති කාර්යාලයෙන් ලබා ගත හැක.

එම්. ඩබ්ලිව්. එස්. ගුණරත්න,
පුත්තලමේ දිසාපති.

1970 මාර්තු 26 වැනි දින,
පුත්තලම් දිසාපති කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | ග්‍රාමය | ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අන්තිම දිනය හා වේලාවත් | |
|---|---|---|---|---|
| 1 | පුත්තලම පළාත් ආණ්ඩු සභාව | පුත්තලම ප.ආ. සභාවට අයත් අංක 2 දරණ කොට්ඨාශය—වේනකුඩිරිප්පුව | 70.5.6 | පෙ.ව. 10.00 |
| 2 | පුත්තලම් පත්තුව | නාවක්කාඩු (දළුව) නැමැති ගම ඇතුළත | 70.5.6 | පෙ.ව. 10.15 |
| 3 | පුත්තලම් පත්තුව | මදුරන්කුලිය | 70.5.6 | පෙ.ව. 10.30 |
| 4 | පුත්තලම් පත්තුව | මුක්කුතොඩුවාව | 70.5.6 | පෙ.ව. 10.45 |
| 5 | පුත්තලම් පත්තුව | මුන්දලම | 70.5.6 | පෙ.ව. 11.00 |
| 6 | කල්පිටිය | ඒත්තාලෙයි | 70.5.6 | පෙ.ව. 11.15 |
| 7 | හලාවත පළාත් ආණ්ඩු සභාව | ඉච්චම්පිටිය හලාවත ප.ආ. සභාවට අයත් අංක 2 දරණ කොට්ඨාශය | 70.5.6 | පෙ.ව. 11.30 |
| 8 | හලාවත පළාත් ආණ්ඩු සභාව | හලාවත ප.ආ. සභාවට අයත් අංක 3 දරණ කොට්ඨාශය—අළුත්විත්ත | 70.5.6 | පෙ.ව. 11.45 |
| 9 | උතුරු පිටිගල් කෝරළේ | උඩප්පුව දකුණ | 70.5.6 | මධ්‍යාහ්න 12.00 |
| 10 | උතුරු පිටිගල් කෝරළේ | කරුකුපොනේ | 70.5.6 | ප.ව. 1.45 |
| 11 | උතුරු පිටිගල් කෝරළේ | ආරච්චිකට්ටුව | 70.5.6 | ප.ව. 2.00 |
| 12 | උතුරු පිටිගල් කෝරළේ | බත්තුළුඔය | 70.5.7 | පෙ.ව. 10.00 |
| 13 | උතුරු පිටිගල් කෝරළේ | පම්බල | 70.5.7 | පෙ.ව. 10.15 |
| 14 | උතුරු පිටිගල් කෝරළේ | ඔලිදළුව | 70.5.7 | පෙ.ව. 10.30 |
| 15 | දකුණු පිටිගල් කෝරළේ | මුදුකටුව | 70.5.7 | පෙ.ව. 10.45 |
| 16 | දකුණු පිටිගල් කෝරළේ | අඩප්පරගම | 70.5.7 | පෙ.ව. 11.00 |
| 17 | දකුණු පිටිගල් කෝරළේ | මට්ටාකොටුව | 70.5.7 | පෙ.ව. 11.15 |
| 18 | දකුණු පිටිගල් කෝරළේ | තොඩුවාව | 70.5.7 | පෙ.ව. 11.30 |
| 19 | වෙන්නප්පුව | තඹරාවිල | 70.5.7 | පෙ.ව. 11.45 |
| 20 | වෙන්නප්පුව | නන්ජුන්ඩන්කරේ | 70.5.7 | මධ්‍යාහ්න 12.00 |
| 21 | වෙන්නප්පුව | වයික්කාල | 70.5.7 | ප.ව. 1.45 |
| 22 | වෙන්නප්පුව | බොරලැස්ස | 70.5.7 | ප.ව. 2.00 |
| 23 | වෙන්නප්පුව | දුම්මලදෙනිය | 70.5.8 | පෙ.ව. 10.00 |
| 24 | වෙන්නප්පුව | උල්හිටියාව | 70.5.8 | පෙ.ව. 10.15 |
| 25 | වෙන්නප්පුව | කටුනේරිය | 70.5.8 | පෙ.ව. 10.30 |
| 26 | වෙන්නප්පුව | ලුණුවිල | 70.5.8 | පෙ.ව. 10.45 |
| 27 | වෙන්නප්පුව | වෙන්නප්පුව | 70.5.8 | පෙ.ව. 11.00 |
| 28 | වෙන්නප්පුව | නයිනමඩම | 70.5.8 | පෙ.ව. 11.15 |

–334—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## දැන්වීමයි

වර්ෂ 1948 අප්‍රේල් 30 වැනි දින අංක 9,859 දරන ගැසට් පත්‍රයෙහි පළමු ව්‍යවස්ථාවෙන් සංශෝධිත පරිදි, ජාතික කෞතුකාගාර ආඥා පනතේ (187 අධිකාරය) 9 වැනි වගන්තිය යටතේ, පැනවුණු ව්‍යවස්ථාවන්හි 3 වැනි ව්‍යවස්ථාව අනුව කොළඹ, මහනුවර සහ රත්නපුර පිහිටා ඇති ජාතික කෞතුකාගාර 1970 අප්‍රේල් 14 වැනි දින සහ මැයි 20 වැනි දින පිළිවෙළින් සිංහල සහ හින්දු අළුත් අවුරුද්ද හා වෙසක් පුන් පොහෝදින නිමිත්තෙන් වසා තබන බැව් මෙයින් දන්වනු ලැබේ.

පී. එච්. ඩී. එච්. ද සිල්වා,
ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ.

1970 මාර්තු 31 දින,
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව,
කොළඹ 7.

4–300—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### රජයේ වී කුලියට කෙටීම සඳහා හාල්මෝල් ලියාපදිංචි කිරීම

### අනුරාධපුර දිස්ත්‍රික්කය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ දැනට හාල් මෝල් සාදා ඇති, වහාම වී කෙටීම ආරම්භ කිරීමට හැකි හාල් මෝල් හිමියන්ගෙන්, රජයේ වී කුලියට කෙටීම සඳහා ලියාපදිංචි කිරීමට අයදුම් පත් මෙයින් කැඳවනු ලැබේ.

2. රජයේ වී කුලියට කෙටීම සඳහා ලියාපදිංචි කරන්නේ වී තම්බා කොටනු ලබන හාල් මෝල් පමණි. එහෙයින් සාදා ඇති හාල් මෝල් පහත සඳහන් සුදුසුකම්වලින් යුක්ත විය යුතුය.

(i) වී තම්බා කෙටීම සඳහා සුදුසු යන්ත්‍රෝපකරණ.

(ii) වී සහ හාල් ගබඩා කිරීමේ පහසුකම්.

(iii) මෝලේ සිට කිට්ටුම රජයේ වී ගබඩාවට ඇති දුර සැතපුම් දහයකට අඩුවීම. (කෙසේ වෙතත් සැතපුම් දහයේ ප්‍රවාහන ගාස්තු සීමාව යටතේ සැතපුම් දහයකට වඩා සුළු දුරක් වැඩි වුවත් සලකා බලනු ලැබේ.)

(iv) මෝල පිහිටි ස්ථානයේ සිට රථවාහන යා හැකි ප්‍රසිද්ධ පාර කට තිබිය යුතු දුර යාර 100 කට අඩු විය යුතුයි.

3. වී කෙටීම සඳහා ලියාපදිංචි කරන්නේ දැනට සාදා නිමකර ඇති හාල් මෝල් පමණක් බව සැලකිය යුතුය. එහෙයින් අළුතෙන් හාල් මෝල් සාදා සලාක ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් අයදුම් පත් නොඑවිය යුතුය.

4. පහත ලිපිනය සඳහන් ස්ථානයේ පිහිටි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ කාර්යාලයෙන් ඉල්ලුම් පත්‍රයේ ආකෘති පත්‍ර සහ උපදෙස් පත්‍ර ලබාගෙන 1970 අප්‍රේල් මස 25 වැනි දිනට පෙර ලියාපදිංචි කරන ලද තැපැලෙන් අයදුම්පත් ගොවිජන සේවා කොමසාරිස් වෙත එවිය යුතුය.

වී. නි. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට,
(සහතික මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම)

1970 අප්‍රේල් මස 3 වැනි දින,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
අංක 42, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
තැ. පෙ. 537, කොළඹ 7.

4–364—70.4.10 දින අංක 14,901 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

### 1970

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| මාර්තු ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද | ... | 70. 2.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 3.13 සිකුරාද | ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 3.20 සිකුරාද | ... | 70. 3.13 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 3.26 බ්‍රහස්පතින්ද | ... | 70. 3.19 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| අප්‍රේල් ... | 70. 4. 3 සිකුරාද | ... | 70. 3.25 බදාදා | ප.ව. | 3.30 |
| | 70. 4.10 සිකුරාද | .. | 70. 4. 3 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.17 සිකුරාද | ... | 70. 4. 8 බදාදා | ප.ව. | 3.30 |
| | 70. 4.24 සිකුරාද | ... | 70. 4.17 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.30 බ්‍රහස්පතින්ද | ... | 70. 4.23 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මැයි ... | 70. 5. 8 සිකුරාද | ... | 70. 4.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 5.15 සිකුරාද | .. | 70. 5. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.22 සිකුරාද | ... | 70. 5.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.29 සිකුරාද | ... | 70. 5.22 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූනි ... | 70. 6. 5 සිකුරාද | ... | 70. 5.29 සිකුරාද | ප.ව. | 3 30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | ... | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | ... | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | ... | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |

එල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු මස 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථ